# නාට්‍ය හා රංග කලාව

## ගුරු මාර්ගෝපදේශය

## 8 ශ්‍රේණිය

**(2017 සිට ක්‍රියාත්මක වේ.)**


සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk
info@ni.lk

**නාට්‍ය හා රංග කලාව**

**8 ශ්‍රේණිය**

**ගුරු මාර්ගෝපදේශය**

**ප්‍රථම මුද්‍රණය 2016**

© ජාතික අධ්‍යාපන ආයතනය

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

**වෙබ් අඩවිය** : www.nie.lk
**විද්‍යුත් තැපැල** : info@nie.lk

*මුද්‍රණය* : ජාතික අධ්‍යාපන ආයතනය

# අධ්‍යක්ෂ ජනරාල්තුමා පණිවිඩය

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් පණිවිඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද, සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂයමාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව, ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලි ව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන, ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැකි ය. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

# හැඳින්වීම

ජාතික අධ්‍යාපන ආයතනය දේශයේ සමස්ත දරු කැළ වෙනුවෙන් පාසල් පද්ධතිය වෙත 2015 සිට නිර්දේශ කරන ලද නව විෂයමාලා ප්‍රතිසංස්කරණයෙහි තෙවන පියවර 2017හි ක්‍රියාවට නැංවේ. ඒ අනුව මෙම වසරේ 8 ශ්‍රේණිය සඳහා වූ නව විෂය නිර්දේශයන් නව්‍යකරණයන් සහිත ව හඳුන්වා දෙමින්, එහි ක්‍රියාත්මක භූමිකාව රඟන ගුරුවරයාට නිසි මඟපෙන්වීම් ලබා දීම පිණිස මෙම ගුරු මාර්ගෝදේශය සකස් කොට ඇත.

විෂයමාලා ප්‍රතිපත්තිය අනුව වසර 8කට වරක් එළැඹෙන මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය විසින් ජාතික අධ්‍යාපනික අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහි ලා පාසල් පද්ධතියට ඒ ඒ විෂයයන් සඳහා නව ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රම ශිල්ප, සංකල්ප හඳුන්වා දෙනු ලබන අතර, සෞන්දර්ය විෂයයන්හි මෙතෙක් නිර්දේශිත ගී, කවි, කතා, සංස්කෘතිකමය කරුණු, තේමා, සම්ප්‍රදායන්හි විවිධත්ව, ඈ සම කාලීන අවශ්‍යතා මත නව දේශීය දර්ශනයට අනුකූල ව අනාගතයට ගැළපෙන පරිදි ඉදිරිපත් කර ඇත.

අප විසින් විෂයමාලා සැලසුම්කරණයේ දී පළමුකොට ම හඳුනා ගන්නා ලද 6-13 දක්වා පුළුල් වූ විෂය සන්ධාරය (Curriculum Grid) නිපුණතා හා නිපුණතා මට්ටම් ලෙස දරුවාගේ වර්ධන හා චින්තන අවධීන්ට අනුව ක්‍රමික ව පෙළගස්වා ඇත. ඒ අනුව 6,10 සහ 7,11 ශ්‍රේණි සඳහා නිර්දේශිත විෂය කරුණු සමඟ අවියෝජනීය සබඳතාවක් මෙන් ම ක්‍රමික වර්ධනයක් සිදු වන පරිදි 8 ශ්‍රේණි යවිෂය නිර්දේශ සැලසුම් කොට ඊට අනුකූල ව මෙම ගුරු මාර්ගෝපදේශය රචනා කොට ඇත.

මෙම ගුරු මාර්ගෝපදේශය හරහා විෂය නිර්දේශයන්හි නාමික ව දක්වා ඇති විෂය කරුණුවල සීමා නිර්ණයන් නිවැරැදි ව තෝරා බේරා ගැනීම, දරුවා තුළ සංකල්ප සාධනයෙහි ලා විෂය කරුණු ඉදිරිපත් කිරීමේ අනුපිළිවෙළ හඳුනා ගැනීම, පාඩම දරුවාට පිළිගැන්වීමෙහි ලා යෝජිත සුවිශේෂ ක්‍රම ශිල්ප හඳුනා ගැනීම යන ශක්‍යතා ප්‍රමාණාත්මක ව ගුරු ඔබ වෙත ලැබෙනු ඇත.

අප විෂයමාලා කමිටුව විසින් රචිත මෙම පොත පරිහරණය කරමින් ඔබ, විෂයය කරුණුවල අවශ්‍ය මූලික දැනුම අත්පත් කර ගත්ත ද, යෝජිත විෂය කරුණුවල සමාජ භාවිතාව පිළිබඳ ඔබගේ අවදිමත් භාවය වැදගත් ය. ඒ සඳහා විෂය භේදයකින් තොර ව සංගීත කෘතිවලට සවන්දීම, නර්තන, නාට්‍ය ප්‍රසංග හා චිත්‍රපට නැරඹීම, චිත්‍ර ප්‍රදර්ශන නැරඹීම ආදිය ඉතා හොඳ ප්‍රබෝධමත් බවක් හා පෙළඹවීමක් ඔබ තුළ ජනිත කරනු ඇත.

ඒ අනුව ගුරු මාර්ගෝපදේශය ද, උදව් අත්පොත ද ඒවායේ ඇතුළත් පණිවිඩ, හැඳින්වීම් ඇතුළු සියල්ල සහිත ව පූර්ණ වශයෙන් ම කියවන්න. ඉන් ගුරුවරයකු ලෙස ඔබ සතු විය යුතු අත්‍යවශ්‍ය ගුණයක් වූ ''කියවීමේ පුරුද්ද'' ඔබට ලැබ ගන්නට හැකි වනු ඇත.

මේ සියලු ව්‍යායාමයන්හි, කර්තව්‍යයන්හි අග්‍ර ඵලය අපගේ දරු පරපුර වෙත ලබා දෙන්නට ඔබගේ ගුරු භූමිකාව ශක්තිමත් වේවා ! යන්න මාගේ ඒකායන පැතුමයි.

ශාස්ත්‍රපති සුදත් සමරසිංහ,
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වැ/බ)
ජාතික අධ්‍යාපන ආයතනය,
මහරගම.

## විෂයමාලා කමිටුව

| | | |
|---|---|---|
| උපදේශකත්වය හා අනුමැතිය | : | **ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය**<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| විෂය සම්බන්ධීකරණය | : | **කේ. ජී. අජිත් රූපසේන මහතා,**<br>**ව්‍යාපෘති කණ්ඩායම් නායක නාට්‍ය හා රංග කලාව**<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| විෂය විශේෂඥ උපදෙස් | : | **මහාචාර්ය වෝල්ටර් මාරසිංහ මහතා**<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය (විශ්‍රාමික)<br><br>**මහාචාර්ය රෝලන්ඩ් අබේපාල මහතා**<br>කොළඹ විශ්ව විද්‍යාලය<br><br>**මහාචාර්ය මංගලිකා ජයතුංග මහත්මිය**<br>කැලණිය විශ්ව විද්‍යාලය |
| ලේඛක මණ්ඩලය අභ්‍යන්තර | : | **කේ. ජී. අජිත් රූපසේන මහතා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| බාහිර | | **එම්.ජේ. ක්ලයිව් ශාන්ත මහතා**<br>ගුරු සේවය, ශාන්ත ආනා විද්‍යාලය, කුරුණෑගල<br><br>**රණසිංහ අධිකාරි මහතා**<br>ගුරු සේවය - මහින්ද විද්‍යාලය - ගාල්ල<br><br>**ටෙනිසන් දසනායක මහතා**<br>ගුරු සේවය - ඇල්පිටිය ආනන්ද විද්‍යාලය<br><br>**ලලිතා ජයරත්න මහත්මිය**<br>ගුරු උපදේශක - ඇඹිලිපිටිය කලාපය<br><br>**ඩී.පී. ස්වර්ණලතා මහත්මිය**<br>ගුරු උපදේශක - ඇල්පිටිය කලාපය<br><br>**සමන් කස්තුරිරත්න මහත්මිය**<br>ගුරු සේවය (විශ්‍රාමික)<br><br>**ජී. කරුණාවතී මහත්මිය**<br>අධ්‍යාපන පරිපාලන සේවය<br>ශාන්ත පාවුළු බාලිකා විද්‍යාලය, කොළඹ |

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

මෙම ගුරු මාර්ගෝපදේශය, වර්ෂ 2017 සිට ක්‍රියාත්මක කිරීමට නියමිත චිත්‍ර කලාව 8 ශ්‍රේණිය විෂය නිර්දේශය පදනම් කරගෙන සම්පාදනය කර ඇත. පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා මෙය ඔබ අතට පත් කෙරේ. මෙම පොත පරිශීලනයේ දී පහත සඳහන් කරුණු පිළිබඳ ව ඔබගේ විශේෂ අවධානය යොමු කරන්න.

- පාසලේ වාර්ෂික වැඩ සැලසුමට අනුකූල වන සේ කාලය කළමනාකරණය කරගන්න.

- ප්‍රධාන නිපුණතා ... ක් යටතේ පෙළගස්වා ඇති අන්තර්ගතයෙහි 1.0 සිට 5.0 දක්වා වන ප්‍රායෝගික නිපුණතාවන්හි නිපුණතා මට්ටම් සඳහා ආදර්ශ ක්‍රියාකාරකමක් ඇතුළත් කර ඇත. එම නිපුණතා මට්ටම්වලට අදාළ ව යෝජනා කර ඇති මාතෘකා හෝ සුදුසු වෙනත් මාතෘකා පදනම් කරගෙන අනෙකුත් ක්‍රියාකාරකම් නිර්මාණය කරගන්න.

- ....නිපුණතා සඳහා ක්‍රියාකාරකම් සැලසුම් කර ඇතත්, සුදුසු නිර්මාණශීලී ක්‍රමවේද භාවිත කර, අදාළ විෂය කරුණු සාක්ෂාත් වන සේ ක්‍රියාකාරකම් වෙනස් කර ගැනීමට ඔබට නිදහස ඇත.

- යෝජිත මෙන් ම සම්පාදනය කර ගන්නා ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ දී පහත සඳහන් කරුණු පිළිබඳ ව සැලකිලිමත් වන්න.

  I සෞන්දර්ය හෝ වෙනත් විෂය සමෝධානික රසවත් ඉදිරිපත් කිරීම් මඟින් ප්‍රබෝධාත්මක ආරම්භයක් ලබාගෙන සිසුන් පාඩමට ඇදබැඳ ගැනීම හා පෙර දැනුම විමසීමට පොලඹවා ගැනීම ඔස්සේ ක්‍රියාකාරකමට පිවිසිය යුතු ය.

  II සිසුන්ගේ ශක්‍යතා හඳුනා ගෙන නිර්මාණශීලී ඉගෙනුම් ක්‍රම භාවිත කර, ප්‍රතිපෝෂණ හා ඉදිරිපෝෂණ ලබාදෙමින් ක්‍රියාකාරකම අවසානයක් කරා ගෙනයැමෙන් අපේක්ෂිත ඉගෙනුම් පල වෙත ළඟා විය හැකි ය.

  III ඉදිරිපත් කිරීම්, ඇගයීම්, සමාලෝචනය, පසු වැඩ පැවරීම, ඇතුළත් ව සමස්ත පාඩම නිමා කිරීම.

- ගුරු මාර්ගෝපදේශය මගපෙන්වීමක් පමණි. විෂයබද්ධ ග්‍රන්ථ, අන්තර්ජාලය, වැනි මාධ්‍ය පරිශිලනය කිරීමෙන් ගුරුවරයා මෙන් ම ශිෂ්‍යයා ද දැනුමෙන් හා අවබෝධයෙන් සන්නද්ධ වීමෙන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් සාර්ථක කරගත හැකි වේ.

- හඳුන්වා දී ඇති සියලු ම නිපුණතා පුද්ගල පෞරුෂ සංවර්ධනය පදනම් කරගෙන ගොඩනගා ඇති බැවින්, එම නිපුණතා ...ම අනිවාර්යයෙන් ම ක්‍රියාත්මක කළ යුතු ය.

  පහත වගුව අනුව ක්‍රියාකාරකම් වාර තුනට බෙදාගත හැකි ය.

| 1 වාරය | | | | 2 වාරය | | | | 3 වාරය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ක්‍රියාකාරකම් අංකය | | | | ක්‍රියාකාරකම් අංකය | | | | ක්‍රියාකාරකම් අංකය | |
| 1.1.1 | 3.1.1 | 6.1.1 | 7.1.1 | 1.13 | 2.2.4 | 4.2.2 | 7.2.2 | 1.1.5 | 6.1.6 |
| 1.1.2 | 3.1.2 | 6.1.2 | 7.1.2 | 1.1.4 | 3.2.1 | 5.2.1 | 7.2.3 | 2.2.5 | 6.1.7 |
| 1.2.1 | 4.1.1 | 6.1.3 | 7.1.3 | 1.3.1 | 3.2.2 | 6.1.4 | 7.2.4 | 2.2.6 | 7.4.1 |
| 2.1.1 | 5.1.1 | 6.2.1 | 7.2.1 | 2.2.1 | 3.2.3 | 6.1.5 | 7.3.1 | 3.3.2 | 7.4.2 |
| 2.1.2 | | 6.3.1 | | 2.2.2 | 3.3.1 | 6.2.2 | | 3.3.3 | |
| | | | | 2.2.3 | 4.2.1 | 6.3.2 | | 4.2.3 | |

# පටුන


| | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් පණිවුඩය | iii-iv |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් පණිවිඩය | v |
| හැඳින්වීම | vi |
| විෂයමාලා කමිටුව | vii |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | viii |
| විෂය නිර්දේශය | x-xxii |
| ඉගැනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 01-53 |

## ගුරු භවතුන්ට උපදෙස්

1. කණ්ඩායම් ක්‍රියාකාරකමෙහි දී ඔබේ පන්තියේ සිටින සිසුන් සංඛ්‍යාව සැලකිල්ලට ගෙන සුදුසු සහ අභිමත පරිදි කණ්ඩායම් සකස් කරන්න.

2. වාර තුනකට අදාළ පරිච්ඡේද සැලසුම් කර ගැනීමේ දී ඉගැනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය පහසුවන පරිදි සකස් කරගන්න.

3. විවිධ ක්‍රියාකාරකම් සඳහා ගුරු මාර්ගෝපදේශයේ යොදා ගන්නා ලද ගීත, කවි ආදිය වෙනුවට ගුරුවරයාගේ අභිමතය පරිදි සුදුසු කවි, ගීත යොදා ගැනීමට නිදහස ඇති බව සලකන්න.

4. ගුරු මාර්ගෝපදේශයට ම සීමා නොවී නව නිර්මාණ සඳහා විෂය නිර්දේශයට අදාළ පරිදි උචිත තේමා සකස් කර ගැනීමට ගුරුමහතාට/මහත්මියට අවස්ථාව ඇති බව සැලකුව මනායි.

5. නිපුණතා මට්ටම්වලට අනුව ගුරු මාර්ගෝපදේශයේ සකසා ඇති ක්‍රියාකාරකම් ආකෘතිවලින් පරිබාහිර ව සුදුසු ආකෘතියකට අනුගත වෙමින් නව ක්‍රියාකාරකම් ආකෘති ගොඩනැගීමට නිර්මාණශිලී ගුරු මහතාට/මහත්මියට අවකාශය ඇති බව සලකන්න.

# විෂය නිර්දේශය

# හැඳින්වීම

නාට්‍ය හා රංග කලාව යනු අතිශයින් නිර්මාණශීලී වූත්, ප්‍රායෝගික වූත්, වින්දනීය වූත්, විෂය ක්ෂේත්‍රයකි. පාසල් පද්ධතියේ වර්තමානයේ ක්‍රියාත්මක වන නිපුණතා පදනම් කරගත් අධ්‍යාපන ක්‍රමය හා අනුගත විෂය නිර්දේශයක් ලෙස නාට්‍ය හා රංගකලාව විෂය නිර්දේශය හැඳින්විය හැකි ය.

මුල් කාලයේ දී අ.පො.ස. උසස් පෙළ ශ්‍රේණි සඳහා පමණක් සීමා වී තිබුණු මෙම විෂයය, 1992 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ නිර්දේශය අනුව පසුව 10,11 ශ්‍රේණි දක්වා ද ව්‍යාප්ත විය. එය වඩාත් පුළුල් පරාසයක විකාශය වෙමින් 2007 වසරේ දී 6 වැනි ශ්‍රේණියෙන් ඇරැඹෙන විෂය නිර්දේශය, නිපුණතාපාදක අධ්‍යාපන ක්‍රමය හා මැනවින් බද්ධ වී ඇත. මෙම විෂයය ප්‍රායෝගිකත්වයට නැඹුරු වූ, නිශ්චිත නිපුණතා ළඟා කරගත හැකි ක්‍රියාකාරකම් පාදක කොටගත් විෂයයක් වන බැවින්. සමාජ ගැටලු නාට්‍යමය දෘෂ්ටි කෝණයකින් හඳුනා ගෙන වින්දනාත්මක ව ග්‍රහණය කරගැනීමේ හැකියාව වර්ධනය කිරීම මෙමගින් අපේක්ෂිත ය.

නිර්මාණාත්මක හැකියාවන් හා ප්‍රායෝගික කුශලතාවන් වර්ධනය කිරීමත්, විචාරශීලී රසාස්වාදයට හුරු කිරීමත් අරමුණු කොට ගෙන ඇති මෙම විෂයය මගින් නාට්‍ය සිද්ධාන්ත, නිර්මාණාත්මක හැකියාව, ප්‍රායෝගික ක්‍රියාකාරකම්, දේශීය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම, හා වින්දනීය මානව හිතවාදියකු බිහිකිරීම යන පංචවිධ නිපුණතා සාධනය කරගැනීම අපේක්ෂා කෙරේ.

ළමා මනසට ගෝචර වන විචිත්‍ර ලෝකය හා වීරක්‍රියා වැනි සංකල්ප ගොඩ නැගීමට නාට්‍ය හා රංගකලාව විෂයය යොදාගැනීම බෙහෙවින් සාර්ථක ය. අධ්‍යාපන ක්ෂේත්‍රයේ දී ප්‍රියජනක ඉගැනුම් අත්දැකීම් සමීප කරමින්, නිර්මාණශීලී පරපුරක් ගොඩ නැගීම හා එමගින් සමස්ත පුද්ගල පෞරුෂය ගොඩ නැගීමේ කාර්යය සඳහා ද මෙම විෂයය ඉවහල් වේ. නව ලෝකයේ සංකීර්ණ වූත්, වේගවත් වූත්, වැඩ පරිසරයට අවශ්‍ය වන ශ්‍රමදායකයා ද, විචාරශීලී නිර්මාණකරුවා ද, වින්දනය හා ස්වාභිමානය/ආත්මාභිමානය පුරුදු පුහුණු කළ මානව හිතවාදියා ද ගොඩ නැගීමට අවශ්‍ය දේශීය අනන්‍යතාව හා සංස්කෘතික උරුමය, ප්‍රායෝගිකත්වය හා නිර්මාණශීලීත්වය ගැබ් වූ ක්‍රමවේදයක් නාට්‍ය හා රංගකලාව විෂයය තුළ අන්තර්ගත වේ.

සමාජ ජීවිතයේ මුහුණ දෙන ගැටලුවලට යථාර්ථවාදී හා ශුභවාදී විසඳුම් ලබාගැනීමට අවශ්‍ය පෙර සූදානම මෙමගින් ලබාදෙන අතර, වින්දනීය මානව හිතවාදියකු මෙන් ම ශ්‍රී ලාංකේය අනන්‍යතාවකින් හෙබි අභිමානවත් පුරවැසියකු ගොඩනැගීමේ අභියෝගය නාට්‍ය හා රංගකලාව විෂය භාර ගුරුභවතුන් හමුවේ පවතින භාරදූර වගකීමක් බව අවසන් වශයෙන් සඳහන් කළ යුතු ය.

# ජාතික පොදු අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු සපුරාගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I	මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කරගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

II	වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම

III	මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV	පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V	සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

VI	පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII	ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII	ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුශලතා පෝෂණය කිරීම. (උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව - 2003)

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටුකර ගැනීමට දායක වනු ඇත

**(I) සන්නිවේදන නිපුණතා**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය මත තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් කරගනී.

සාක්ෂරතාව : සාවධානව ඇහුම්කන් දීම පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරැදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කරගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයක් තුළදී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කරගැනීම

**(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුශලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

**(III) පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදිතාව හා කුශලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුශලතා

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුශලතාව ඉගැනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුශලතා මෙහි අඩංගු වේ.

**(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

- ආර්ථික සංවර්ධනයට දායක වීම
- තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනාගැනීම
- හැකියාවනට සරිලන අයුරින් රැකියාවක් තෝරාගැනීම සහ වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුශලතා

**(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහාගැනීම හා ස්වීකරණය

**(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

**(VII) "ඉගැනීමට ඉගැනුම" පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින්හට ශක්තිය ලබාදීම.

(උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව - 2003)

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 01. නාට්‍ය හා රංග කලාවට පාදක සිද්ධාන්ත පැහැදිලි කරයි | 1.1 නාට්‍ය පෙළක මූලිකාංග හඳුනාගනියි.<br><br>1.2 කතා වස්තුව පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි.<br><br>1.3 නාට්‍යය සහාය කරගනිමින් ජීවන ගැටලු විනිවිද දකියි.<br><br>1.4 තෝරාගත් නාට්‍ය පෙළක සතර අභිනය භාවිත කළයුතු ආකාරය විමසයි. | 1.1 නාට්‍ය පෙළක් යනු කුමක් දැ යි අධ්‍යයනය කිරීම.<br><br>1.2 නාට්‍ය පෙළෙහි එන තේමාව සංවාද හා චරිත හඳුනාගැනීම.<br><br>1.3.1 නාට්‍යයෙන් ප්‍රකාශ වන අදහස් තම ජීවිත අත්දැකීම් සමග සංසන්දනය කිරීම.<br><br>1.3.2 අන්‍යෝන්‍ය වශයෙන් පුද්ගල හැඟීම් හඳුනාගැනීම.<br><br>1.4 නාට්‍ය පෙළට උචිත ආකාරයෙන් සතර අභිනය භාවිත කළ යුතු ආකාරය පිළිබඳ ව විමර්ශනය කිරීම. | • නාට්‍යයකට සුදුසු කථා වස්තු රැස් කරයි.<br><br>• ජීවන අත්දැකීම් තේමා කරගත් වස්තු නාට්‍යය සඳහා පාදක කරගනිමින් ප්‍රේක්ෂක ජීවිත පරිඥානය පුළුල් කරගැනීමට සහාය වෙයි.<br><br>• නාට්‍ය පෙළක සුවිශේෂ ලක්ෂණ හඳුනාගෙන නාට්‍ය පෙළක් රචනය කරයි.<br><br>• පුද්ගල සහසම්බන්ධතා මැනැවින් පවත්වා ගනිමින් යහපත් සමාජයක් ගොඩනඟයි.<br><br>• රචනය කරන ලද පෙළට අදාළ ව සතර අභිනය භාවිතය සැලසුම් කරයි. | 15 |
| 02. ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි . | 2.1 තේමාවක් අරමුණු කොටගෙන කතාවක් ගොඩනඟයි. | 2.1.1 ගුරුවරයා විසින් දෙනු ලබන තේමාවකට අනුව කතාවක් ගොඩනැගීම.<br><br>2.1.2 සිසුන් විසින් තෝරාගනු ලබන තේමාවකට අනුව කතාවක් ගොඩ නැගීම | • ගුරුභවතා විසින් සපයනු ලබන තේමාවකට අදාළ ව කතාන්දරයක්, නාට්‍යෝචිත ව ගොඩනංවයි.<br><br>• සාමූහික ව ගොඩනැංවූ කතාන්දරය පදනම් කරගෙන නාට්‍ය පෙළ රචනය කරයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.2 නාට්‍ය පෙළක් රචනා කරයි. | 2.2 සරල පෙළක් රචනා කිරීම (සාමූහික ව) | • නාට්‍ය පෙළට අදාළ ව වෙස් මුහුණු, වේෂභූෂණ, නාට්‍යෝපකරණ නිර්මාණය කරයි.<br>• නාට්‍ය පෙළට උචිත පසුතල සැලසුම් කර නිර්මාණය කරයි.<br>• සියලු ආනුෂංගික කලාංග සහිත ව නාට්‍ය පෙළ නිෂ්පාදනය කරයි. | 22 |
| | 2.3 නාට්‍ය පෙළ සංවර්ධනය කරයි. | 2.3 රචිත නාට්‍ය පෙළෙහි සංවර්ධනය සහ නාට්‍ය පෙළ පිළිබඳ ව සාකච්ඡා කිරීම. (රංග විධාන ආදී) | | |
| | 2.4 චරිත අභ්‍යන්තරය ඉස්මතු වන සේ රූපණයේ යෙදෙයි.<br>. | 2.4.1චරිතවල ස්වභාවය අනුව නළුවන් තෝරාගැනීම ඒ ඒ චරිතයට අදාළ චරිත ලක්ෂණ සාකච්ඡා කිරීම.<br>2.4.2 සකස් කරගත් පෙළට අදාළ ව චරිත නිරූපණය කිරීම. | | |
| | 2.5 පරිකල්පනය වර්ධනය වන ක්‍රියාකාරකම්හි යෙදෙයි. | 2.6 නිශ්චිත තේමාවක් ඔස්සේ පරිකල්පනය මෙහෙයැවීම (සාමූහික හා කේවල ) | | |
| | 2.6 නිර්මාණාත්මක චින්තනය වර්ධනය වෙයි. | 2.6.1 ශිෂ්‍යයාට අභිමත කතාවක් තෝරාගැනීම<br>2.6.2 එහි නාට්‍යෝචිත අවස්ථා හඳුනාගැනීම.<br>2.6.3 සංවාද ගොඩනැගීම හා පෙළ රචනය කිරීම. | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.7 වේෂභූෂණ නිර්මාණය කරයි. | 2.7.1 තෝරාගත් නාට්‍යයට උචිත ලෙස වේෂ භූෂණ සැළසුම් සහ නිර්මාණය කිරීම.<br>2.7.2 තෝරාගත් නාට්‍යයට ගැළපෙන නාට්‍යෝපකරණ සැලැසුම් කිරීම හා නිර්මාණය කිරීම. | | |
| | 2.8 අංග රචනය කරයි. | 2.8 නාට්‍යයට අදාළ ව අංග රචනය කිරීම | | |
| | 2.9 වේදිකා පසුතල නිර්මාණය කරයි. | 2.9 එම නාට්‍යයට අදාළ ව වේදිකා පසුතල සැලැසුම් කිරීම හා නිර්මාණය කිරීම. | | |
| | 2.10 සංගීතය නිර්මාණය කරයි. | 2.10 සංගීතය නිර්මාණය කිරීම. | | |
| | 2.11 රචනා කරන ලද පෙළ රංගයක් බවට පත් කරයි. | 2.11 ආනුෂංගික කලා භාවිත කරමින් පෙළ රංගයක් බවට පත් කිරීම. | | |
| 03.නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැළෙයි. | 3.1 නාට්‍ය පෙළ අධ්‍යයනය කරයි.<br>3.2 රංග අභ්‍යාසවල නිරත වෙයි.<br>3.3 නාට්‍ය කලාවට අදාළ හඬ අභ්‍යාසවල යෙදේ. | 3.1.1 නිර්දිෂ්ට නාට්‍ය පෙළ කියැවීම /නැරඹීම<br>3.1.2 නාට්‍යයේ තේමාව හඳුනාගැනීම.<br>3.1.3 සිද්ධි පෙළ ගස්වා ඇති ආකාරය වටහාගැනීම | • නාට්‍ය පෙළ කියවා එහි තේමාව වින්‍යාසය හා චරිත විමසයි.<br>• රංග අභ්‍යාසවල යෙදෙයි.<br>• බුද්ධගජ්ජය හා ජන ගී ඇසුරින් හඬ අභ්‍යාස ප්‍රගුණ කරයි.<br>• නාට්‍ය ගීත භාවාත්මක ව ගායනා කරයි.<br>• රංග ක්‍රීඩාවල සහ අභිරූපණයන්හි යෙදෙයි. | 30 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.4 සංවාද භාවිතයෙහි යෙදෙයි.<br><br>3.5 නාට්‍ය ගීත ගායනා කරයි.<br><br>3.6 රංග ක්‍රීඩාවල නිරත වෙයි.<br><br>3.7 අභිරූපණ රංගනයේ යෙදෙයි. | 3.1.4 චරිත ස්වභාවයන් හඳුනාගැනීම<br><br>3.2.1 ශරීරය උණුසුම් කිරීමේ රංග අභ්‍යාසවල නිරත වීම<br><br>3.2.2 ශිථිලකරණ අභ්‍යාසවල නිරත වීම.<br><br>3.2.3 ශාරීරික හා මානසික සම්බන්ධතාව ඇති වන නිර්මාණාත්මක අභ්‍යාසවල යෙදීම.<br><br>3.3.1 "බුද්ධගජ්ජය" ඇසුරින් හඬ අභ්‍යාසවල යෙදීම<br><br>3.3.2 ජන ගී ගායනා කිරීම (දැල් ගී, වැදි ගී, යාතුකර්ම ගී වැනි )<br><br>3.4 හඬ අභ්‍යාස භාවිත කරමින් තෝරාගත් නාට්‍ය පෙළට අදාළ ව සංවාද භාවිත කිරීම.<br><br>3.5 නාට්‍ය ගීත ගායනා කරයි.<br><br>3.6 රංග ක්‍රීඩාවල නිරත වෙයි.<br><br>3.7 අභිරූපණ රංගනයේ යෙදෙයි. | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 04.නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි. | 4.1 ආගමික කතා ඇසුරෙන් නාට්‍යමය අවස්ථා විමසයි.<br><br>4.2 සාරධර්ම ගොඩනැගීම සඳහා ආගමික කතා ඇසුරින් ගොඩනගාගත් නාට්‍ය ඉවහල් කර ගනියි.<br><br>4.3 ආගමික කතා ඇසුරින් ශ්‍රී ලංකාවේ නිර්මාණය වී ඇති නාට්‍ය පිළිබඳ ව විමසයි.<br><br>4.4 එම නාට්‍යවල ඇති සංස්කෘතික, සාමාජික හා විද්‍යාත්මක අගය පිළිබඳ ව විමසයි.<br><br>4.5 විවිධ ආගමික උත්සවවල දී උක්ත නාට්‍ය ප්‍රදර්ශනය කරයි.<br><br>4.6 සංස්කෘතික හා සාමාජික වටිනාකම් සහිත තේමා රැගත් නාට්‍යමය අවස්ථා නිර්මාණය කරයි. | 4.1 ආගමික කතාවල දක්නට ලැබෙන නාට්‍යෝචිත අවස්ථා විමැසීම.<br><br>4.2 සාරධර්ම ගොඩනැගෙන ආකාරයේ ආගමික නාට්‍ය නිර්මාණය කිරීම<br><br>4.3 ශ්‍රී ලංකාවේ නිර්මාණය වී ඇති ආගමික තකා පාදක කොටගත් නාට්‍ය විමර්ශනය කිරීම.<br><br>4.4 එම නාට්‍යවල ඇති සාමාජික සංස්කෘතික හා විද්‍යාත්මක අංගයන් සාකච්ඡා කිරීම.<br><br>4.5 සකස් කරගත් නාට්‍ය උත්සව අවස්ථාවල ප්‍රදර්ශනය කිරීම.<br><br>4.6 "සිරිත්මල්දම" ඇසුරින් නාට්‍යමය අවස්ථා නිර්මාණය කිරීම. | • ආගමික කතාවල දක්නට ලැබෙන නාට්‍යෝචිත අවස්ථා මතු කරගනියි.<br>• ආගමික කතා පාදක කොටගත් නාට්‍යවල සංස්කෘතික හා විද්‍යාත්මක අගය පහදයි.<br>• සාරධර්ම අරමුණු කරගත් නාට්‍ය නිර්මාණය කරයි.<br>• නාට්‍ය වේදිකාගත කිරීමේ ක්‍රියාවලිය අත්විඳියි.<br>• සිරිත් මල්දමෙහි තෝරාගත් අවස්ථා නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කරයි. | 12 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 05.නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මක ව විඳගැනීම හා මානව හිතවාදියකු ලෙස සමාජගත වීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | 5.1 නාට්‍ය පෙළ රස විඳියි<br><br>5.2 නාට්‍ය නිෂ්පාදනය රස විඳියි. | 5.1 නාට්‍ය පෙළ රස විඳීම (නිර්දිෂ්ට නාට්‍ය පෙළ ඇසුරෙන්)<br>5.1.1 තේමාව<br>5.1.2 කථා වස්තුව<br>5.1.3 චරිත<br><br>5.2 නාට්‍ය නිෂ්පාදනය රස විඳීම<br>5.2.1 රූපණය<br>5.2.2 ආනුෂංගික ශිල්ප භාවිතය (නිර්දිෂ්ට නාට්‍ය පෙළ -වළහා සහ මාෂා- ඩී.කුමාරගේ) | • නාට්‍ය පෙළට පාදක වූ කතා වස්තුව ප්‍රකාශ කරයි.<br>• නාට්‍යයේ තේමාව විමසයි.<br>• නාට්‍ය පෙළෙහි එන චරිත නම් කරයි.<br>• රූපණ කාර්යය අගය කරයි.<br>• ආනුෂංගික ශිල්ප යොදාගෙන ඇති ආකාරය නිරීක්ෂණය කරයි. | 11 |

## 8 ශ්‍රේණිය

| 1 වාරය | | 2 වාරය | | 3 වාරය | | |
|---|---|---|---|---|---|---|
| නිපුණතා මට්ටම | කාලච්ඡේද | නිපුණතා මට්ටම | කාලච්ඡේද | නිපුණතා මට්ටම | කාලච්ඡේද | මුළු කාලච්ඡේද |
| 1.1<br>1.2<br>1.3 | 04 | 1.4<br>1.5<br>1.6 | 06 | 1.7<br>1.8 | 05 | 15 |
| 2.1<br>2.2<br>2.3 | 06 | 2.4<br>2.5<br>2.6<br>2.7.1 | 10 | 2.7.2<br>2.7.3<br>2.8<br>2.9 | 08 | 24 |
| 3.2<br>3.3.1<br>3.3.2<br>3.4.1<br>3.5 | 06 | 3.<br>3.4.2<br>3.5.1<br>3.5.2 | 08 | 3.6 | 05 | 23 |
| 4.1<br>4.2<br>4.3 | 08 | 4.4 | 06 | 5.1<br>5.2 | 14 | 28 |
| | 28 | | 30 | | 32 | 90 |

නිපුණතාව 1.0 ඃ නාට්‍ය හා රංගකලාවට පදනම් වූ සිද්ධාන්ත පැහැදිලි කරයි.

නිපුණතා මට්ටම 1.1 ඃ නාට්‍ය පෙළක මූලිකාංග හඳුනාගනියි.

ක්‍රියාකාරකම 1.1.1 ඃ නාට්‍ය පෙළ රචනය කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව ඃ 04

ඉගැනුම් පල ඃ
- නාට්‍ය පිටපත් රැස් කරයි.
- නාට්‍ය පෙළ අධ්‍යයනය කරයි.
- නාට්‍ය පෙළක මූලිකාංග පෙළ ගස්වයි.
- කථාවක නාට්‍යෝචිත අවස්ථා නම් කරයි.
- කථාවක් නාට්‍ය පෙළක් බවට පත් කරයි.

ගුණාත්මක යෙදවුම් ඃ නාට්‍යයකට ගැළපෙන සිදුවීම් පුවත්පත් ඇසුරෙන් තෝරාගන්න.

ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ

පියවර 01 ඃ පෙර දිනක දී දැනුම් දෙන ලද පරිදි දිනපතා පුවත්පත්වලින් සපයාගත් නාට්‍යයකට ගැළැපෙන සිදුවීම් (හෝ ගුරුභවතා විසින් සපයාදෙනු ලබන) ඇතුළත් පත්‍රිකා ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව සලසාදෙන්න.

පියවර 02 ඃ
- කථාවක් හෝ සිදුවීමක් නාට්‍යයක් බවට පත් කිරීමේදී සැලැකිය යුතු කරුණු ගණනාවක් ඇති බව අවධාරණය කරන්න.
- කථාවේ දක්නට ලැබෙන මුල, මැද, අග ඒ පිළිවෙලට ම නාට්‍යයේ ඇතුළත් කිරීම අනිවාර්ය නොවන බවත්,
- කථාවේ සිද්ධිමාලාව ඒ අනුපිළිවෙලින් ම ඇතුළත් නොකර කථා තේමාව මතු කළ හැකි ආකාරයට වෙනස් පිළිවෙලකින් වුව ද නාට්‍යයට ඇතුළත් කළ හැකි බවත්,
- කථාවේ දැක්වෙන අදාළ සිද්ධි හා අවස්ථා නාට්‍යයට උචිත පරිදි සකස් කළ හැකි බවත්,
- කථාවේ මූලික හරයට හානි නොවන පරිදි නාට්‍ය වස්තුව ගොඩනැගිය යුතු බවත්,
- නාට්‍යයේ සංවාද භාවිතය හා චරිත නිරූපණය වඩා ප්‍රබල විය යුතු බවත්,
- නාට්‍යයට උචිත පරිදි චරිත හසුරුවා ගත යුතු බවත්, පැහැදිලි කරන්න.

පියවර 03 ඃ සිසුන් කණ්ඩායම් කර පෙර සඳහන් කළ සිදුවීම් සහිත පත්‍රිකා ඒ ඒ කණ්ඩායම්වලට පවරන්න. අනතුරු ව පහත දැක්වෙන පරිදි උපදෙස් දෙමින් නාට්‍ය පෙළ රචනය සඳහා යොමු කරන්න.
- කතාවකින් නාට්‍යෝචිත අවස්ථා වෙන්කර ගැනීමත්,
- මුල,මැද, අග සම්බන්ධතාව රැකෙන පරිදි අවස්ථා ගළපාගැනීමත්,
- එම ගළපාගැනීම යම්කිසි ගැටලුවක් ප්‍රකාශ වන සේ අවස්ථා නිර්මාණය විය යුතු බවත්,
- ගැටලුව වර්ධනය වීම උච්ච අවස්ථාවක් සහ අවසානයක් ගොඩනැගෙන අකාරයට සකස්විය යුතු බවත්,
- නාට්‍ය මුලින් ම රඟ දැක්වෙන්නේ නාට්‍ය රචකයාගේ මනසේ බවත්, එය පිටපතෙහි ඇතුළත් රංගවිධාන මගින් පිළිබිඹුවන බවත්, අනතුරු ව නිෂ්පාදකගේ අර්ථ කථනය සහිත නිර්මාණය රචක මගින්

ප්‍රේක්ෂකයන් වෙත ඉදිරිපත් කරවීම, සිදුවිය යුතු බවත් පැහැදිළි කරන්න.

| | |
|---|---|
| **පියවර 4** | • කරුණු පැහැදිළි කිරීමෙන් පසුව ඒ ඒ කණ්ඩායම් වෙත පවරනු ලැබූ සංසිද්ධි ඇසුරු කොටගනිමින් නාට්‍ය පිටපත් ලිවීමේ අවස්ථාව සලසාදෙන්න. |
| **පියවර 5** | • නාට්‍ය පිටපත් ඒ ඒ කණ්ඩායම් මගින් ඉදිරිපත් කිරීමට (කණ්ඩායම සාමාජිකයන් විසින් ඒ ඒ චරිත බෙදාගෙන) අවස්ථාව සලසමින් අගය කරන්න. සංශෝධනය විය යුතු ස්ථාන කෙරෙහි අවධානය යොමුකිරීම ද වැදගත් වේ. |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- නාට්‍යෝචිත ව සිද්ධි පෙළ ගැස්වීම
- නාට්‍ය පෙළ රචනය
- රංගවිධාන යොදා තිබීම
- ප්‍රබල සංවාද යොදා තිබීම
- කණ්ඩායම් ඉදිරිපත් කිරීම්වල සාර්ථකත්වය

නිපුණතාව 1.0 ඃ නාට්‍ය හා රංගකලාවට පදනම් වූ සිද්ධාන්ත පැහැදිළි කරයි.

නිපුණතා මට්ටම 1.2 ඃ කතා වස්තුව පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි.

ක්‍රියාකාරකම 1.2.1 ඃ නාට්‍යෝචිත වස්තු රැස් කිරීම

කාලච්ඡේද සංඛ්‍යාව ඃ 04

ඉගැනුම් පල ඃ
- නාට්‍යෝචිත බව යනු කුමක් ද යි විමසයි.
- පුවත්පත්වලින් නාට්‍යෝචිත සිද්ධි උපුටාගනියි.
- අත්දැකීම් ඇසුරෙන් නාට්‍යමය සංසිද්ධි ලේඛනගත කරයි.
- ජනකතා, ඓතිහාසික කථා, හා ජාතක කථා ඇසුරෙන් නාට්‍යෝචිත සිද්ධි රැස්කරයි.
- පැරණි කථාවල එන සිදුවීම්, නව දෘෂ්ටියකින් අර්ථ ගන්වයි.

ගුණාත්මක යෙදවුම් ඃ එදිනෙදා පුවත්පත්වලින් සපයාගත් සිදුවීම් ඇතුළත් පත්‍රිකා කිහිපයක්

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

පියවර 1 ඃ නාට්‍යයක් අධ්‍යයනය කිරීමේදී විශේෂයෙන් ම කතා වස්තුව පිළිබඳව අවධානය යොමුකළ යුතු බවත් මෙම ඕනෑම සිදුවීමක් නාට්‍යයකට උචිත නොවන බවත් පැහැදිලි කරන්න.

නාට්‍යයකට සුදුසු කථාවක/සිදුවීමක/ අවස්ථාවක තිබිය යුතු ලක්ෂණ පිළිබඳ අවබෝධයකින් යුතුවීම අවශ්‍ය බව පහදන්න. ඒ අනුව පහත දැක්වෙන කරුණු කෙරෙහි අවධානය යොමුකරන්න.
- කථාවෙහි ඇති අපූර්ව බව (නොඇසූ විරූ, නොදුටු විරූ) සිදුවීම මුල, මැද, අග වශයෙන් මනා ව ගැලපීම
- කිසියම් අරමුණක් පෙරදැරි කරගෙන කථාව විකාශය වීම
- පුරුදු අත්දැකීම් සහිත වීම
- කුතුහලයෙන් යුක්තවීම
- ගැටුම් සහිතවීම
- ගැටුමේ ආරම්භය, උච්චස්ථාව, ගැටලුව ලිහිල්ව යාම, විසඳුම සහිතව කතාව ගලායාම
- විශ්වසනීය ව ඉදිරිපත් කිරීම
- ප්‍රේක්ෂකයාට රසයක් ලබාගත හැකිවිය යුතු මෙන් ම බුද්ධිගෝචර වීම
- භාෂා අනුකරණ විධි එනම් අනුප්‍රාසය, උත්ප්‍රාසය, ව්‍යංගාර්ථ, ධ්වනිතාර්ථ සහිත භාෂාවක් යොදාගැනීම
- වේදිකාව මත පෙන්විය හැකි සිදුවීම්, ක්‍රියාවන් හා ස්ථාන සහිත වීම

යනාදි කරුණු නාට්‍යයකට සුදුසු එනම් නාට්‍යෝචිත බවෙහි ලක්ෂණ වන බව පැහැදිලි කරමින් සටහන් තබා ගැනීමට අවකාශ සලසන්න.

පියවර 2 ඃ ගුරුවරයා විසින් සපයාගනු ලැබූ කථා වස්තූන් කියැවීමට සිසුන්ට අවස්ථාවක් ලබාදෙන්න.

පියවර 3 නිදහස් අවකාශයක රවුමට සිටුවන ලද හෝ වාඩි වූ සිසුන්ට ගුරුභවතා විසින් සපයනු ලබන ඉඟියකට අනුව වැල්කතාන්දර ගෙතීමේ අභ්‍යාසයෙහි නිරත කරවන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

- නාට්‍යෝචිත සිදුවීම් සහිත වස්තු රැස්කිරීම
- කථා වස්තුවෙහි සිදුවීම් උචිත ආකාරයට පෙළ ගැස්වීම
- රංග ප්‍රයෝගයන් හි සුදුසු බව
- කතාන්දර ගෙතීමේදි මතුවන පරිකල්පන කුශලතාව
- නිවැරදි ව පැවරුම් නිර්මාණය කිරීම

**අතිරේක උදව්** - ජාතක කථා
ඓතිහාසික කථා
ජනකතා, විවිධ නාට්‍ය පිටපත්

**නිපුණතාව** 1.0 **නාට්‍ය හා රංග කලාවට පදනම් වූ සිද්ධාන්ත පැහැදිලි කරයි.**

**නිපුණතා මට්ටම 1.2** ඃ **කතා වස්තුව පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි**

**ක්‍රියාකාරකම 1.2.2** ඃ **නාට්‍ය පෙළෙහි අන්තර්ගත තේමාව, සංවාද හා චරිත හඳුනාගැනීම**

**කාලච්ඡේද සංඛ්‍යාව** ඃ 01

**ඉගැනුම් පල** ඃ
- තේමාව යනු කුමක් ද යි පැහැදිලි කරයි.
- නාට්‍යයක එන චරිතවල ස්වභාවය විස්තර කරයි.
- නාට්‍ය සංවාදවල ස්වභාවය අධ්‍යයනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** ඃ බ්‍රිස්ටල් බෝඩ් , A4 කඩදාසි

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස්** ඃ

**පියවර 1** ඃ පහත දැක්වෙන කරුණු පදනම් කරගෙන සාකච්ඡාවක් ගොඩ නංවන්න.
- තේමාව යනු නාට්‍යපෙළින් ප්‍රකාශ වන අදහසයි. නිදසුනක් ලෙස 'අමර ගියා දිව්‍ය ලෝකෙ' නාට්‍යයේ අමර තමන් ලද අත්දැකීමක් ඇසුරෙන් ජීවිතාවබෝධය ලැබීම
- චරිත යනු කතා වස්තුවක අවස්ථා හා සිද්ධි තුළ ඇති ක්‍රියා ප්‍රේක්ෂකයන් හමුවට පමුණුවන්නෝ ය.
- සංවාද යනු චරිතවල අදහස් ප්‍රේක්ෂකයාට දැන්වීම සඳහා යොදාගන්නා මාධ්‍යයයි.

**පියවර 2** ඃ
- අභිමත පරිදි සිසුන් කණ්ඩායම්ලට වෙන් කරන්න.
- එක් කණ්ඩායමක්, එක් කතා වස්තුවක් තෝරාගෙන එමගින් දෙනු ලබන පණිවුඩ පත්‍රිකාවල සටහන් කර ප්‍රදර්ශනය කරවන්න.
- අන් කණ්ඩායම් මගින් කතා වස්තුවට අදාළ චරිත පෙළ ගස්වන්න.
- කතාව වෙනස් කරමින් නව චරිත ද ඇතුළත් කළ හැකි ය.

**පියවර 3** ඃ සියලු ම කණ්ඩායම් එක්කර, නම් කරන ලද චරිතවලට සුදුසු සංවාද නිර්මාණය කරවන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** ඃ

01. නාට්‍යෝචිත කතා වස්තූන් තෝරාගැනීම
02. කතාවස්තුවල තේමාව ඉස්මතු කිරීම
03. නාට්‍යපෙළට අදාළ චරිත ලේඛනගත කිරීම
04. සුදුසු සංවාද නිර්මාණය කිරිම
05. නව අර්ථ ගැන්වීම

**පැවරුමඃ**

ඔබ දන්නා නාට්‍ය කිහිපයක (නාට්‍ය 05ක්) තේමාව ලියා දක්වන්න.

**අතිරේක උදව්** ඃ මුද්‍රිත නාට්‍ය පිටපත්

**නිපුණතාව 1.0** : **නාට්‍ය හා රංග කලාවට පදනම් වූ සිද්ධාන්ත පැහැදිලි කරයි.**

**නිපුණතා මට්ටම 1.3** : **නාට්‍යය සහාය කරගනිමින් ජීවන ගැටලු විනිවිද දකියි.**

**ක්‍රියාකාරකම 1.3.1** : **නාට්‍යයෙන් ජීවන ගැටලු දකිමු.**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගැනුම් පල** :
- වැඩිහිටි අවවාද අනුශාසනා පිළිගනියි.
- එදිනෙදා ජීවිතයේදී තම යහපැවැත්ම උදෙසා තමාගෙන් ඉටුවිය යුතු යුතුකම් ඉටු කරයි.
- ගැටලු නිරාකරණය කිරීමේ විවිධ මාර්ග පවතින බව තේරුම් ගනියි.
- ගැටලු විසඳීමට අපූර්ව යෝජනා ඉදිරිපත් කරයි.
- ජීවන ගැටලු විනිවිද දැකීම පිණිස වේදිකා නාට්‍ය නරඹයි.

**ගුණාත්මක යෙදවුම්** :
- බ්‍රිස්ටල් බෝඩ්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

**පියවර 01** : සිසුන්ට මුහුණ පාන්නට සිදුවූ ගැටලු සහ අත්දැකීම් පිළිබඳ ව විමසමින් හෝ ගුරු භවතා විසින් උචිත අත්දැකීමක් විස්තර කරමින් පාඩමට ප්‍රවේශ වන්න.

**පියවර 02** :
- අත්දැකීම් කිහිපයක් ඉදිරිපත් කිරීමෙන් පසු පහත දැක්වෙන කරුණු ද ඇතුළත් කරමින් සාකච්ඡාවක යෙදෙන්න.
- මිනිසුන්වන අපට එදිනෙදා ජීවිතයේ දී විවිධ ගැටලු සහගත අවස්ථාවන්ට මුහුණපාන්නට සිදුවන බව,
- ගැටලුවලට මුහුණ දීමේදී ජීවිතයට විවිධ අත්දැකීම් එකතුවන බව
- ජීවිතයේදී එළඹෙන ගැටලු නිරාකරණය කරගැනීමට අත්දැකීම් සහාය කර ගත හැකිවීම
- වේදිකා නාට්‍ය නැරඹීමෙන් ජීවිතයට අත්දැකීම් බොහොමයක් එක් කරගත හැකි වන බව
- නාට්‍යමය අවස්ථාවන්හි ඇති අපූර්වත්වය තුළින් රස විඳිය හැකිවීම
- නාට්‍යමය අත්දැකීම් තම ජීවන ගැටලු සාර්ථක ව නිරාකරණය කරගැනීමට උපකාර කරගත හැකි වීම

**පියවර 03** : සිසුන් කණ්ඩායම් කරන්න. ඒ ඒ කණ්ඩායම්වලට නම් කරන ලද මාතෘකාවන්ට අදාළ ව කථාවක් ගොඩ නංවා ලේඛනගත ව ඉදිරිපත් කිරීමට උපදෙස් දෙන්න.

1. **කණ්ඩායම** - පන්ති කාමරයක සිදුවන රසවත් හෝ විශේෂ සිදුවීමක් ඇසුරු කරගෙන නාට්‍යයට උචිත කථාවක් ගොඩ නගන්න.
   - එම සිදුවීමෙහි මතු වන ගැටලුව
   - ගැටලුව නිරාකරණය කරගැනීම සඳහා යොදාගත් උපක්‍රම
   - කථාව පුරා දැකිය හැකි ළමුන්ගේ යහගුණ සහ දුර්ගුණ ක්‍රියා පිළිවෙත්

2. **කණ්ඩායම** - නිවසේදී ලත් අත්දැකීමක් ඇසුරෙන් කථාවක් ගොඩ නගන්න.
   එහිදී නිවස හා පවතින සම්බන්ධතාව ඇසුරෙන් එළැඹෙන ගැටලුව
   ගැටලුව නිරාකරණය කරගැනීමට ගන්නා ක්‍රියාමාර්ග
   එහිදි ඔබ ඇතුළු නිවසේ පිරිස හැසිරෙන ආකාරයේ යහගුණ හා දුර්ගුණ ක්‍රියා පිළිවෙත්.

3 **කණ්ඩායම** -

- බස්නැවතුම්පළක /දුම්රිය ස්ථානයක සිදුවූ විශේෂ සිදුවීමක් ඇසුරු කරගෙන නාට්‍යයකට උචිත කථාවක්
- එහි දී පැන නැගි ගැටලුව
- ගැටලුව නිරාකරණය කරගැනීමට ගන්නා උත්සාහය
- ඒ සඳහා සහභාගී වූ පුද්ගලයන්ගේ හැසිරීම් රටා

4 **කණ්ඩායම**

- තමන්ගේ පාසල හා සම්බන්ධ ව පැනනැගි විශේෂිත ගැටලුවක්
- එහි දී ගැටලුව, නිරාකරණය හා ඊට සහභාගී වූ පුද්ගලයන්ගේ විවිධ චර්යා රටා

**පියවර 04** : මාතෘකානුකූලව ගොඩ නැගූ සිද්ධි ඉදිරිපත් කිරිමට අවකාශ සලසන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

- නාට්‍යෝචිත අත්දැකීම් ප්‍රකාශ කිරීම
- ගැටලුව හඳුනාගැනීම
- ගැටලුව නිරාකරණය කිරිම සඳහා යෙදූ උපක්‍රම හඳුනා ගැනීම
- ගැටලු විසැඳීමට යොදාගත හැකි වෙනත් සාර්ථක යෝජනා ඉදිරිපත් කිරිම
- පැවරුම් ඉදිරිපත් කිරිම

**නිපුණතාව 1.0 :** **නාට්‍ය හා රංග කලාවට පදනම් වූ සිද්ධාන්ත පැහැදිලි කරයි.**

**නිපුණතා මට්ටම 1.3 :** **නාට්‍යය සහාය කර ගනිමින් ජීවන ගැටලු විනිවිද දකියි.**

**ක්‍රියාකාරකම 1.3.2 :** අන්‍යෝන්‍ය වශයෙන් පුද්ගල හැඟීම් හඳුනා ගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02

**ඉගැනුම් පල :**
- අන්‍යයන්ගේ හැඟීම් අවබෝධ කරගැනීම ජීවිතයට වැදගත් බව පිළිගනියි.
- සෙසු අයගේ හැඟීම් හඳුනාගැනීමට නාට්‍යවල භූමිකා උපකාරීවන බව අවබෝධ කර ගනියි.
- පුද්ගලයන් තුළ විවිධ හැඟීම් හටගන්නා බව වටහා ගනියි.
- පුද්ගල හැඟීම් තුළින් ගැටුම් ඇති විය හැකි බව හඳුනාගනියි.

**ගුණාත්මක යෙදවුම් :**
- බ්‍රිස්ටල් බෝඩ්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01 :** පුද්ගලයන් තුළ ඇතිවන විවිධ හැඟීම් හඳුනාගැනීම සඳහා සිසුන් සමඟ සාකච්ඡාවක් කරමින් පාඩමට ප්‍රවේශ වන්න. ඒ සඳහා සිසුන්ගේ අත්දැකීම් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.

**පියවර 02 :** සිසුන් කණ්ඩායම් කීපයකට බෙදා සිසුන්ට තමන් දන්නා නාට්‍යවල භූමිකා කීපයක් සටහන් කරමින් එම භූමිකාවල ඇති ප්‍රධාන හැඟීම් ලියන්න සලස්වන්න.

**පියවර 03 :** එම කණ්ඩායම් මගින් සමාජයේ විවිධ භූමිකා සහිත පුද්ගලයන්ගේ රූප ඇඳ ඔවුන්ට අදාළ හැඟීම් ලියන්න සලස්වන්න.

**පියවර 04 :** එම කණ්ඩායම් මගින් භූමිකා 2ක් තෝරාගෙන එම පුද්ගලයන් අතර පුද්ගල හැඟීම් නිසා ගැටුමක් ඇතිවන අයුරු ලියන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**
- සෙසු අයගේ හැඟීම් විස්තර කිරීම
- නාට්‍යවල එන භූමිකාවන්ගේ හැඟීම් ප්‍රකාශ කිරීම
- පුද්ගල හැඟීම් පෙළගස්වා ලිවීම
- පුද්ගල හැඟීම් තුළින් ගැටුම ඇතිවන බව වටහා ගැනීම
- පුද්ගල හැඟීම් අවබෝධ කරගැනීම

**පැවරුම :**

**ඔබ දන්නා නාට්‍යයක ගැටුමකට මුහුණ දෙන චරිත දෙකක් ඇඳ ඊට අදාළ ප්‍රධාන හැඟීම් ලියන්න.**

**අතිරේක උදව් : පාලිත ලොකුපෝතාගමයේ ''අමර ගියා දිව්‍යලෝකේ'' ළමා නාට්‍ය පෙළ**

**නිපුණතාව 1.0** : **නාට්‍ය කලාවට පදනම් වූ සිද්ධාන්ත පැහැදිලි කරයි.**

**නිපුණතා මට්ටම 1.4** : **තෝරාගත් නාට්‍ය පෙළක සතර අභිනය භාවිත කළ යුතු ආකාරය විමසයි.**

**ක්‍රියාකාරකම 1.4.1** : **සතර අභිනය භාවිතය**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
1. සතර අභිනය නිර්වචනය කරයි.
2. වාචික අභිනය භාවිතයෙහි සුවිශේෂතා සාකච්ඡා කරයි.
3. ආංගික අභිනය දැක්වීමේ විවිධ ක්‍රම ප්‍රගුණ කරයි.
4. ඉතා සියුම් ලෙස සාත්ත්වික අභිනය දක්වයි.
5. ආනුෂංගික අංග භාවිතය අධ්‍යයනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- සිසුන් විසින් රචනා කරන ලද, තෝරාගත් නාට්‍ය පිටපත් කීපයක්
- විවිධ භාවයන් නිරූපණය කරන නළු නිළියන්ගේ පින්තූර කීපයක්
- පසුතල, වේෂභූෂණ, නාට්‍යෝපකරණ සහිත පින්තූර, අංගරචනා, අමුද්‍රව්‍ය

**ක්‍රියාකාරකම් සැලැසුම් කිරීම සඳහා උපදෙස්** :

පියවර 1
- ගුණාත්මක යෙදවුම් ලෙස සපයාගත් පින්තූර හා අමුද්‍රව්‍ය ප්‍රදර්ශනය කරමින්, ඒ පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව සලසමින් පහත සඳහන් කරුණු සහිත ව සාකච්ඡාවක් මෙහෙයවන්න.
- නාට්‍ය පෙළක සුවිශේෂ ලක්ෂණයක් ලෙස සංවාද ඇතුළත් වීම ද, එම සංවාද රඟපෑම සඳහා ම රචනය වීම ද, සංවාද උච්චාරණය කරන රටාවන් ද, රංගනය අර්ථවත් වීම පිණිස සංවාද යොදන ආකාරයට නාට්‍ය පෙළක සංවාද ඇතුළත් ව ඇති බව ද පැහැදිලි කරන්න.

පියවර 2
- කණ්ඩායම් කර, සිසුන් විසින් රචනා කරන ලද, තෝරාගත් නාට්‍ය පිටපත් ඔවුන් වෙත ලබාදෙමින් පිටපත් හි සංවාද යොදාගත් ආකාරය නිරීක්ෂණය කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- එම සංවාද, නාට්‍යයේ තේමාව ඉස්මතු කිරීම සඳහා මෙන් ම කතා වස්තුව හා චරිත ලක්ෂණ හෙළිදරව් කිරීම සඳහා කොතෙක් දුරට සහාය වන්නේ දැයි විමසීමට අවකාශ සලසන්න.

- නාට්‍ය පෙළක ලියන ලද සංවාද මුලින් ම නිර්මාණය වන්නේ රචකයාගේ පරිකල්පනයෙහි ය. සංවාද හෙවත් දෙබස් උච්චාරණය කිරීමේ ස්වරූපය දක්වා ඇත්තේ තිත්, කොමා. ප්‍රශ්නාර්ථ, විස්මයාර්ථ වැනි විරාම ලක්ෂණවලින් බවත් වරහන් තුළ වන රංග විධාන මගින් හඬ උස් පහත් කළ යුතු අකාරය, කිසියම් රූපණයක් ඉදිරිපත් කරන අතර සංවාද භාවිත කරන ආකාරය ද, ආලෝක රටා හා සම්බන්ධවන අකාරය ද සිහිපත් කරනු ලබන බවත්.
  වාචික අභිනය යොදාගැනීමේ දී ගීත, කවි හා සින්දු ද නාට්‍යයේ අවස්ථා තීව්‍ර කරනු පිණිස යොදාගැනෙන බව ද පහදන්න.

පියවර 3
- වරහන් තුළ යොදා ඇති රංග විධාන පිළිබඳ ව අවධානය යොමු කරවන්න. අංග චලන වඩාත් අර්ථවත් වන්නේ ආංගික අභිනයෙන්

බව පැහැදිලි කරන්න. ආංගික අභිනයේ දී ශරීරය අංග, ප්‍රත්‍යංග, උපාංග යනාදී වශයෙන් ප්‍රභේද වන බව පවසමින් නළු -නිළියන් රූපණයේ යෙදෙන අවස්ථා සහිත ඡායාරූප පෙන්වන්න. සිසුන් විසින් රචනය කරන ලද නාට්‍ය පෙළට අදාළ ව රූපණය කෙසේ සකස් විය යුතු දැ යි අධ්‍යයනය කිරීමට ද පොළඹවන්න.

පියවර 4

- භාවාත්මක හැඟීම් ප්‍රකාශිත මුහුණු සහිත වේදිකා නාට්‍ය පින්තූර/ ඡායාරූප පෙන්වමින් ප්‍රකාශිත භාවය හඳුනා ගැනීමට අවකාශ සලසන්න.
  තමන්ට හිමි නාට්‍ය පිටපතට අදාළ ව ඒ ඒ භූමිකා අර්ථවත් ලෙස රූපණය කළ යුතු ආකාරය කෙසේ විය යුතු දැ යි හඳුනා ගැනීමට සහාය වන්න. 07වන ශ්‍රේණියේ දී ඉගෙන ගත් සාත්ත්වික අභිනය පාඩම නැවත සිහිගන්වන්න.
  (07වන ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය-පිටු අංක 13)

පියවර 5

- නාට්‍යෝපකරණ, පසුතල, වේෂභූෂණ සහිත පින්තූර පෙන්වමින් ඒවායෙහි දැකිය හැකි ආහාර්ය අභිනය අංග කෙරෙහි අවධානය යොමු කරන්න. නළුවාගේ රංග කාර්යය වඩා සාර්ථක වීම සඳහා පිටතින් ලබාගන්නා සහාය කලාංග පිළිබඳ ව සිසු අදහස් ඉදිරිපත් කිරීමට අවකාශය සලසන්න.

  මෙහිදී වේෂ-භූෂණ, නාට්‍යෝපකරණ සහ අංග රචනය කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු බව ද, රංගාලෝකය, සංගීතය, වේදිකා, තිර යන අංශ කෙරෙහි ද අවධානය යොමු කළ යුතු වේ.

පියවර 6

- කණ්ඩායම්වලට පවරනු ලබන නාට්‍ය පිටපතට අදාළ ව වේෂභූෂණ, නාට්‍යෝපකරණ, අංගරචනය හා පසුතල නිර්මාණය සඳහා සැලසුම් සකස් කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

1. නාට්‍ය පෙළක සංවාද භාවිතයෙහි වැදගත්කම සාකච්ඡා කිරීම
2. ආංගික අභිනය භාවරූපී ලෙස නිරූපණය කළ යුතු ආකාරය විස්තර කිරීම
3. නාට්‍යෝපකරණ සැලැසුම් කිරීම
4. පිටපතට අදාළ ව වේෂභූෂණ සැලැසුම් කිරීම
5. අදාළ චරිතවලට අංගරචනය සැලැසුම් කිරීම

පසු සටහන :-

**අංග** - හිස, අත්, පපුව, උකුළ, දෙපාර්ශ්වය, පාද
**ප්‍රත්‍යංග** - බෙල්ල, උරහිස, බාහු, මැණික්කටුව, වළලුකර, වැලමිට, කලවා, දණහිස
**උපාංග** - ඇස්, ඇස් පිහාටු, ඇස්බෝල, ඇහිබැම, කම්මුල, නාසය, හක්ක, දත්, දිව, නිකට, උඩුතොල, යටිතොල

**නිපුණතාව 2.0 ඃ ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.**

**නිපුණතා මට්ටම 2.1 ඃ තේමාවක් අරමුණු කොටගෙන කතාවක් ගොඩ නගයි.**

**ක්‍රියාකාරකම 2.1.1 ඃ ''තේමාවක් මත ගොතමු කතාවක්'**

**කාලච්ඡේද සංඛ්‍යාව** ඃ 02

**ඉගැනුම් පල** ඃ
- සිද්ධි පෙළගැස්වීමෙන් ගොඩනැගෙන කතාවක් යම් තේමාවක් පදනම් කොටගෙන නිර්මාණය වන ආකාරය අත්දැකීමෙන් අවබෝධ කරගනී.
- විවිධ කතාවලින් විවිධ තේමාවන් ඉස්මතු වන බව පෙන්වා දෙයි.
- සාමූහිකව කතා නිර්මාණයට පෙළඹෙයි.
- ගුරුභවතුන් විසින් දෙනු ලබන තේමාවකට අනුව කතාවක් ගොඩ නගයි.
- නිර්මාණ කුශලතා සංවර්ධනය කරගනී.

**ගුණාත්මක යෙදවුම්** ඃ
- විවිධ තේමා අනුව නිර්මාණය වූ කතා පිටපත්
- විවිධ කතා ඇතුළත් පොත්පත්
- විවිධ කතා ඇතුළත් ශ්‍රව්‍ය පට/ දෘශ්‍ය පට
- කතා කියන්නට දක්ස පුද්ගල සම්පත්
- විවිධ වර්ගයේ කතා (ඓතිහාසික කතා, ජනකතා/ ජාතක කතා, සුරාංගනා කතා/...)

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

පියවර 1 ඃ ශිෂ්‍යයන් විසින් මින් පෙර අසන ලද හෝ කියවා ඇති කතා පිළිබඳ විමසීමක් කරන්න.

උදාඃ- ජනකතා, ඓතිහාසික කතා, අද්භූත කථා/විස්මය දනවන කතා/සුරාංගනා කතා හාස්‍යෝත්පාදක කතා

- අන්දරේගේ කතා - හාස්‍යොත්පාදක
- ගමරාළ ගේ කතා - ජනකතා
- දුටුගැමුණු රජුගේ ජීවන චරිතය ඇසුරු කරගත් කතා - ඓතිහාසික
- බෝංචි වැලේ කතාව - අද්භූත කතා /සුරාංගනා කතා

* ගුණාත්මක යෙදවුම් ද ආශ්‍රය කොටගෙන ශිෂ්‍යයන්ට විවිධ කතා ශ්‍රවණයට හෝ කියැවීමට ඉඩ ලබාදෙන්න.
* ඉන්පසු එම කතාවලින් කුමන හෝ තේමාවක් විද්‍යාමාන වන බව පෙන්වාදෙන්න.
* කතාවේ තේමාව ජීවිතයට අරුත්බර අත්දැකීමක් වන බව සාකච්ඡා කරන්න.
* විවිධ තේමා යටතේ විවිධ කතා නිර්මාණය කළ හැකි බව පෙන්වා දෙන්න.

පියවර 2 ඃ
- පන්තියේ ශිෂ්‍ය පිරිස කණ්ඩායම් කීපයකට වෙන් කරන්න.
- එක් එක් කණ්ඩායම සඳහා ගුරු භවතා විවිධ තේමාවන් ලබාදෙන්න.
- පූර්ව අත්දැකීම් හෝ ඇසූ පිරූ තැන් ඇසුරෙන් දෙන ලද තේමාව ඉස්මතු වන පරිදි කතාවක් ලිවීමට අවස්ථාව ලබාදෙන්න.
- කතාව නිර්මාණය කිරිමේදී අවස්ථා හා සිද්ධි නිර්මාණාත්මක ව ගැළපිය යුතු බව උදාහරණ මගින් පෙන්වා දෙමින් උපදෙස් දෙන්න
- කතාවල එන බොහෝ අවස්ථා හා සිද්ධි තුළ නාට්‍යෝචිත ලක්ෂණ ඇති බව පෙන්වා දෙන්න.

පියවර 3 ඃ
- ගුරුවරයා විසින් දෙන ලද තේමාවට අනුව නිර්මාණය කරන ලද කතා කණ්ඩායම් වශයෙන් කියවීමට අවස්ථාව ලබාදෙන්න.

- එක් එක් කණ්ඩායම ලියන ලද කතාවලින් ඉස්මතු වන තේමා පිළිබඳ සාකච්ඡා කරන්න.
- තේමාවට අනුව කතාවක් ලිවීමේදී එහි අවස්ථා හා සිද්ධි තේමාව ඉස්මතුවන සේ යොදාගැනීම කතාවේ සාර්ථකත්වයට හේතුවන බව පැහැදිලි කරන්න.
- එම අවස්ථා හා සිද්ධි නාට්‍යානුසාරයෙන් රඟදැක්වීමට හැකියාව ඇති බව පෙන්වා දෙන්න.
- සිසුන් විසින් නිර්මාණය කරන ලද කතාවල සාර්ථක අසාර්ථක තැන් විමසා ඒවා නැවත නිවැරදි කරගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදෙන්න.
- සියලු කතාවල තේමාවන් විග්‍රහ කළ පසු ඒ ඒ කතාවලින් ඉස්මතුවන තේමාවන් පෙළගස්වන්න.
- එම තේමාවන් ඉස්මතුවන වෙනත් කතා පිළිබඳ සොයාබැලීමට උපදෙස් දෙන්න.

**ඇගයීම සහ තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

01. විවිධ කතා ශ්‍රවණය කිරීමට හෝ කියවීමට හැකියාව ලැබීම
02. එම කතා විවිධ වර්ගවලට අයත්වන බව තෝරාබේරා ප්‍රකාශ කිරීමේ කුශලතාව ලැබීම
03. විවිධ කතා විවිධ තේමාවන් යටතේ ලියැවී ඇති ආකාරය ලියා පෙළ ගැස්වීම
04. විවිධ තේමාවන් යටතේ කතා ගොඩ නැංවීම
05. විවිධ තේමා යටතේ ලියවුණු කතාවල එන නාට්‍යෝචිත අවස්ථා හා සිද්ධි රංගනයෙන් ඉදිරිපත් කරන්න.

පැවරුම ඃ- පහත දැක්වෙන තේමාවන් ඇසුරුකොටගෙන කතා ගොඩනගන්න.

1. වෛරයෙන් වෛරය නොසන්සිඳෙන බව
11. ඉවසීමෙන් සැනසීම ලැබෙන බව
111. හිටියොත් හොඳට හැදී දෙවියොත් නමට වදී
1v. කළකම් පල දේ.

**අතිරේක උදව්**

1. පුස්තකාලය පරිහරණයෙන් කතා කියැවීමට ඉඩ ලබාදීම
2. පොත් ප්‍රදර්ශනය නරඹා කතා පොත් තෝරා ගැනීමට ඉඩ ලබාදීම හා කියවීමට අවස්ථාව ලබාදීම
3. දුර්ලභ ගණයේ කතාන්දර පොත් සොයා කියැවීමට සැලැස්වීම

නිපුණතාව 2.0 ඃ ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

නිපුණතා මට්ටම 2.2 ඃ සාමූහික ව නාට්‍ය පෙළක් රචනා කිරීම

ක්‍රියාකාරකම 2.2.1 ඃ ''පෙළ රචනාවට එකවෙමු හැමදෙන''

කාලච්ඡේද සංඛ්‍යාව ඃ 02

ඉගෙනුම් පල ඃ
- කතාවක් හා නාට්‍යයක් අතර වෙනස කුමක්දැයි සාකච්ඡා කරයි.
- කතාවක් නාට්‍යයක් බවට පත්කිරීමේදී අවධානය යොමු කළ යුතු කරුණු පිළිබඳ ව විමසයි
- කතාවක් නාට්‍යයක් බවට පත්කිරීමේදී සිද්ධි හා චරිතවල වැදගත්කම පිළිබඳව සාකච්ඡා කරයි.
- කතාවක ඇති නාට්‍යෝචිත ලක්ෂණ පෙන්වා දෙයි.
- ඒ අනුව නාට්‍ය පෙළක් රචනා කරයි.

ගුණාත්මක යෙදවුම් ඃ
* 2.1 පාඩමේ දී රචනා කරන ලද කතාන්දර කීපයක පිටපත් කිහිපයක්.
* නාට්‍ය කීපයක දෘශ්‍ය පට කීපයක් (CD/DVD)

ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ

පියවර 01 ඃ
- ශිෂ්‍යයන් විසින් 2.1 නිපුණතාව යටතේ ලියන ලද කතා, ශිෂ්‍යයන් කණ්ඩායම් කර එක් කණ්ඩායමකට එක බැගින් ලබාදෙන්න.
- මෙම කතාවලින් නාට්‍ය පිටපත් රචනා කළ හැකි බව පෙන්වා දෙන්න. අවස්ථාවක් තිබේනම් කතාවක් ඇසුරෙන් නිර්මාණය කරන ලද නාට්‍යයක් නැරඹීමට අවස්ථාව ලබාදෙන්න.
- එම අත්දැකීමක් සම්බන්ධ කොටගෙන කතාවක් නාට්‍යයක් බවට පත් කිරීමේ දී සැලකිය යුතු කරුණු රැසක් ඇති බව සාකච්ඡා කරන්න.
- කතාවක මුල මැද අග ගැළපීම් සියල්ල නාට්‍යයකට ඇතුළත් නොකරන බවත් අවස්ථා හා සිද්ධි නාට්‍යෝචිතව ගළපා නාට්‍යය ගොඩනගන බවත් සාකච්ඡා කරන්න.
- කතාවේ තේමාව නාට්‍ය පෙළින් ද විද්‍යාමාන විය යුතු බව පැහැදිලි කරන්න.
- කතාවේ සිදු වන ඇතැම් ක්‍රියාවන් හා චරිතයන් හි සුවිශේෂ හැසිරීම් ආදිය නාට්‍යයේ රංග විධාන ලෙසට ඇතුළත් කළ හැකි බව පෙන්වා දෙන්න. ආත්මභාෂණ නළු නිළියන්ගේ සුවිශේෂ හැසිරීම ප්‍රේක්ෂකයාට පමණක් දැන්විය යුතු දේ...ආදි)
- නාට්‍ය පෙළ රචනයේ දී කතාවේ මෙන් මුල, මැද, ගළපා සිද්ධිමාලාව ඇතුළත් නොකර මාධ්‍ය රචකයාට අවශ්‍ය පරිදි එය වෙනස් ආකාරයකට වුවද යොදා ගත හැකි බව

උදා ඃ- අග, මුල, මැද - මැද, අග, මුල හෝ ඊට වෙනස් ආකාරයකට කතාවේ සිද්ධි මාලාව නාට්‍යයක් බවට පත්කිරීමේ දී ගැළපෙන පරිදි සංවාද එකතු කර ගතයුතු බව පෙන්වා දෙන්න.
- නාට්‍යයට ගැළපෙන පරිදි කතාවේ ඇතුළත් චරිත හසුරුවා ගැනීම පෙළ රචකයා විසින් කළ යුතු බව සාකච්ඡා කරන්න.

පියවර 2 ඃ
- සිසුන් කණ්ඩායම් කරන්න
- එක් කණ්ඩායමකට එක බැගින් කතා පිටපත් ලබාදෙන්න.
- කතා පිටපත් නාට්‍ය පෙළක් බවට පත්කිරීමේ දී පියවර 01 දී දුන් උපදෙස් අනුව කටයුතු කරන ලෙස උපදෙස් දෙන්න.
- සියලු ම කණ්ඩායම්වලට නාට්‍ය පෙළ බැගින් රචනා කිරීමට අවශ්‍ය කාලය ලබාදෙන්න.

පියවර 03 :

- සියලුම කණ්ඩායම් නාට්‍ය පෙළ බැගින් රචනා කළපසු එක් එක් නාට්‍ය පෙළ සාකච්ඡාවට ලක් කරන්න.
- ඒවායේ සිද්ධි හා අවස්ථා කොතෙක් දුරට නාට්‍යෝචිත ලෙස ගළපා ඇත් ද යි ශිෂ්‍යයින් සමග සාකච්ඡා කරන්න.
- කතාවට වඩා නාට්‍යයේ ඇති වෙනස කොතෙක් දුරට සිසුහු අවබෝධ කරගෙන ඇත්ද යන්න ඇගයීමට ලක්කරන්න.
- නාට්‍යයක ගැටුම නාට්‍යයේ ප්‍රබල අංගයක් වන බැවින් නාට්‍ය පෙළෙහි ගැටුම කෙතරම් දුරට දක්වා ඇත්ද යන්න විමසා බලන්න.
- නාට්‍ය පෙළ කියැවීමේ දී තේමාව ඉස්මතු විය යුතු බැවින් ඒ පිළිබඳව ද සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- වඩාත් සාර්ථක පෙළ රචනය ඉදිරිපත් කළේ කුමන කණ්ඩායම ද යන්න ඇගැයීමට ලක් කරන්න.

**ඇගයීම සහ තකසේරුකරණය සඳහා උපදෙස් :**

1. කතාවක් නාට්‍ය පෙළක් බවට පත් කිරිමේදී කළ යුතු වෙනස්කම් තෝරා-බේරාගැනීම
2. කතාවේ එන චරිත සඳහා සුදුසු සංවාද ගොඩනැගීම
3. කතාවේ පිළිවෙළට ගොනු වී ඇති මුල, මැද, අග යන අවස්ථා නාට්‍ය පෙළ රචනයේදී පෙළ රචකයාට රිසි පරිදි වෙනස් කිරිම.
4. කතාවේ එන සිද්ධි සහ අවස්ථා නාට්‍යෝචිත පරිදි ගැළැපීමේ කුශලතාව ලබාගැනීම
5. කතාවේ හරය, තේමාව හා නාට්‍යයේ ගැටුම මැනැවින් නිරූපනය වන පරිදි නාට්‍ය පෙළක් රචනා කිරිම

**පැවරුම :**

පහත දැක්වෙන කතා උපයෝගී කොටගෙන නාට්‍ය පෙළක් රචනා කරන්න.

1. ජාතක කතාවක් (නාට්‍යයකට වඩාත් ගැළැපෙන)
2. හීන්සැරය වැනි මුනිදාස කුමාරතුග මහතාගේ ළමා නවකතාවක්
3. රජ කෙනෙකුගේ චරිතය අළලා ලියැවුණු ඓතිහාසික නවකතාවක්
4. අන්දරේ ගේ කතා වැනි හාස්‍යොත්පාදක කතාවක්

**අතිරේක උදව් :**

* ශිෂ්‍යයින් අතර ඇති කතා පොත් හුවමාරු කොට කියවීමට සැලැස්වීම
* කතන්දර දන්නා අයගෙන් අසා දැනගැනීමට සැලැස්වීම
* පුස්තකාලය පරිහරණයට ඉඩදීම
* නාට්‍ය නැරඹීමට අවස්ථාව ලබාදීම

**නිපුණතාව 2.0** : **ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කරගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.**

**නිපුණතා මට්ටම 2.3** : **නාට්‍ය පෙළ සංවර්ධනය කරයි.**

**ක්‍රියාකාරකම 2.3.1** : **''ලියූ පෙළ ඔපදමා හැඩ කරමු''**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- ලියන ලද නාට්‍ය පෙළෙහි සංවර්ධනය විය යුතු තැන් පිරික්සා බලයි.
- නාට්‍යෝචිත අවස්ථා ගැළපෙන පරිදි සකසයි.
- චරිතවල හැසිරීම සංවාද මගින් ඔප කරයි.
- අවස්ථා හා සිද්ධි මැනැවින් ගළපා නාට්‍යෝචිත බව තහවුරු කරයි. රංගයකට වඩාත් සුදුසු පරිදි ගැටුම් අවස්ථා මතුකරමින් රංග විධාන ආදිය යොදා ලියූ පෙළ ඔප කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- සිසුන් විසින් ලියන ලද නාට්‍ය පෙළ කීපයක්
- නාට්‍ය කීපයක සාර්ථක පෙළ රචනා කීපයක්
- නාට්‍යවල දෘශ්‍ය පට කීපයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 1** :
- ලියන ලද නාට්‍ය පෙළ කීපයක් සිසුන් කණ්ඩායම් කර සිසුන් අතර බෙදාදෙන්න.
- ඒවා හොඳින් කියවා ගැනීමට අවස්ථාව ලබාදෙන්න.
- එම නාට්‍යවල තේමාව පිළිබඳ විමසා තේමාව උද්දීපනය වන සේ යොදාගත් චරිත හා සිදුවීම් ඒ හා සම්බන්ධ අවස්ථා පිළිබඳ සිසුන් හා සාකච්ඡා කරන්න.
- ඒ එක් එක් පිටපතෙහි දක්වෙන නාට්‍යයේ කතා වස්තුවට අදාළ චරිත ගොඩනංවා ඇති ආකාරය ඒවාට යොදා ගත් සංවාද ආදියෙහි ගැළැපීම් නොගැළැපීම්, නාට්‍යෝචිත අවස්ථාවන් හි ඇති අවස්ථෝචිත බව ආදිය පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- සිසුන් විසින් රචනා කරන ලද නාට්‍ය පෙළෙහි කොතෙක් දුරට පහත දක්වෙන කරුණු සාර්ථකව යොදාගෙන තිබේ ද? ඒවා සාර්ථක වන්නේ කුමන හේතු මත ද? අසාර්ථක නම් එයට හේතු මොනවා ද යන්න පැහැදිලි කරන්න.
    1. නාට්‍යයේ තේමාව
    2. චරිත ගැළැපීම
    3. යොදාගත් සංවාද හා භාෂාව
    4. අවස්ථා හා සිද්ධි
    5. ඒවායේ නාට්‍යෝචිත බව
    6. නාට්‍යයේ ගැටුම

**පියවර 2** :
- ඉහත පියවර 01 දී සාකච්ඡා කරන ලද කරුණු කෙතෙක් දුරට තමන් ගේ කණ්ඩායමේ සාකච්ඡාවට බඳුන් වූ නාට්‍යපෙළෙහි දක්නට ලැබේ ද යන්න කන්ඩායම තුළ සිටින සිසුන්ට සාකච්ඡා කිරීමට කාලයක් ලබාදෙන්න.
- ඉන්පසු එම නාට්‍ය පෙළෙහි අසාර්ථක තැන් නිවැරදි කර නැවත ගොඩනැගීමට අවස්ථාව ලබාදෙන්න.
- එසේ ගොඩනගා ගත් නාට්‍ය පෙළ ඇගැයීමට ලක්කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

1. නාට්‍ය පෙළක් සාර්ථක ව රචනා කිරිමේ දී රචකයා ගේ පරිකල්පන ශක්තිය පෙළ සාර්ථක වීමට ප්‍රබල ලෙස බලපාන බව පෙන්වා දීම
2. නාට්‍යයක තිබිය යුතු අත්‍යවශ්‍ය අංගයක් වන ගැටුම නාට්‍ය පෙළ තුළින් ඉස්මතු විය යුතු බව දැක්වීම
3. පෙළ කියවීමේදී වඩාත් සාර්ථක නාට්‍යෝචිත අවස්ථා සහෘදය සිත් තුළ චිත්තරූප නැංවිය හැකි වීම
4. චරිත හා ඒවා භාවිත කරන සංවාද උචිත ලෙස භාවිත කිරිම සාර්ථක නාට්‍ය පෙළ රචනයක දැකිය හැකි සුවිශේෂ ලක්ෂණයක් වීම
5. වඩාත් සාර්ථක නාට්‍ය පෙළක් ඉහත කී සියලු ලක්ෂණවලින් අනූන වීම

**පැවරුම ඃ**

1. තෝරාගත් කතාවක් ආශ්‍රයෙන් නාට්‍ය පෙළක් රචනා කරන්න.
11. එම පෙළ රචනයේදී අත්‍යවශ්‍ය අංග ඊට ඇතුළත් කරන්න. (ගැටුම, සංවාද, තේමාව, නාට්‍යෝචිත අවස්ථා)
111. කණ්ඩායම් වශයෙන් එක් ව එහි සාර්ථක අසාර්ථක ලක්ෂණ සොයා පෙළගස්වන්න.

**අතිරේක උදව් ඃ**

- වඩාත් සාර්ථක නාට්‍ය කීපයක පෙළ කියවීමට සැලැස්වීම
- ඒවායේ සාර්ථක ලක්ෂණ අධ්‍යයනයට ඉඩදීම හා ඒවා පෙළගැස්වීම
- නාට්‍ය දර්ශන නැරඹීමට අවස්ථාවක් ලබාදීම
- සාර්ථක නාට්‍ය පෙළ කීපයක නාට්‍යෝචිත අවස්ථා කීපයක් රූපණයෙන් ඉදිරිපත් කිරීම

**නිපුණතාව 2.0 ඃ ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.**

**නිපුණතා මට්ටම 2.4 ඃ චරිත අභ්‍යන්තරය ඉස්මතුවන සේ රූපණයේ යෙදෙයි.**

**ක්‍රියාකාරකම 2.4.1** ඃ චරිතයට ඔබිනා නළුවන් තෝරමු

**කාලච්ඡේද සංඛ්‍යාව** ඃ 02යි

**ඉගැනුම් පල** ඃ

- නාට්‍ය පෙළට අදාළ චරිත තෝරාගනී,
- චරිතවලට ගැළපෙන නළුවන් තේරාගනී.
- ඒ ඒ චරිතවල චරිත ලක්ෂණ පිළිබඳ විමසයි.
- එක් එක් චරිතවල වෙනස හඳුනාගනී.
- චරිතවල අභ්‍යන්තර හා බාහිර ලක්ෂණ විමසමින් ගැළපෙන නළුවන් තෝරාගනියි.

**ගුණාත්මක යෙදවුම්** ඃ

- විවිධ නාට්‍යවල විවිධ චරිතවල ස්වභාවයන් දක්වෙන පින්තූර කාඩ්පත් කීපයක්
- විවිධ නාට්‍ය කීපයක දෘශ්‍ය පට කීපයක් (CD/DVD)

**ක්‍රියාකාරකම සැලැසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

**පියවර 1** ඃ

- ළමුන් විසින් රචනා කරන ලද සාර්ථක යැයි තෝරාගත් නාට්‍ය පිටපත් කීපයක්, සිසුන් කණ්ඩායම් කර කණ්ඩායම් අතර බෙදාදෙන්න.
- එම නාට්‍ය පෙළෙහි ඇති චරිත පිළිබඳ ව කණ්ඩායම්වල සියලු ශිෂ්‍යයින්ට සාකච්ඡා කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- ඒ ඒ චරිතවල අභ්‍යන්තර හා බාහිර ලක්ෂණ පිළිබඳ ව විමසන්න.
- එක් එක් කණ්ඩායම්වල නාට්‍ය පෙළහි ඇති චරිත විවිධ බැවින් ඒ ඒ චරිතවල විවිධත්වයන් හඳුන්වා දෙන්න.

**පියවර 2** ඃ

- මූලික කරුණු සාකච්ඡා කිරිමෙන් පසු එක් එක් කණ්ඩායම්වල සිසුන්ට තම නාට්‍ය පෙළෙහි චරිතවලට ගැළපෙන නළු නිළියන් තෝරාගැනීමට අවස්ථාව ලබාදෙන්න.
- එම නළුනිළියන් තෝරා ගැනීමේ දි (නළුවරණය) චරිතයේ බාහිර ලක්ෂණ නිරූපණය කිරීම සඳහා නළුවාගේ ගැළපීම ද අවශ්‍ය බව සිසුනට පෙන්වා දෙන්න.
- කණ්ඩායමේ සියලු ම ළමුන් ලවා නාට්‍ය පෙළෙහි නාට්‍යෝචිත අවස්ථා එකක් හෝ කීපයක් රඟදක්වා චරිතවලට වඩාත් ගැළපෙන නළු නිළියන් තෝරාගැනීමට අවස්ථාව ලබාදෙන්න.
- නාට්‍යයේ සෑම චරිතයක් ම එකිනෙකට අන්තර් සම්බන්ධතාවන් පවතින බැවින් ඒ ඒ එක් එක් චරිත සඳහා වඩාත් සුදුස්සන් තෝරා ගැනීම නාට්‍යයේ ගුණාත්මක බව වැඩිවීම කෙරෙහි බලපාන බව පෙන්වා දෙන්න.
- සිසුන් තෝරාගත් නළු නිළියන් ගේ ගැළපීම් නොගැලපීම් පිළිබඳ විමසා බලා එම තෝරා ගැනීම් නාට්‍ය පෙළ හා කතා වස්තුවට කොතරම් දුරට උචිත ද යන්න සාකච්ඡාවට ලක්කරන්න.
  තෝරාගත් නළු නිළියන් යොදාගෙන නාට්‍ය රඟදැක්වීමට අවස්ථාවක් ඉදිරි කාලඡේදවලදී ලබාදෙන්න.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

1. රචනා කරන ලද නාට්‍ය පෙළට අදාළ චරිත තෝරා ගැනීම
2. චරිතවල අභ්‍යන්තර හා බාහිර ලක්ෂණ පෙන්වා දීම
3. නළුවරණය, චරිතවලට ගැළපෙන අයුරින් සිදු කිරීම
4. නාට්‍යයේ ගුණාත්මක බව කෙරෙහි නළුවරණය වඩාත් වැදගත් වීම
5. එක් එක් චරිත විවිධාකාර බැවින් නළු-නිළියන් මගින් විවිධත්වය මතු කිරීම අත්‍යවශ්‍ය බව

පැවරුම ඃ

1. පන්තියේ කණ්ඩායම් කරන ලද සිසුන් අතැති නාට්‍ය පෙළ රූපණය සඳහා තෝරා ගත් නළු-නිළියන්ට යොමුකරන්න.
2. ඒ සඳහා පුහුණු කිරීමට කාලය ලබාදෙන්න.

**අතිරේක උදව් ඃ**

- රූපණය සඳහා සිසුන් පුහුණු වීමේ දී ප්‍රවීණ රංගන ශිල්පීන්ගේ සහාය ලබාදීම
- විවිධ නාට්‍ය නැරඹීමට අවස්ථාව ලබාදීම
- නාට්‍ය දෘශ්‍ය පට නැරඹීමට ඉඩ ලබාදීම

**නිපුණතාව 2.0** ඃ **ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.**

**නිපුණතා මට්ටම 2.4** ඃ **චරිත අභ්‍යන්තරය ඉස්මතු වන සේ රූපණයේ යෙදෙයි.**

**ක්‍රියාකාරකම 2.4.2** ඃ ''තේරුණු නළුවන් සමඟින් පෙළ රූපණයෙන් සරසමු''

**කාලච්ඡේද සංඛ්‍යාව** ඃ 02යි

**ඉගෙනුම් පල** ඃ

- රූපණය යන්න ක්‍රියාකාරකම් තුළින් අධ්‍යයනය කරයි.
- රූපණයේ දී චරිතවල විවිධත්වයන් හඳුනා ගනී.
- නාට්‍ය පෙළ, රූපණය තුළින් පණ ගැන්වෙන ආකාරය අත්දැකීමට හසු කරගනී.
- නාට්‍ය පෙළට අදාළ චරිත නිරූපණයට අවශ්‍ය රූපණය උචිත පුහුණුවීම් ලබයි.
- රූපණයේ දී සතර අභිනයන් උචිත පරිදි යොදාගනී.

ගුණාත්මක යෙදවුම්

- සිසුන් විසින් සාර්ථකව ලියන ලද නාට්‍ය පෙළ කීපයක්
- කුශලතා පූර්ණ රංගන ශිල්පීහු
- වෙනත් ආනුෂංගික ශිල්පීන් හෝ එයට අදාළ වෙනත් ද්‍රව්‍ය හෝ උපකරණ
- සාර්ථක නාට්‍යවල සාර්ථක රංගනයන්හි දර්ශන ඇතුළත් දෘශ්‍ය පට කීපයක්

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

පියවර 1 ඃ

- පාඩමට අනුව නළුවරණයෙන් පසු පෙළ රූපණය සඳහා එක් එක් ශිෂ්‍ය කණ්ඩායම්වලට පන්ති කාමරයේ ඉඩකඩ ලබාදෙන්න.
- එක් කණ්ඩායමක රූපණ කුශලතා අනෙක් කණ්ඩාටයම් වලට නැරඹීමට අවස්ථාව ලබාදෙන්න.
- රූපණයේ දී ප්‍රේක්ෂක අවධානය දිනා ගැනීම සඳහා සාර්ථක රංගනයක් ඉදිරිපත් කළ යුතු බව පෙන්වා දෙන්න.
- මේ සඳහා අභිනය නිසිලෙස භාවිත කළ යුතු බව අවධාරණය කරන්න.
- චරිතවල මුහුණ, අතපය ආදි ශරීරාංග උපයෝගි කරගැනීම, සංවාද භාවිතය, හැඟීම් ප්‍රකාශ කිරීම, රූපණයේ දී ඉතා වැදගත් බව පෙන්වා දෙන්න.

පියවර 2

- කණ්ඩායම බැගින් තමා තෝරාගත් නාට්‍ය පෙළට අදාළ රූපණයන් ඉදිරිපත් කර අවසන් වූ පසු පහත දැක්වෙන කරුණු පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- නාට්‍ය පුහුණුව සංවිධානය කිරීම සඳහා නායකත්වය ගත යුතු අයෙකු සිටිය යුතු යි. (නිෂ්පාදක)
- කාර්ය පහසුව සඳහා අවශ්‍ය වූ විට සහාය නිෂ්පාදකයකු යොදාගත හැකි වේ.
- ප්‍රධාන චරිත හැරුණුවිට සෙසු චරිත ද රූපණයේදී වැදගත් වේ.
- සතර අභිනය සුදුසු පරිදි රූපණය සඳහා යොදා ගත හැකි ය.
- නාට්‍ය පුහුණු ව සඳහා කාලසටහනක් සකසාගත යුතු ය.
- සතත අභ්‍යාසය රූපණය සාර්ථක ව ඉදිරිපත් කිරීමට හේතු කාරක වේ.

- පුහුණුවීම් කටයුතු සංවිධානාත්මක ව කළ යුතු දෙයකි. ඒ සඳහා කාල කළමනාකරණය වැදගත් වේ.
- නාට්‍ය පෙළට අදාළ ව රූපණය ඉදිරිපත් කිරීමේදී චරිතවල අභ්‍යන්තර හා බාහිර ලක්ෂණ පිළිබඳ මනා අවබෝධයක් තිබිය යුතු වේ.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

- චරිතවල ඇති විවිධ ලක්ෂණ විමැසීම
- එම ලක්ෂණ හඳුනාගෙන නළුවන් රූපණයේ යෙදීම
- සතර අභිනය රූපණය සඳහා උපයෝගීකොට ගැනීම
- නාට්‍ය පෙළෙහි ඇතුළත් අවස්ථා හා සිද්ධිවලට අදාළ රූපණයන් සංවිධානයකොට ගැනීම
- පුහුණුවීම් හා කාලකළමනාකරණය මගින් සාර්ථක රූපණයක් ප්‍රේක්ෂකයා හමුවේ තැබීම
- සාමූහිකත්වය තුළින් සාර්ථකත්වය කරා එළැඹීම

**පැවරුම ඃ** 1. සිසුන් තෝරාගත් නාට්‍ය පෙළ, තෝරාගත් නළුවන් යොදා රඟදැක්වීමට අවස්ථාව ලබාදෙන්න.
2. විද්‍යාලයේ නාට්‍ය හා රංගකලාව හදාරන සෙසු සිසුන්ට එය නැරඹීමට අවස්ථාවක් ලබාදෙන්න.
3. විනිශ්චය මණ්ඩලයක් මගින් වඩාත් සාර්ථක රූපණ කුශලතා පෙන්වූ නාට්‍ය තෝරාගන්න.

**අතිරේක උදව් ඃ**

1. ප්‍රවීණ රංගන ශිල්පීන්ගෙන් උපදෙස් ලබාදීම
2. වඩාත් සාර්ථක වේදිකා නාට්‍ය නැරඹීමට අවස්ථාව ලබා දීම මගින් අත්දැකීම පුළුල් කිරීම
3. රංග අභ්‍යාස හා රංග ක්‍රීඩා මගින් කුශලතා සංවර්ධනය කිරීම

**නිපුණතාව 2.0** ඃ **ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.**

**නිපුණතා මට්ටම 2.5** ඃ **පරිකල්පනය වර්ධනය වන ක්‍රියාකාරකම් හි යෙදෙයි.**

**ක්‍රියාකාරකම 2.5.1** ඃ **තේමාවක් ඔස්සේ පරිකල්පනය මෙහෙයවමු' (සාමූහික හා කේවල)**

**කාලච්ඡේද සංඛ්‍යාව** ඃ 02

**ඉගෙනුම් පල** ඃ

- පරිකල්පනය යනු කුමක් ද යන්න අර්ථකථනය කරගනී.
- යම් තේමාවක් ඔස්සේ පරිකල්පනය මෙහෙයවීමට උත්සාහ දරයි.
- කුඩා අත්දැකීමක් හෝ සිදුවීමක් හෝ කිසියම් වස්තුවක් ඔස්සේ පරිකල්පනය මෙහෙයවයි.
- පරිකල්පනය තුළින් නිර්මාණාත්මක චින්තනය වර්ධනය කරගනී. නාට්‍යයක් හෝ නාට්‍යමය අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා පරිකල්පනය උපයෝගී කරගනී.

**ගුණාත්මක යෙදවුම්** ඃ පහත සඳහන් දර්ශන ඇතුළත් පින්තූර කීපයක් සපයා ගන්න.

1. ගස් උඩසිටින වඳුරු රංචුවක් ඉන් එක් වඳුරෙක් අනෙක් වඳුරාගේ හිස අතගාමින් සිටී.
2. කොට්ටෝරුවෙක් බෙනයක් හාරමින් සිටී, ඒ ගස් උඩ ගිරව් රංචුවක් ලැග සිටී.
3. බලු පැටවකු පාර හරහා යමින් සිටී, කුඩා දරුවෙක් එදෙස බලා හඬමින් සිටී.
4. ගොයම් ගොඩ ගැසූ කමතක්, ගොවියා අතේ රිටක් වැනි යමක් (දෑති ගොයියාව)
5. කාන්තාවක් අලංකාර රටා දමූ පැදුරක් අතැතිව
6. ගුරුවරයෙක් /ගුරුවරියක් කෝටු කැබැල්ලක් ඇතැතිව (නැතහොත් ගුරුවරයාට අභිමත ඕනෑම පින්තූරයක් හෝ භාණ්ඩයක් හෝ උපකරණයක් මේ සඳහා භාවිත කළ හැකි ය.

උදාහරණ ඃ- පන්කොළ තොප්පියක්, කොළපතක්, කළගෙඩියක්, දූවිලි පිස්නයක්)

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

**පියවර 1** ඃ

- ගුණාත්මක යෙදවුම්වල දී ඇති පින්තූර හෝ භාණ්ඩ හෝ උපකරණ පන්තියේ සියලු ම සිසුන්ට පෙන්වන්න.
- සිසුන් ගේ අභිමතය පරිදි පින්තූර හෝ ද්‍රව්‍ය හෝ උපකරණ එක් අයෙකුට එක බැගින් හෝ කණ්ඩායමක් සකසා කණ්ඩායමට එක බැගින් බෙදාදෙන්න.
- ඉන්පසු තමන්ට හෝ තම කණ්ඩායමට ලැබුණු ගුණාත්මක යෙදවුම අනුව පරිකල්පනය මෙහෙයැවීමට උපදෙස් ලබාදෙන්න.
- පරිකල්පනය යනු පෙනෙන හෝ දකින හෝ අසන දෙයට වඩා වෙනස් අලුතින් යමක් සිතීම බව ශිෂ්‍යයින් සමග සාකච්ඡා කරන්න.
- උදාහරණයක් ලෙස පන්ති කාමරයේ ඇති කොස්ස අතට ගෙන එය වෙනත් දෙයක් ලෙස සිතන්නට හැකිනම් එය පරිකල්පනය බව (අතේ ඇති කිරිකැටි දරුවෙක්)* සිසුන්ට පැහැදිලි කරන්න.
- ගුණාත්මක යෙදවුම් ලෙස සිසුන්ට ලැබී ඇති පින්තූර හෝ උපකරණ ලබා දී ඒ තුළින් රංගන අවස්ථාවක් නිර්මාණය කිරීමට අවස්ථාව ලබාදෙන්න.

**පියවර 2**

- පරිකල්පන නිර්මාණ ගොඩනගා ගැනීමට කාලය ලබාදීමෙන් පසු කේවල හෝ කණ්ඩායම් වශයෙන් පන්තිය ඉදිරියේ තම නිර්මාණ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- කේවල නිර්මාණවල දී තනි පුද්ගලයකු තුළ ඇති පරිකල්පන ශක්තිය විශ්ව සාධාරණ නිර්මාණ බිහිකිරීමෙලා උපයෝගී කරගත හැකි බව පෙන්වා දෙන්න.

- තනි පුද්ගල පරිකල්පන ශක්තීන් රැසක් සාමූහික ව එක්වූවිට වඩාත් උසස් නිර්මාණ බිහි කළ හැකි බව කණ්ඩායම් නිර්මාණ උදාහරණ කරගනිමින් පෙන්වා දෙන්න.
- නාට්‍ය නිර්මාණයේ දී පුද්ගල පරිකල්පනය සාමූහික ව යොදාගත හැකි නිසා ඒ මගින් සමාජයට වැදගත් පණිවිඩයක් ලබාදිය හැකි බව පෙන්වා දෙන්න.
- සිසුන්ගේ කේවල හා සාමූහික පරිකල්පන නාට්‍ය අංග නිර්මාණ සියල්ල සෙසු සිසුන්ට නැරඹීමට අවස්ථාව ලබාදී ඔවුන්ගේ ද අදහස් විමසන්න.
- කේවල, පරිකල්පන නාට්‍ය අවස්ථා නිර්මාණ සෙසු සිසුන්ට පෙන්වා, පන්තියේ සෙසු සිසුන් අතරෙන් ඕනෑ ම අයකුට එම අවස්ථාව ම තම පරිකල්පනය මෙහෙයවා වෙනස් ආකාරයකට නිර්මාණය කළ හැකි බව පෙන්වා දෙන්න.
- ඒ සඳහා සිසුන් කිහිප දෙනකුට අවස්ථෝචිතව අවස්ථාව ලබාදෙන්න.
- එක ම අවස්ථාවක් හෝ එක ම සිද්ධියක් හෝ එක ම උපකරණයක් හෝ එක ම භාණ්ඩයන් හෝ නාට්‍යකරණයේදී පුද්ගල පරිකල්පන ශක්තීන් මත වෙනස් ආකාරයට දැකිය හැකි බව ඉහත අවස්ථාව මගින් ශිෂ්‍යයන්ට පැහැදිලි කරදෙන්න.
- නාට්‍යපෙළ රචනයේ දීත් නාට්‍ය නිෂ්පාදනයේ දීත් රචකයා ගේ හා නිෂ්පාදකයා ගේ පරිකල්පන ශක්තීන් අනුව සම්භාව්‍ය නාට්‍ය නිර්මාණයක් ලොවට දායාද කළ හැකි බව පෙන්වා දෙන්න.

පියවර 3 :
- සිසුන්ගේ සියලු රංගනයන් අවසන් වූ පසු කේවල හා සාමූහික නිර්මාණ සඳහා වූ ගුණාත්මක යෙදවුම් අනෙක් සිසුන්ට හා කණ්ඩායම්වලට අභිමත පරිදි බෙදා ගැනීමට ඉඩ දී පාසල් වේලාවෙන් පසු හෝ නිදහස් කාලච්ඡේදයක දී හෝ පුහුණු වී කලා උළෙළක දී හෝ සාහිත්‍ය සංගමයේ දී හෝ වෙනත් සුවිශේෂ අවස්ථාවක දී පාසලේ සෙසු සිසුන්ට ප්‍රදර්ශනය කිරීම සඳහා පුහුණුවීම් කරන ලෙස උපදෙස් දෙන්න. (මෙහි දී ගුරුවරයා ගේ පූර්ණ අධීක්ෂණය තිබිය යුතු ය.)

**ඇගයීම් හා තක්සේරුකරණ සඳහා උපදෙස් :**

1. පරිකල්පනය පුද්ගල බද්ධ දෙයක්වීම
2. උසස් පරිකල්පනය හා නිර්මාණාත්මක චින්තනය නාට්‍ය කලාවට අත්‍යවශ්‍ය දෙයකි.
3. පරිකල්පනය මගින් සම්භාව්‍ය නර්මාණ බිහි කළ හැකි ය.
4. පෙළ රචනය හා නාට්‍ය නිෂ්පාදනයේ දී පරිකල්පනය අත්‍යවශ්‍ය දෙයක් වේ.
5. උසස් පරිකල්පන ශක්තිය ඇතියවුන්ට ලෝකය වෙනස් අයුරකින් දැකිය හැකි වේ.

පැවරුම :
- විවිධ අවස්ථා, විවිධ ද්‍රව්‍ය, විවිධ පුද්ගලයන් ආශ්‍රයෙන් පරිකල්පනය මෙහෙයවීමට අවස්ථාව ලබාදෙන්න.

අතිරේක උදව් :

* නාට්‍ය නිර්මාණ දර්ශන
* සාහිත්‍යය තුළ පරිකල්පනය මෙහෙය වූ ගීත, කවි කොටස්

| | | |
|---|---|---|
| **නිපුණතාව 2.0** | ඃ | **ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.** |
| **නිපුණතා මට්ටම 2.6** | ඃ | **නිර්මාණාත්මක චින්තනය වර්ධනය වෙයි.** |
| **ක්‍රියාකාරකම 2.6.1** | ඃ | **සිසුන්ට අභිමත කතාවක් තෝරාගනිමු.** |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | ඃ | 01 |

**ඉගෙනුම් පල**

- නාට්‍යයකට උචිත ජනකතාවක්, විවිධ කතාවක් හෝ ස්ව නිර්මාණ කතාවක් තෝරාගෙන සකස් කරයි.
- නාට්‍ය නිර්මාණය සඳහා කතාවේ මුල මැද අග වෙනස් කළ හැකි බව පිළිගනියි.
- එහි හේතුඵල සම්බන්ධයක් තිබිය යුතු බව වටහා ගනියි.
- එහි නාට්‍යෝචිත අවස්ථා ඇති බව වටහා ගනියි.
- නාට්‍යයකට ගැළපෙන ලෙස චරිත හසුරුවා ගතයුතු බව අවබෝධ කරගනියි.
- එහි නාට්‍යමය සංවාද තිබිය යුතු බව පවසයි.

**ගුණාත්මක යෙදවුම්** ඃ

- බ්‍රිස්ටල් බෝඩ්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

**පියවර 1** ඃ

- සිසුන් අතර සාකච්ඡාවකට යොමු කරමින් ගුරු භවතා ජනකතාවක් හෝ වෙනත් කතාවක් තෝරා ගැනීමට ඔවුන් මෙහෙයවයි.
- සිසුන් කණ්ඩායම් කීපයකට බෙදා නාට්‍යයකට උචිත ජනකතාවක්, වෙනත් තෝරාගත් කතාවක් හෝ ස්වනිර්මාණ කතාවක් තෝරාගෙන එය වාචිකව ඉදිරිපත් කරවන්න.

**පියවර 2** ඃ

- එම කණ්ඩායම් මගින් අදාළ කතාව සාකච්ඡා කරමින් නාට්‍යකට උචිත ලෙස එය වෙනස්කර නාට්‍යයක කතා පුවතක් ලෙස සකස් කරවන්න. ගැටුමක් සහිත අවස්ථා පෙළ ගස්වා බ්‍රිස්ටල් බෝඩ්වල ලියවන්න. සිසුන් දැනුවත් කරන්න.

**පියවර 3** ඃ

- විවිධ කණ්ඩායම් මගින් ඉදිරිපත් කරනු ලබන කතා, ගුරු සිසු සාකච්ඡාවට යොමුකොට වඩා සාර්ථක වූ කතාව තෝරාගැනීමට සලස්වන්න. එය තවදුරටත් සාකච්ඡාකොට සාර්ථක ලෙස ලියන්නට සලස්වන්න. කතාවට උචිත චිත්‍රයක් නිර්මාණය කරන්න. (මෙය පමණක් විවිධ කණ්ඩායම් මගින් කළ හැකි ය.)

## ඇගයීම සහ තක්සේරුකරණය සඳහා උපදෙස්

1. නාට්‍යකට ගැළපෙන කතාවක් තෝරාගැනීම
2. කතාවේ යම් වෙනස්කම් කළ හැකි බව පිළිගැනීම
3. කතාව ගොඩනැගීම සඳහා ප්‍රධාන සිද්ධි පෙළගැස්වීම
4. කතාවේ චරිත විවිධ විය යුතු බව වටහා ගැනීම
5. නාටකීය ලෙස සංවාද නිර්මාණය කිරීම

**පැවරුම ඃ** ඔබ දන්නා ළමා නාට්‍යයක කතා පුවත ලියන්න.

**අතිරේක උදව් ඃ** ජනකතා, සුරාංගනා කතා අධ්‍යයනය කිරීම

**නිපුණතාව 2.0** ඃ **ස්වකීය පරිකල්පනය මෙහෙයවන පරිසරය ආශ්‍රිත අත්දැකීම් පදනම් කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.**

**නිපුණතා මට්ටම 2.6** ඃ **නිර්මාණාත්මක චින්තනය වර්ධනය වෙයි.**

**ක්‍රියාකාරකම 2.6.2** ඃ **එහි නාට්‍යෝචිත අවස්ථා හඳුනා ගැනීම**

**කාලච්ඡේද සංඛ්‍යාව** ඃ 01

**ඉගැනුම් පල** ඃ
- නාට්‍ය පෙළක ඇති නාට්‍යෝචිත අවස්ථා හඳුනාගනියි.
- නාට්‍යෝචිත අවස්ථාවක් ගොඩනගා ගනියි.
- නාට්‍යෝචිත අවස්ථාවක ලක්ෂණ පෙන්වයි.
- ප්‍රේක්ෂකයා නාට්‍ය කෙරෙහි ඇද බැඳ තබා ගැනීමට නාට්‍යෝචිත අවස්ථා වැදගත් බව ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම්** ඃ නරිබෑණා, මනමේ, අමර ගියා දිවිය ලෝකේ නාට්‍ය පිටපත්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

පියවර 1 ඃ
- ශිෂ්‍යයා තෝරාගත් කතාවේ ඇති අවස්ථා පිළිබඳ ව කතාබහ කරමින් පාඩමට ප්‍රවිෂ්ට වෙයි. එහිදී කතා පුවත අවස්ථාමය වශයෙන් පෙළ ගැසෙන බවත් අවස්ථා තුළ නාට්‍යෝචිත බවක් තිබිය යුතු බවත් ප්‍රකාශ කරන්න.

පියවර 2 ඃ
- නාට්‍යෝචිත අවස්ථා යනු කුමක් ද යි මුලින් ම සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- නාට්‍යෝචිත අවස්ථාවක් ලෙස සලකන්නේ යම්කිසි ගැටුම්කාරී ස්වභාවයක් සහිත අවස්ථාවකි.
- එහිදී ඉදිරිපත්වන ප්‍රධාන කාර්යාවලියට ප්‍රතිවිරුද්ධ ක්‍රියාවලියක් පැන නැගී මෙම ස්වභාවය ගොඩනැගෙන බව පෙන්වා දෙන්න.
- මෙවැනි අවස්ථාවන් ගොඩනගා ගැනීම තුළින් නරඹන ප්‍රේක්ෂකයා තුළ කුතුහලය ඇති වී නාට්‍යය කෙරෙහි බැඳී සිටින බව පෙන්වා දෙන්න.
- කතාවක් නාට්‍යයක් බවට පත්කරන විට ප්‍රේක්ෂකයා කුතුහලයෙන් සම්බන්ධ වන ආකාරයට සිදුවීම හෝ අවස්ථාව නිර්මාණය කරගැනීමට අවශ්‍ය දැනුම ලබාදෙන්න.

පියවර 3 ඃ ඉහත සඳහන් කරුණ තවදුරටත් තහවුරු කිරීම සඳහා ''අමර ගියා දිවිය ලෝකේ''වැනි නාට්‍යයක් සහ ''මනමේ'' 'නරිබෑනා''වැනි නාට්‍ය පිටපත් උදාහරණ කරගනිමින් පහදන්න.

පියවර 4 'අමර ගියා දිවිය ලෝකේ' යන නාට්‍යයෙන් හෝ සිසුන් විසින් සකස්කර ගත් නාට්‍යයේ නාට්‍යෝචිත අවස්ථාවක් සිසුන් සමග නිරූපණය කරමින් නාට්‍යෝචිත අවස්ථා ප්‍රායෝගික ව ඉදිරිපත් කරවන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

01. නාට්‍යෝචිත අවස්ථාවක් කුමක් ද යන්න ප්‍රකාශ කිරීම
02. නාට්‍යෝචිත අවස්ථාවක ලක්ෂණ නම් කිරීම
03. වෙනත් නාට්‍ය කෘතිවලින් නාට්‍යෝචිත අවස්ථා හඳුනා ගැනීම
04. නාට්‍යෝචිත අවස්ථාවක් රංගනය මගින් ප්‍රායෝගිකව පෙන්වීම
05. නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය කර පෙන්වීම

නිපුණතාව 2.0 ඃ ස්වකීය පරිකල්පනය මෙහෙවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

නිපුණතා මට්ටම 2.6 ඃ නිර්මාණාත්මක චින්තනය වර්ධනය වෙයි.

ක්‍රියාකාරකම 2.6.3 ඃ සංවාද ගොඩ නැගීම හා පෙළ රචනය කරමු

කාලච්ඡේද ඃ 02

ඉගැනුම් පල ඃ
- නාට්‍ය පෙළක ඇති සංවාද හඳුනාගනී.
- සංවාද මගින් කතා ගොඩ නැගෙන අයුරු ප්‍රකාශ කරයි.
- පෙළ රචනය කරනවිට සංවාද මගින් එය ගොඩ නැගෙන බව වටහා ගනී.
- සංවාද උච්චාරණය කිරිම නිවැරදි ව සිදු කළ යුතු අයුරු හඳුනාගනී.

ගුණාත්මක යෙදවුම් ඃ
- සුදුසු නාට්‍ය පෙළ රචනා කීපයක්

**ක්‍රියාකාරකමක් සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

පියවර 1 ඃ කතාව ඇසුරින් නාට්‍ය පෙළ ගොඩනගා ගැනීම පිළිබඳ ව පෙර දැනුම විමසමින් පාඩමට පිවිසෙන්න. ඔවුන් නිර්මාණය කර ගත් නාට්‍යමය සිද්ධි, අවස්ථා, සංවාද ඇසුරින් නාට්‍ය පෙළක් නිර්මාණය කරගැනීම සිදු කළ යුතු බව ප්‍රකාශ කර මේ සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකමට යොමු කරවන්න.

පියවර 2 ඃ සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදන්න. ඔවුන් විසින් නිර්මාණය කරගත් කතාපුවතට අදාළ අවස්ථා ගෙන එම අවස්ථාව ප්‍රකාශ වන සේ නිශ්චල රූප රාමු කිහිපයක් ගොඩ නගන ලෙස ප්‍රකාශ කරන්න. ඒ අනුව ඒ ඒ කණ්ඩායම් තමන් විසින් නිර්මාණය කරගත් කතා පුවතට ගැළැපෙන අවස්ථා ප්‍රකාශවන සේ රංගමය රූප ගොඩනගා ගත යුතු යි. ඒවා කණ්ඩායම් වශයෙන් පරික්ෂා කර ඒවා අගය කරමින් නිවැරදි ව රංගරූප ගොඩනගා ගන්නා අයුරු පෙන්වා දෙන්න.

පියවර 3 මෙම නිශ්චල රූපරාමු වලට ගැළැපෙන ලෙස ඒ ඒ චරිතවලට සංවාද එකතු කරන්න. සංවාදයට අදාළ ව චලන ක්‍රියාවලිය ද ඉස්මතු කරන්න. මෙහිදී නාට්‍ය කතාපුවතට සහ ගොඩනගා ගත් රූප රාමුවට චරිතවලට අදාළ ලෙස සංවාද එකතු කරමින් එම නිශ්චල ඡායාරූපය සංවාද සහිත ව චලනමය ක්‍රියාවලියක් බවට පත්කරන්න.

පියවර 04 කතාවේ අවස්ථා ප්‍රකාශ වන අයුරින් ගොඩනගාගත් නිශ්චල රූපරාමුවලට සංවාද එකතු කිරීමත් සමග එම අවස්ථාව සංවාද මගින් නිරූපණය වූ අයුරු සිසුන්ට පැහැදිලි කරන්න. මින්පසු එම අවස්ථා සහ සංවාද ගැන සැලකිලිමත් වෙමින් නාට්‍ය පිටපතක් රචනා කිරිමට අවශ්‍ය අවබෝධය ලබාදෙන්න. රංගවිධාන සහිත ව සංවාද එකතු කරමින් ගොඩනගා ගත් කතා පුවතට අදාළ ව නාට්‍ය පෙළ රචනය කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

01. සංවාද යනු කුමක් දැයි ප්‍රකාශකිරීම
02. නිශ්චල රංගරූප සකස් කිරීම සිදුකරයි.
03. නිශ්චල රංගරූප සංවාද යොදා චලනය කරයි.
04. නිර්මාණාත්මක අවස්ථාවක් නිර්මාණය කරයි.
05. නාට්‍ය පෙළක් රචනා කරයි.

**පැවරුම ඃ-** ගොඩනගා ගත් කතා පුවතට ගැළපෙන ලෙස සංවාද සහිත නාට්‍ය පිටපතක් රචනා කරවීම
**අතිරේක උදව් ඃ** නාට්‍ය පිටපත් කිහිපයක්

| | | | |
|---|---|---|---|
| **නිපුණතාව** | **2.0** | **ඃ** | **ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.** |
| **නිපුණතා මට්ටම** | **2.7** | **ඃ** | **වේෂභූෂණ හා නාට්‍යෝපකරණ නිර්මාණය කරයි.** |
| **ක්‍රියාකාරකම** | **2.7.1** | **ඃ** | **රචනා කළ නාට්‍යයට උචිත අයුරින් වේෂභූෂණ නිර්මාණය කරයි.** |
| **කාලච්ඡේද** | | ඃ | 02 |

**ඉගැනුම් පල** ඃ
- ''වේෂභූෂණ'' හඳුන්වයි.
- අවශ්‍ය පරිදි ඒ ඒ චරිතයන්ට අදාළ වේෂභූෂණ සැලසුම් කරයි.
- එම වේෂභූෂණ නිර්මාණය කරයි.

**ගුණාත්මක යෙදවුම්** ඃ
- විවිධ ශෛලීන්ට අයත් නාට්‍ය කීපයක රංග වස්ත්‍ර හෝ ආභරණ / ඇඳුම් පැළඳුම් කීපයක් හෝ පින්තූර කීපයක්
- රෙදි, කෝඩ් නූල් තීන්ත වර්ග, හාඩ්බෝඩ්, බ්‍රිස්ටල්බෝඩ් ආදී වූ ද්‍රව්‍ය

**ක්‍රියාකාරකමක් සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

පියවර 1 ඃ
- ගෙනෙන ලද වේෂභූෂණ හෝ ඒවායේ පින්තූර සිසුන්ට පෙන්වා පාඩමට පිවිසෙන්න.
- එම වේෂභූෂණ අයත් වූ නාට්‍යයන් පිළිබඳව සිසුන් සමග සාකච්ඡා කරන්න.
- නිර්මාණය කරන ලද නාට්‍යයට උචිත වේෂභූෂණ මොනවාදැ යි සැලසුමක් සකසන්න.

පියවර 2 ඃ
- නිර්මාණය කරන ලද නාට්‍ය පෙළට නාට්‍ය ශෛලියට වඩාත් ම උචිත ලෙසින් වේෂභූෂණ නිර්මාණය කළ යුතු බවත් ආහාර්ය අභිනයේ මූලික ස්ථානයක් වේෂභූෂණ සඳහා හිමිවන බවත් පැහැදිලි කරන්න.
- ඒ ඒ චරිතයන්ට වඩාත් ම උචිත අයුරින් වේෂභූෂණ නිර්මාණය කළ යුතු බවත් නළුවාගේ බාහිර සමාරෝපය සඳහා මේවා සෘජුව ම බලපාන අයුරුත් පැහැදිලි කරන්න.
- රංගවස්ත්‍ර හා ආභරණ නළු නිළියන්ට පහසුවෙන් ඇඳ පැළැඳ ගැනීමට හැකි අයුරින් නිර්මාණය කළ යුතු බව පෙන්වා දෙන්න.
- ඒ ඒ නාට්‍ය සඳහා අදාළ කාලයට දේශයට, යුගයට ගැළපෙන ලෙසින් වේෂභූෂණ නිර්මාණය කළ යුතු බව පැහැදිලි කරන්න.

පියවර 3
- තෝරාගත් නාට්‍ය පිටපතට අදාළ වේෂභූෂණ කීපයක් නිර්මාණය කිරීම
  අතිරේක උදව් යටතේ ඇති වේෂභූෂණ කිහිපයක් නිර්මාණය කරන්න.
- ඒවා උදාහරණයට ගෙන අවශ්‍ය වේෂභූෂණ නිර්මාණය කරවන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

01. නාට්‍යයක වස්ත්‍රාභරණ සාමාන්‍ය අදින පළඳින වස්ත්‍රාභරණවලට වඩා වෙනස් බව හඳුනා ගැනීම
02. අවශ්‍ය පරිදි වේෂභූෂණ සැලසුම් කිරීම හා තෝරා ගැනීම
03. වේෂභූෂණ නිර්මාණයේදී සැලකිලිමත් විය යුතු කරුණු විස්තර කිරීම
04. උචිත වේෂභූෂණ නිර්මාණය කිරීම
05. වේෂභූෂණයෙන් සැරසී රංගනයේ යෙදීම



රජබිසව
B




රජු
A

1. **රජු හා බිසව**
චරිත සඳහා රංගවස්ත්‍ර නිර්මාණය

- නාට්‍ය චරිත සඳහා රංගවස්ත්‍ර නිර්මාණයෙදී පිටපතෙහි එන චරිතයෙහි ස්වභාවය, යුගය, ප්‍රදේශය ආදි විශේෂ කරුණු සියල්ලත් සලකා බැලිය යුතු වේ.
- අනවශ්‍ය ලෙස ආභරණ හෝ වස්ත්‍ර යොදාගැනීමෙන් රූපණ ශිල්පියාට වන අපහසුතා සහ චරිතය අභිබවා වේෂභූෂණ මතුවීම සැලකිල්ලට ගනිමින් අවම හා සරල යෙදුම් කිහිපයකින් චරිතයක් මතුකර ගැනීමට උත්සාහ දැරීම වඩාත් ප්‍රායෝගික වේ.
- නිදසුන් ලෙස ඉහත රූපය පරිදි, රජ චරිතයක් නිර්මාණයේදී වඩාත් දිලිසෙන හෝ සංකීර්ණ රටා සහිත වස්ත්‍රාභරණයන්ට වඩා සරල සැහැල්ලු යෙදුම් කිහිපයකින් චරිතය මතුකළ හැකි බව පෙන්වා දිය හැකි ය.
- ඇඳුමෙහි යටකොටස ලෙස බොහෝවිට භාවිත වන්නේ සාරියක් දෝතියක ආකාරයෙන් පටලවා ගැනීමයි. මෙය නිවැරදිව නොකළහොත් රඟපෑමට බාධා ඇති වේ. එහෙත් ඒ සඳහා රැළි කිහිපයක් යෙදූ සැහැල්ලු රෙද්දක් භාවිත කිරීම මගින් සරල මෙන් ම පහසු බවක් ද ඇති වේ.
- බිසවගේ චරිතය සඳහා ද ආභරණ හෝ රංගවස්ත්‍ර බහුල ව යෙදීමට වඩා සරල සැහැල්ලු රෙදිකඩ කිහිපයක් හා අවම ආභරණ භාවිතයකින් චරිතය මනා ලෙස මතු කළ හැකි බව රූපය මගින් හඳුනාගත හැකි ය.
- උඩුකය ආවරණය සහ අතීතයේ භාවිත තනපට වෙනුවට උඩුකය හොඳින් ආවරණය වන ලෙස ඇඟි සමෙහි වර්ණයට සමාන වර්ණයකින් යුතු හැට්ටයකට මතුපිටින් තනපටක ආකාරයට රෙදිකඩක් බැඳීම ප්‍රමාණවත් වේ. ඇඳුමෙහි යට කොටස සඳහා ද සැහැල්ලු රෙදිකඩ කිහිපයක් B රූපයේ පරිදි යොදා ඉනට පැලඳීම ප්‍රමාණවත් බව පෙනේ.

**මිරිවැඩි සගල නිර්මාණය**

- රජ චරිතයක් ඇතුළත් නාට්‍යයක් සඳහා මිරිවැඩි සගලක් නිර්මාණය කිරීම පිළිබඳ සරල අදහසක් මෙහි දැක්වේ.
- සාමාන්‍ය ජීවිතයේදී භාවිත කරන රබර් සෙරෙප්පු දෙකක් යොදාගෙන රාජකීය මිරිවැඩි සගලක් නිර්මාණය කරන ආකාරය මෙහිදී පෙන්වා දී ඇත.
- අවශ්‍ය වන්නේ හොඳින් ඇලවෙන ගම් විශේෂයක්, කාඩ්බෝඩ්, රෙදිකැබලි, රබර් සෙරෙප්පු දෙකක්, සහ අවශ්‍ය පරිදි වර්ණ හා සැරසිලි ද්‍රව්‍ය කිහිපයකුත් පමණි.
- මූලික ව A රූපයේ පරිදි සපයාගත් පාවහන් යුගලයට B රූපයේ පරිදි හැඩයට කපාගත් කාඩ්බෝඩ් කැබලි අලවාගත යුතු ය. (C රූපය අනුව) ගම් හොඳින් වියලුණු පසුව D රූපයේ ආකාරයට සවිමත් ලෙස සකසාගත් පටියත් E ආකාර පටියත් ආධාරයෙන් F හැඩය මතුවන පරිද්දෙන් ඒ ඒ කොටස් සවිමත් ව අලවාගත යුතු ය. මෙසේ සකසාගත් හැඩය ශක්තිමත් කිරීම සඳහා හොඳින් ගම් තවරා සම්පූර්ණයෙන් රෙදි ඇලවීම කළ යුතු ය. එසේ මනා ලෙස හැඩය මතුකර නිමාකර ගත් මිරිවැඩි සගල වර්ණකර ඒ මත G රූපයේ පරිදි අවශ්‍ය ඕනෑම රටාවක් සැරසිලි කිරීම මගින් මනා නිමාවකින් යුතු මිරිවැඩි සගලත් නිර්මාණය කර ගැනීමට හැකි වේ.




මිරිවැඩි සගල

**නිපුණතාව 2.0 ඃ ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිරමාණකරණයෙහි යෙදෙයි.**

**නිපුණතා මට්ටම 2.7 ඃ වේෂභූෂණ හා නාට්‍යෝපකරණ නිර්මාණය කරයි.**

**ක්‍රියාකාරකම 2.7.2 ඃ තෝරාගත් නාට්‍යයට ගැළැපෙන නාට්‍යෝපකරණ සැලසුම් කිරිම හා නිර්මාණය කිරීම**

**කාලච්ඡේද** ඃ 02යි

**ඉගැනුම් පල** ඃ

- නාට්‍යටෝපකරණ හඳුන්වයි.
- රංගයට අවශ්‍ය උචිත නාට්‍යටෝපකරණ සැලැසුම් කරයි.
- අවශ්‍ය නාට්‍යෝපකරණ කීපයක් නිර්මාණය කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- කලින් නිර්මාණය කරන ලද නාට්‍යෝපකරණ කීපයක් හෝ එවැනි පින්තූර කීපයක්
- නාට්‍යෝපකරණ භාවිතවන නාට්‍යය ජවනිකා කීපයක පින්තූර
- ප්ලාස්ටික් බඳුන්, සැහැල්ලු ලී, ලී කුඩු, ප්ලාස්ටික් බට, හලාගත් වැලි, රෙදිකැබලි, පත්තර කොළ, කෝඩ්නූල්, ගෝල්ඩ් ඩස්ට් ආදි නාට්‍යෝපකරණ නිර්මාණය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍යය.

**ක්‍රියාකාරකමක් සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

පියවර 1 ඃ

- ගෙනෙන ලද නාට්‍යෝපකරණ හෝ පින්තූර සිසුන්ට දක්වා ඒවා පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- 7 වැනි ශ්‍රේණියේ නාට්‍යෝපකරණ පිළිබඳව සිසුන් ඉගෙනගත් කරුණු නැවත මතක් කරමින් සාකච්ඡාවක් කරන්න.
- නියමිත නාට්‍ය පෙළට අදාළ නාට්‍යෝපකරණ සැලැසුම් කරන්න.

පියවර 2 ඃ

- සැලසුම් කරන ලද නාට්‍ය උපකරණ කීපයක් නිර්මාණය කරවීම. අවශ්‍ය අමුද්‍රව්‍යය සිසුන්ට තෝරාගැනීමට සලස්වා නාට්‍යෝපකරණ කීපයක් නිර්මාණය කිරීමට අවස්ථාව ලබාදෙන්න.

පියවර 3


- සිසුන් කණ්ඩායම් කර එක් එක් කණ්ඩායමට නාට්‍යෝපකරණ කීපයක් නිර්මාණය කිරිමට උපදෙස් දෙන්න. කලින් (7 ශ්‍රේණිය) පාඩම්වලදී නිර්මාණය නොකරන ලද භාණ්ඩ කීපයක් නිර්මාණය කිරීමට සලස්වන්න. (අතිරේක උදව් යටතේ නාට්‍යෝපකරණ කීපයක් නිර්මාණය කරන ආකාරය දක්වා ඇත)
- නිර්මාණය කරන ලද උපකරණ පිළිබඳ ව පහත කරුණු ද උපයෝගී කරගෙන සාකච්ඡාවක් මෙහෙයවන්න.
- විවිධ නාට්‍යෝපකරණ නිර්මාණය සඳහා විවිධ වූ අමුද්‍රව්‍ය අවශ්‍ය වන බව
- විවිධ භාණ්ඩ නිර්මාණය කිරීමේ දී නිර්මාණාත්මක හැකියා මගින් වඩාත් සුදුසු අයුරින්, ගැළැපෙන අයුරින් නාට්‍යෝපකරණ නිර්මාණය කළ හැකි බව
- වඩාත් උචිත රංග උපකරණ යොදාගැනීම නාට්‍යයේ රස ජනනයට වඩාත් උපකාරී වන බව


ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ

01. නාට්‍යෝපකරණ හා සාමාන්‍ය උපකරණ අතර වෙනස හඳුනාගැනීම
02. පෙළට අවශ්‍ය රංගෝපකරණ තෝරාගැනීම
03. නාට්‍යෝපකරණ සැලැසුම් කිරීම
04. නාට්‍යෝපකරණ නිර්මාණය කිරීම
05. නාට්‍යෝපකරණ පරිහරණය කරමින් රඟපෑම

**සිංහාසනයක් නිර්මාණය**

- මෙහි A රූපයෙන් දක්වා ඇති පරිදි විද්‍යාලයේ සාමාන්‍යයෙන් භාවිත වන ගුරුපුටුවක්-සිංහාසනයක් ලෙස වෙනස් කර භාවිත කළ හැකි ය.
- කළ යුතු වන්නේ B රූපයේ දැක්වෙන පරිදි පසුපස කොටසක් C රූපයේ දැක්වෙන පරිදි ඉදිරිපස කොටසත් හාඩ්බෝඩ් හෝ වැනිස්ට්‍රා බෝඩ් මගින් හැඩ කපා වර්ණ කර සවි කිරීම පමණි.
- තවදුරටත් සිංහාසනයෙහි සුවපහසුව නිරූපණය කළ යුතු නම් D රූපයේ පරිදි පුළුන් හෝ එවැනි සැහැල්ලු ද්‍රව්‍යයක් පිරවූ කොට්ට දෙකක් පුටුවෙහි ඇඳි දෙකට සවි කිරීමෙන් පුටුවෙහි ඉඳගන්නා කොටස සඳහා කොට්ටයක් යෙදීමත් සිදු කළ හැකි ය.
- මීට අමතර ව නාට්‍ය සඳහ නිර්මාණය කරගන්නා බහුකාර්ය භාවිතයට හැකි වන පරිදි සකසා ගත් හැඩතල කිහිපයක් භාවිතයෙන් ද සිංහාසනයක් නිර්මාණය කර ගත හැකි ය.
- E රූපයේ දැක්වෙන පරිදි ශක්තිමත් දුවයෙන් තැනූ අඩි1 1/2 X 1 1/2 ප්‍රමාණයේ පෙට්ටිකට සවි කළ හැඩතල කිහිපයක් මගින් ද මනා ලෙස සිංහාසනයක අනුරුවක් සකස්කර ගැනීමට නිර්මාණකරුවාට හැකි ය.



**නිපුණතාව 2.0 ඃ ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.**

**නිපුණතා මට්ටම 2.8 ඃ අංග රචනය කරයි.**

**ක්‍රියාකාරකම 2.8.1 ඃ නාට්‍යයට අදාළ ව අංගරචනය කරමු.**

**කාලච්ඡේද සංඛ්‍යාව** ඃ 02

**ඉගැනුම් පල** ඃ
- අංග රචනය යන්න හඳුන්වයි.
- අංග රචනා ද්‍රව්‍ය හඳුනාගෙන නම් කරයි.
- අංග රචනයේ වැදගත්කම පැහැදිලි කරයි.
- නාට්‍යයේ අදාළ චරිත කීපපක් අංග රචනය කරයි.
- අංග රචනයේදි සැලකිලිමත්විය යුතු කරුණු පැහැදිලි කරයි.

**ගුණාත්මක යෙදවුම්** ඃ
- වේදිකා නාට්‍යය කීපයක චරිතවල පින්තූර
- අංග රචනා උපකරණ කට්ටලයක්
- අංග රචනය පිළිබඳ විස්තර ඇතුළත් ලිපි,පත්‍රිකා කීපයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

**පියවර 01** ඃ
- අංග රචනා කරන ලද විවිධ චරිත කීපයක පින්තූර කීපයක් සිසුන්ට පෙන්නා ඒ පිළිබඳ ව සිසුන්ගෙන් විමසමින් පාඩමට පිවිසෙන්න.
- අංග රචනය යන්න කෙටියෙන් හඳුන්වාදෙන්න.
- සරල හා චරිතාංග රචනය පැහැදිලි කරන්න.
- අංග රචනා උපකරණ කට්ටලය සිසුන්ට පෙන්වමින් ද්‍රව්‍ය හා උපකරණ හඳුන්වාදෙන්න.

**පියවර 02** ඃ
- නිර්මාණය කරන ලද නාට්‍යය සඳහා අංග රචනය කළ යුතු චරිත පෙළගැස්වීමට උපදෙස් දෙන්න.

**පියවර 03** ඃ
- අතිරේක උදව් යටතේ දක්වා ඇති පරිදි විවිධ චරිත අංග රචනය කිරීම
- අවසානයේ සිසුන්ගේ දක්ෂතා හා සංවර්ධනය කරගත යුතු අංශ පිළිබඳ ව පහත කරුණු ද උපයෝගී කරගෙන සාකච්ඡාවක් කරන්න.
- එම ද්‍රව්‍ය භාවිත කරන අයුරු ඉතා හොඳින් දැනගත යුතු වීම
- අංග රචනයේදී පින්සල් මගින් මෙන් ම පැන්සල් ආදියෙන් වර්ණ, රේඛා නිවැරැදි ව හැසිරවීමට දැනුම තිබිය යුතු වීම
- මුහුණට ගැළපෙන මෙන් ම මුහුණට අසාත්මිකතාවයක් නොදක්වන ද්‍රව්‍ය තෝරාගත යුතු වීම
- නාට්‍යයේ ශෛලිය අනුව අංග රචනය වෙනස්වන අයුරු හඳුනාගත යුතු වීම
- චරිතයක බාහිර සමාරෝපය සඳහා අංග රචනය උපකාරි වන බව පැහැදිලි කිරීම
- අංග රචනයේ දී චරිතයන්ගේ මුහුණුවල හැඩය මෙන් ම සමේ වර්ණය ද බලපාන අයුරු පැහැදිලි කර දීම

**ඇගයීම හා තකසේරු කරණය සඳහා උපදෙස් ඃ**

- ''අංග රචනය ''යන්න හැඳින්වීම
- අංග රචනා උපකරණ හා ද්‍රව්‍ය හැඳින්වීම
- නාට්‍යයේ චරිතවලට අදාළ අංග රචනා ද්‍රව්‍ය රැස්කර ගැනීම හා අංග රචනය සඳහා සූදානම
- අවශ්‍ය පරිදි චරිත අංග රචනය කිරිම
- අංග රචනය කර චරිතය රඟපෑම

**පැවරුම ඃ** විවිධ චරිත අංග රචනා කිරිම

**අතිරේක උදව් ඃ-** අංග රචනය පිළිබඳ ලිපිය- අභිනය සඟරාව - සිව්වන කලාපය - ජගත් පද්මසිරි චරිත කීපයක් අංගරචනය කිරිම

**නිපුණතාව 2.0 ඃ ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම පාදක කොටගෙන නිර්මාණකරණණයෙහි යෙදෙයි.**

**නිපුණතා මට්ටම 2.9 ඃ වේදිකා පසුතල නිර්මාණය කරයි.**

**ක්‍රියාකාරකම 2.9.1 ඃ නාට්‍යයට අදාළ ව වේදිකා පසුතල සැලැසුම් කිරීම හා නිර්මාණය කිරිම**

**කාලච්ඡේද සංඛ්‍යාව** ඃ 02

**ඉගෙනුම් පල** ඃ
- ''වේදිකා පසුතල'' හඳුන්වයි.
- නාට්‍යයට උචිත පරිදි පසුතල සැලැසුම් කරයි.
- පසුතල කීපයක් නිර්මාණය කරයි.

**ගුණාත්මක යෙදවුම්** ඃ
- නාට්‍යය කීපයක පසුතල දක්වෙන පින්තූර
- පසුතල නිර්මාණ සඳහා උපයෝගී කරගත හැකි අමුද්‍රව්‍ය (හිස්ගෝනි, හාඩ්බෝඩ්, ලී පතුරු, ලී කුඩු, බයින්ඩර් ගම්, වර්ණ කුඩු වර්ග, අමුරෙදි ආදිය)

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

**පියවර 01** ඃ
- වේදීකා පසුතල කීපයක් සිසුන්ට දක්වා පාඩමට පිවිසෙන්න.
- විවිධ නාට්‍යවල විවිධ පසුතල මැවීම සඳහා විවිධාකාරයේ පසුතල යොදාගන්නා අයුරු පැහැදිලි කරන්න.
- නිර්මාණය කරන ලද නාට්‍යයට අවශ්‍ය වන පසුතල නිර්මාණ මොනවාද යන්න සැලැසුම් කරවන්න.


**පියවර 02** ඃ
- අවස්ථාවන්ට උචිත අයුරින් පසුතල නිර්මාණ සකස් කළ යුතු බවත් මෙම නිර්මාණ නිර්මාණාත්මක ව නාට්‍යෝචිත ව, අලංකාර ව මෙන් ම සරල ව නිම කළ යුතු බවත් පැහැදිලි කරන්න.
- නළු කාර්යය ඉස්මතු වන ලෙසත් රඟපෑමට අපහසුතා ඇති නොවන ලෙසටත් රූපණ රටාවට ගැළැපෙන ලෙසත් පසුතල සකස්කළ යුතු බව පවසන්න.
- නාට්‍ය පෙළින් කියැවෙන කාලයට, දේශයට යුගයට ගැළැපෙන අයුරින් මෙන් ම රංග ශෛලියට ගැළැපෙන ලෙසින් පසුතල නිර්මාණය කළ යුතු බව දක්වන්න.
- පසුතල සඳහා වර්තමානයෙහි චිත්‍ර වස්ත්‍ර මෙන් ම (වර්ණ විනිවිදක) වැනි විවිධ තාක්ෂණයන් ද භාවිත කළ හැකි බව පෙන්වා දෙන්න.


**පියවර 03**
- සිසුන් විසින් නිර්මාණය කරන ලද නාට්‍යයට අවශ්‍ය වන පසුතල නිර්මාණය කිරිමට සැලැසුම් කළ පසු ඒවාට උදාහරණ ලෙසින් පසුතල නිර්මාණ කීපයක් අතිරේක උදව් යටතේ දක්වා ඇති පරිදි නිර්මාණය කරන්න.


**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

01 ''පසුතල නිර්මාණ''හඳුනාගැනීම
02. පෙළට අවශ්‍ය පසුතල තෝරාගැනීම
03. පසුතල නිර්මාණ සැලැසුම් කිරීම
04. පසුගල නිර්මාණ සකස් කිරීම
05. පසුතල යොදා ගනිමින් රංගන කිරිම

**අතිරේක උදව් ඃ**












**කුඩා ගල් පර්වතයක් හෝ කන්දක් නිර්මාණය**

- වේදිකාව මත ගලක් හෝ කන්දක් නිර්මාණය මගින් දෘශ්‍ය රූපය ඔපවත් කරන්නාක් මෙන් ම එය රූපණ කාර්යයට ද සහය කරගැනීමට හැකිනම් ඉතා වැදගත් වේ.
- ගෝනි, රෙදි, ඉටිරෙදි හෝ කඩදාසි වැනි අමුද්‍රව්‍ය යොදාගනිමින් වේදිකාව මත මෙවැන්නක් නිර්මාණය කිරීමේදී බොහෝ විට විශාල ඉඩක් වැය වේ. එහෙත් මෙහි A රූපයේ දක්වා ඇති ආකාරයට ත්‍රිමාණ හැඩතලවලින් යුත් ගලක් හෝ කන්දක් නිර්මාණය මගින් ඉඩකඩ, ශ්‍රමය මෙන් ම වියදම ද ඉතා අවම කරගත හැකි වේ.
- සැහැල්ලු මෙන් ම ශක්තිමත් ලෙස සකසා ගත් පඩිපෙළක් හෝ මණ්ඩපයක් ඉදිරිපසින් හා පසුපසින් (B රූපයේ පරිදි) ත්‍රිමාණ ආකාරයට සිතුවම් කර හැඩයට කපාගත් පුවරු දෙකක් සවිකිරීම මගින් ඉහත අවශ්‍යතාව හොඳින් ඉටුකරගත හැකි ය. රූපණය අතරතුර පර්වතය මතට ගොඩවීම, ඉන් පහතට පැනීම ආදි ක්‍රියාකාරකම් සිදුකළ හැකි බැවින් මේ ආකාරයට සකසා ගත් පසුතලය රංග කාර්ය හා හොඳින් බද්ධ කර ගත හැකි වෙයි.
- එසේ ම ප්‍රවාහනය කිරීමටත්, වේදිකාව මත පහසුවෙන් හැසිරවීමටත් මෙබඳු පසුතල නිර්මාණයන් මගින් හැකියාව ලැබේ.

- වැනිස්ට්‍රා බෝඩ් හෝ හාඩ්බෝඩ් වැනි සැහැල්ලු මෙන් ම ශක්තිමත් පුවරු C රූපයේ දැක්වෙන ආකාරයට හැඩතල සැකසීමට යොදාගත හැකි ය.
- ඉහත ක්‍රමවේදය භාවිතයට ගනිමින් ශිල්පියාගේ නිර්මාණාත්මක හැකියාව මත විවිධ ආකාර ත්‍රිමාණ පසුතල සැකසීමට හැකිවන අතර උස් මණ්ඩප පඩිපෙළ ආදිය මේ සමගින් එක්කර ගැනීමෙන් ඒවා වඩාත් රංගකාර්ය සඳහා බද්ධ කරගැනීමට හැකියාව ලැබේ.
- D රූපයේ දක්වා ඇති ආකාරයට උස් ගස් බෙනයකින් සතකු එබිකම් කරන ආකාරය, දැක්වීමට මෙන් ම ඇතැම්විට මහල් කිහිපයකින් යුතු ගොඩනැගිල්ලක ඉහළ  මහලේ කවුළුවකින් චරිතයක් පෙනී සිටීම දැක්වීමට ආදි අවශ්‍යතාවන් සඳහා ද මෙම ක්‍රමය යොදාගැනීමට හැකි ය.
- ශ්‍රව්‍ය දෘශ්‍ය සජීවී කලා මාධ්‍යයක් වන නාට්‍ය කලාවේ ප්‍රේක්ෂක ආකර්ශනය සඳහා මෙවැනි සරල උපක්‍රම යොදා ගැනීම මගින් පසුතලයට ද සජීවී ක්‍රියාකාරි වටිනාකමක් ලැබෙන අතර ඉන් දෘශ්‍ය මායාව ගොඩ නැංවීමට ද අවස්ථාව ලැබේ




කුළුනු

අර්ධ සිලින්ඩාරාකාර ලෙස හැදූව ද වේදිකාව මත දී සම්පූර්ණ සිලින්ඩරාකාර කුලුනු ස්වරූපයක් මතුවෙයි.

රෙජිෆෝම් පටි කෝඩ්නූල් හෝ පල්ප්වලින් නාට්‍යයට ගැළපෙන පරිදි මෙහි කැටයම් කළ හැකි වේ. පල්ප් හෝ කඩදාසි යොදා මෙවැනි හැඩ මතු කළ හැකියි.

**කුලුනු නිර්මාණය**

- නාට්‍ය පිටපතෙහි සඳහන් වන යුගයට හෝ ප්‍රදේශයට අනුව නාට්‍යය ඉදිරිපත් කරන රංග ශෛලිය ද සැලකිල්ලට ගනිමින් පසුතල නිර්මාණ කාර්යය කළ යුතු වන අතර බොහෝවිට නාට්‍යයක් සඳහා උස් කුලුනක් යොදාගැනීමට හැකියාව ලැබුණහොත් ඉන් දෘශ්‍ය රූපයට මහත් ආලෝකයක් ලැබේ.
- වේදිකාව මත හැසිරවීමට හෝ ප්‍රවාහනය අපහසු මෙන් ම ශක්තිමත් භාවයන් අඩු කුලුනු වැනි උපකරණ පසුතල සඳහා භාවිතයේදී නාට්‍යකරුවන් අත්විඳින්නා වූ අපහසුතා එමට ය.
- එබඳු අපහසුතා අවම, සැහැල්ලු වූ ද සරල වූ ද කුලුනු නිර්මාණයක් ලෙස මෙහි රූපයේ දැක්වෙන කුලුන දැක්විය හැකි ය.
- ප්‍රථමයෙන් A-3 රූපයේ පරිදි අර්ධ වෘත්තාකර කොටස් දෙක කපාගන්න අතර එම රූපයේ දක්වා ඇති පරිදි ඉදිරිපස සවිකළ යුත තැන් සමාන පරතරයක් සහිත ව සටහන් කරගත යුතු වේ.
- දෙවනුව ඉතා සැලකිල්ලෙන් රීප්ප 4 ( A-4) රූපයේ දක්වා ඇති පරිදි වෘත්තාකාර කොටස් දෙකට සවිකළ යුතු ය
- තෙවනුව පෙර කපාගත් හාඩ්බෝඩ් කොටස ටින්ටස් ඇණවලින් රීප්පවලට සවි කළ යුතු ය.
- (A-5) රූපයේ පරිදි සකසා ගත් කුලුන මත නාට්‍යයේ අවශ්‍යතාව පරිදි පල්ප්, රෙජිෆෝම් හෝ කඩදාසි වැනි ද්‍රව්‍ය මගින් කැටයම් මතු කළ හැකි ය. සුදුසු පරිදි වර්ණ කිරීමෙන් පසු සිලින්ඩරාකාර පෘෂ්ඨයප්‍රේක්ෂකයා දෙසට හරවා වේදිකාව මත කුලුනු සිරස් අතට තැබූ පසු සම්පූර්ණ කුලුනක ස්වරූපය ඒ මගින් දිස්වනු ඇත.

<u>අවශ්‍ය ද්‍රව්‍ය</u>

- හාඩ්බෝඩ් කැබැල්ලක් ( A-1 රූපය පරිදි)
- අර්ධ වෘත්තාකාර ලෑලි කොටස් දෙකක්
- ඇද නැති රිප්ප ( 2''X 1'') 4ක්
- අවශ්‍ය පරිදි ඇණ

**නිපුණතාව 2.0** : **ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදකකොට ගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි**

**නිපුණතා මට්ටම 2.10** : **සංගීතය නිර්මාණය කරයි.**

**ක්‍රියාකාරකම 2.10.1** : **නාට්‍යයට උචිත සංගීතය නිර්මාණය කිරීම**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- නාට්‍ය සංගීතය හා සාමාන්‍ය සංගීතයේ වෙනස්කම් පහදයි.
- නාට්‍යයට උචිත සංගීතය නිර්මාණය කරයි.
- පසුබිම් සංගීතය හා ගීත ගායනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : - නාට්‍ය ගීත හා නාට්‍යය කොටස් ඇතුළත් සංයුක්ත තැටි කීපයක් (ශ්‍රව්‍ය පට)

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**
- නාට්‍ය ගීතයක් ගායනා කරමින් හෝ ශ්‍රව්‍ය පටයක් හෝ දෘශ්‍ය පටයක් මගින් සිසුන්ට අසන්නට සලස්වමින් පාඩමට පිවිසෙන්න.
- නාට්‍යයක සංගීතය ආහාර්ය අභිනයට අයත්වන අතර ගීත ගායනය වාචික අභිනයට අයත් වන බව පවසන්න.
- නාට්‍යයක සංගීතය නාට්‍යයේ තේමාවට ශෛලියට අනුකූල විය යුතු අතර නාට්‍යමය අවස්ථා තීව්‍ර කිරීමට භාවිත කළ යුතු බව පවසන්න.
- නාට්‍ය රසය මතුකරලීමටත්, අවස්ථා අතර සම්බන්ධතාව රැකීමටත් සංගීතය උපකාරීවන අතර සංගීතය නාට්‍යෝචිත විය යුතු බව පවසන්න.
- සංගීතය අවම වශයෙන් යොදන හෝ සංගීතය භාවිත නොකරන නාට්‍යය ද නිෂ්පාදනය වන අතර නාට්‍යධර්මී නාට්‍යයේදී සංගීතයට විශේෂ ස්ථානයක් හිමි වන බව පැහැදිලි කරන්න.
- නළු නිළියන්ගේ රංගය අභිබවා සංගීතය මතු නොවිය යුතු අතර නාට්‍යය අධ්‍යක්ෂවරයාගේ උපදෙස් පරිදි සංගීත අධ්‍යක්ෂවරයා නාට්‍ය සංගීතය නිර්මාණය කළ යුතු බව පවසන්න.
- ප්‍රේක්ෂකයා තුළ රස ජනනය කිරීමට මෙන් ම විවිධත්වය හා විචිත්‍රත්වය මැවීම ද නාට්‍ය සංගීතය මගින් සිදුවිය යුතු බව පහදන්න.

**පියවර 02** :
- නිර්මාණය කරන ලද නාට්‍ය පෙළ හොඳින් අධ්‍යයනය කර පෙළට අවශ්‍ය සංගීතය නිර්මාණය කිරීමට සිසුන් යොමු කරන්න.
- ඉහත සඳහන් කරන ලද කරුණු ද සැලකිල්ලට ගෙන නාට්‍ය පෙළ රංගයක් බවට පත්කිරීමේ දී සංගීතය උචිත අයුරින් යොදා ගැනීමේ වැදගත්කම සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

**පියවර 03** :
- හැකි නම් සංගීත ගුරුවරයාගේ ද උදව් ඇතිව ගායනයට හා වාදනයට දක්ෂ සිසුන් තෝරාගෙන නාට්‍යයට අවශ්‍ය පරිදි සංගීතය නිර්මාණය කරවන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- ''නාට්‍ය සංගීතය'' යන්න හඳුනාගැනීම
- සංගීතයෙන් නාට්‍යයට ලැබෙන ප්‍රයෝජන විස්තර කිරීම
- නිර්මාණය කරන ලද නාට්‍යයට අවශ්‍ය සංගීතය සැලැසුම් කිරීම
- උචිත පරිදි සංගීතය නිර්මාණය කිරිම
- සංගීතය යොදා ගෙන නාට්‍යය රංගනය කිරීම

**පැවරුම** ඃ- නිර්මාණය කරන ලද නාට්‍යයට උචිත පරිදි සංගීතය නිර්මාණය කරන්න.
**අතිරේක උදව්** ඃ- සංගීතය උචිත ලෙසින් යොදාගන්නා ලද නාට්‍යවල ශ්‍රව්‍ය-දෘශ්‍යපට කීපයක්

**8 ශ්‍රේණිය සඳහා නාට්‍ය ගීත**

**සොකරි ගී**

වෙදා නටන්නේ පළමුව සබේට එන්නේ
යොදා කියන්නේ තාලෙට ගත වෙවුලන්නේ
කුදා වැනෙන්නේ සබයේ කොක් හඬ ලන්නේ
විදා පාන්නේ අත්දෙක තැගි කියන්නේ

සොකරී එන්නී සබයෙන් අවසර ගන්නී
නැටුම් නටන්නී තාලෙට රාග කියන්නී
පද අල්ලන්නී පියයුරු ළැම සොල්ලන්නී
කැඩපත ගන්නී සුරතින් මූණ බලන්නී

**කෝළම් ගී**
**ජසයා හා ලෙංචිනා**

මව්පියො නිදහස් වෙන්නටා
මාව දුන්නයි නාකි වූ හමෙකුටා //
උන්දල හට කඹුරන්නටා
යැද ඉන්නෙ සුරන්හට දෙස්කොටා//

සිරසටා ගෙතු මල් වඩම්
හිස මතුපිටා දිලි තෙලයෙන්
සුවඳටා මල්වල එරොන්
ගෙන යන්නටා එති කැළ බිඟුන්

රූසිරෙන් අඟනක් මෙනා
ලොව නෑ ඉතින් තව සරිලනා
මේ ලෙසින් සිතමින් මෙනා
බල ලෙංචිනා එන සෝබනා

**නාඩගම් ගීයක් බැලසන්ත නාඩගමේ ගීයක්**

ඉඳින් බබෝ ඉඳින් - මගේ අතේ ඉඳින්
බොහෝ ආදරෙන් නුඹෙ මව මෙන් - රකින්නෙමී මෙමං
උක්කුං දෙඤ්ඤං බබෝ - උක්කුං දෙඤ්ඤං බබෝ
උක්කුං දෙඤ්ඤං පුතාට මං - උක්කුං දෙඤ්ඤං බබෝ
බිල්ලා ඒවි බබෝ // බිල්ලා ඇවිත් පුතාව දූන්
අල්ලාගනී බබෝ
**තාරාවෝ ඉගිලෙති නාට්‍යයෙන් ''සොබාව දේ'' නාට්‍ය ගීතය යොදාගන්න.**

**නිපුණතාව 2.0** : **ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.**

**නිපුණතා මට්ටම 2.11** : **රචනා කරන ලද පෙළ රංගයක් බවට පත් කරයි.**

**ක්‍රියාකාරකම 2.11.1** : **ආනුෂංගික කලා භාවිත කරමින් පෙළ රංගයක් බවට පත්කිරීම**

**කාලච්ඡේද සංඛ්‍යාව** 02

**ඉගැනුම් පල** :

- සිසුන් විසින් නිර්මාණය කරන ලද නාට්‍යය සඳහා සකස් කරන ලද ආනුෂංගික අංග පෙළ ගස්වයි.
- ඇඳුම්, පැළැඳුම්, ආභරණ නිර්මාණ රැස් කරයි.
- අංග රචනය කරයි.
- පසුතල නිර්මාණ රැස්කරයි.
- නාට්‍ය සංගීතය උචිත පරිදි යොදාගනී.
- සියලු ම ආනුෂංගික අංග එක් කර ගනිමින් නාට්‍ය රංගයක් බවට පත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** :

- කලාත්මක නාට්‍යය කීපයක දර්ශන ඇතුළත් ශ්‍රව්‍ය දෘශ්‍ය පට කීපයක්
- නිර්මාණය කරන ලද ඇඳුම් පැළැඳුම්, පසුතල, අංග රචනා ද්‍රව්‍ය හා සංගීත භාණ්ඩ වැනි සියලු ම අවශ්‍ය දේ

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01 : නිර්මාණය කරන ලද නාට්‍යය සඳහා තෝරාගන්නා ලද නළු-නිළියන් හා ආනුෂංගික ශිල්පීන් සියලුදෙනා එක් රැස්කොට අවශ්‍ය පරිදි එම දෙපිරිස අතර සහයෝගයෙන් කටයුතු කිරීමට සලස්වන්න.

පියවර 02 :

- විවිධ චරිතවලට ගැළපෙන බාහිර සමාරෝපය සඳහා වැදගත්වන වේෂභූෂණ අංග රචනය වඩාත් ම උචිත අයුරින් සිදුකරන්න.
- එම ආනුෂංගික අංගවලින් නාට්‍යයට ඇති ප්‍රයෝජන නැවතත් සිහිපත් කරන්න.
- පසුතල නිර්මාණ හා භාණ්ඩ උචිත ස්ථානාවල ස්ථානගත කරවන්න.
- මේවාගේ නිර්මාතෘන් වන්නේ ද සිසුන් බැවින් ඔවුන්ට තම නිර්මාණ නාට්‍යයේ සාර්ථකත්වය වඩාත් උචිත අයුරින් යොදන අයුරු පිළිබඳ ව උපදෙස් දෙන්න.
- සංගීතය සපයන භාණ්ඩ හා සංගීත ශිල්පීන් එක්රැස් කර නියමිත ස්ථානවල ස්ථානගත කිරීම

පියවර 03 :

- පෙළ රචකයා, නළුනිළියන් හා ආනුෂංගික ශිල්පීන් සියලු ම දෙනා විසින් පෙළ රංගයක් බවට පත්කිරීම සඳහා දරනු ලබන ප්‍රයත්නය සාර්ථක කරගැනීම සඳහා මූලිකව සවේශ පුහුණුවක් කළ යුතු බවත්, ඒ සඳහා එම නාට්‍යය, මේ සියලු ම ආනුෂගික අංග, ශිල්පීන් එක් ව නාට්‍ය දර්ශනයක් ඉදිරිපත් කිරීමට සලස්වන්න. (නළුනිළියන් හා ආනුෂංගික අංග භාවිතකොට රඟදැක්වීම සවේෂ පුහුණුව බව හඳුන්වා දෙන්න.) මේ සඳහා පාසලේ සංගීත ගුරු භවතා නර්තන ගුරුභවතා, නාට්‍ය හා දැඩි ඇල්මක් හා දක්ෂතා දක්වන වෙනත් ගුරු භවතුන් කීපදෙනකු ද සම්බන්ධ කර ගන්නේ නම් වඩාත් උචිත වන අතර ඉහළ ශ්‍රේණිවල දක්ෂතා ඇති සිසු පිරිසක් යොදා ගැනීම වැදගත් වේ.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

01. පෙළට උචිත අයුරින් අංග රචනය කිරීම
02. උචිත ඇඳුම් පැළැඳුම් තෝරාගැනීම
03. නිර්මාණාත්මක ව පසුතල හා නාට්‍යෝපකරණ යොදා ගැනීම
04. පෙළට වඩාත් උචිත හා අවස්ථා තීව්‍ර වන අයුරින් සංගීතය යොදාගැනීම
05. මේ සියලු ම ආනුෂංගික අංග නිසි පරිදි යොදාගනිමින් රංග ගත කරන ලද නිර්මාණයේ සමස්ත සාර්ථකත්වය

**අතිරේක උදව්:**

- නාට්‍ය විචාර පොත් කීපයක්
- සාර්ථක නාට්‍යයක් සඳහා ආනුෂංගික අංගවලින් ලැබෙන දායකත්වය පිළිබඳ ව දැක්වෙන ලිපි කීපයක්

නිපුණතාව 3.0 ඃ නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම් හි නියැළෙයි.

නිපුණතා මට්ටම 3.1 ඃ නාට්‍ය පෙළ අධ්‍යයනය කරයි.

ක්‍රියාකාරකම 3.1.1 ඃ නාට්‍ය පෙළ කියැවීම

කාලච්ඡේද සංඛ්‍යාව ඃ 02

ඉගැනුම් පල ඃ
- නාට්‍ය පෙළෙහි එන සංවාද නිවැරැදි ව උච්චාරණය කිරිමේ හැකියාව ලබයි.
- ඒ ඒ චරිතයට අදාළ සංවාද නියමිත අවස්ථාවේදී ම ප්‍රකාශ කරයි.
- නාට්‍යයේ කථා පුවත වටහා ගනියි.
- සිසු පිරිස සාමූහික ව හා අවධානයෙන් යුතු ව ක්‍රියාකරයි.

ගුණාත්මක යෙදවුම් ඃ නිර්දිෂ්ට නාට්‍ය පෙළ ( මාෂා හා වළහා)

ක්‍රියාකාරකම සැලසුම් කිරිම සඳහා උපදෙස් ඃ

පියවර 01 ඃ සිසුන් එළිමහන් ස්ථානායකට රැගෙන යෑම හෝ පන්ති කාමරය භාවිත කරමින් වෘත්තකාර ව සිටගැනීමට අවස්ථාව සැලසීම. මාෂා හා වළහා නාට්‍ය පිටපත පිළිබඳ ව කෙටි පැහැදිලි කිරීමක් කිරිම.

පියවර 02 ඃ නාට්‍යයේ චරිත සහ එක් එක් ළමයා නම් කර නාට්‍ය පිටපත මුල සිට කියැවීමට යොමු කිරිම. පළමු වටය කියවා අවසන් වූ පසුව තවත් සිසුන් කණ්ඩායමක් නම් කර කියැවීම.

පියවර 03 ඃ පිටපත මූලික වටයක් කියැවූ පසුව සංවාදයක් නිවැරැදි ව උච්චාරණය කරන අයුරු පහදා දීම. හැඟීම් සහ අර්ථ නිරූපණය වන සේ දෙබස් උච්චාරණය කිරිමට ඇවැසි අවබෝධය ලබාදීම.

පියවර 04 පිටපත කියැ වූ සිසුන් අතරින් වඩාත් හොඳින් පිටපත කියවන සිසුන් කිහිපදෙනකු තෝරා වඩාත් නාට්‍යමය ආකාරයට පෙළ කියැවීමට අවස්ථාවක් දීම. අවසානයේ සිසුන් සමඟ නාට්‍ය පෙළ මේ ආකාරයට කියැවීම තුළින් ලබාගත හැකි ප්‍රයෝජන සාකච්ඡා කිරිම

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :
- නාට්‍ය පිටපතෙහි එන සංවාද උච්චාරණය කිරිම
- නැවතීම්, අවධාරණය කිරිම සහ හඬ උස්පහත් කිරීම් නිවැරැදි ව සිදු කිරීම
- ක්‍රමානුකූල ව ගුවන්විදුලි නාට්‍යයක් මෙන් සංවාදමය ආකාරයට නාට්‍ය පෙළ කියැවීම
- සියලු දෙනා ම මනා අවධානයෙන් යුතුව සාමූහිකව පෙළ කියැවීම සිදු කිරීම

පැවරුමඃ- සිසුන් කණ්ඩායම් කර පන්ති කාමරය තුළ දී ගුවන්විදුලිය නාට්‍යයක ආකාරයට නැවත ඉදිරිපත් කිරිමකට සූදානම් වන ලෙස ප්‍රකාශ කිරීම

| | | |
|---|---|---|
| **නිපුණතාව 3.0** | ඃ | **නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකරකම් හි නියැළෙයි.** |
| **නිපුණතා මට්ටම 3.1** | ඃ | **නාට්‍ය පෙළ අධ්‍යයනය කරයි.** |
| **ක්‍රියාකාරකම 3.1.2** | ඃ | **සිද්ධි පෙළගස්වා ඇති ආකාරය විමසුම** |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | ඃ | **02** |

**ඉගැනුම් පල** ඃ

- පෙළෙහි ඇතුළත් විවිධ සිදුවීම් විස්තර කරයි.
- විවිධ සිදුවීම් මූලික අවස්ථා ලෙස ගොනු කරමින් පෙළ ගස්වයි.
- කතා පුවතෙහි මූලික අවස්ථා වේදිකාව මත නිසල රූප ලෙස නිර්මාණය කරයි.
- එම අවස්ථා තුළ ඇති චරිත හඳුන්වා දෙයි.

**ගුණාත්මක යෙදවුම්** ඃ මාෂා සහ වළහා නාට්‍ය පෙළ

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

**පියවර 01** ඃ

- ගුරු භවතා මාෂා හා වළහා නාට්‍යයේ පිටපත කියවීමෙන් පසු ව අවබෝධ කරගත් කතා පුවත ගැන විමසමින් පාඩමට පිවිසෙයි. කතාවක සිද්ධි ඇති බවත්, එම සිද්ධි පෙළ ගැස්වීම මගින් කතාවක් ගොඩනැගෙන බවත් නාට්‍ය පෙළක ඇත්තේ තෝරාගත් සිද්ධි පෙළක් බවත් අවබෝධ කරවමින් පාඩම ආරම්භ කිරිම.

**පියවර 02** ඃ සිසුන් කණ්ඩායම්වලට බෙදා මාෂා හා වළහා නාට්‍යයේ සිද්ධි පෙළ ගැසී තිබෙන ආකාරය සටහන් කර ගැනීමට අවස්ථාව ලබාදීම. සිසුන් අවස්ථා පෙළ ගැසී ඇති අයුරු ලියා දැක්වීමෙන් පසු ව ගුරුවරයා ද මැදිහත් වී සාකච්ඡා කර තවදුරටත් අවස්ථා පෙළ ගැසි ඇති අයුරු පෙන්වා දීම

- වළහා ගේ නිවසට මාෂා පැමිණීම
- වළහා ගේ නිවස තුළට පැමිණ මී වදය කෑම. ඇඳේ නිදාගැනීම
- වළහා නිවසට පැමිණීම හා මාෂා අසුවීම
- වළහා මාෂා නිවසේ සිරකර තබා ගෙයින් පිටවූ පසු මී මැස්සන් ගේ පැමිණීම
- වළහා මාෂාගේ ආච්චී බැලීමට යාමට සූදානම් වීම
- වළහා මාෂාගේ ආච්චි බැලීමට යාම
- මගදී කෑමට උත්සාහ කිරීම
- ආච්චි හමුවීම හා මාෂා බේරිම
- යනාදි වශයෙන් ශිෂ්‍ය කණ්ඩායමට නාට්‍යයේ ඇති අවස්ථා පෙළගැස්ම අවබෝධ කරවීම

**පියවර 03** ඃ ගුරු සිසු මැදිහත්වීමෙන් පෙළගස්වනු ලැබූ කතා පුවතේ මූලික අවස්ථා වේදිකාවට උචිත අයුරින් නිසල රූ මගින් නිර්මාණය කරන්නට යොමු කිරීම (නිසල රූ යනු සංවාද හා චලන රහිත ව රංගන ඉරියව් සහිත රූප නිසලව (Freezing) පිහිටුවීමයි. මෙම ශිෂ්‍ය කණ්ඩායම් වශයෙන් නිරූපණය කර පෙන්විය යුතු අතර සිසුන් කණ්ඩායම්වල නර්තන වෙන වෙන ම ඇගයීමට ලක් කිරිම

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- කතා පුවත කෙටියෙන් විස්තර කරයි.
- කතා පුවතේ ඇති සිද්ධි පෙළ ගස්වයි.
- නිසල රූ නර්මාණයට දායක වෙයි.
- සාමූහික නිර්මාණකරණයට දායක වෙයි.
- සිසු නිර්මාණ පිළිබඳ ව සාකච්ඡා මෙහෙයවයි.

**පැවරුම:-** සිසුන් කණ්ඩායම් වශයෙන් මාෂා හා වළහා නාට්‍යයේ අවස්ථා සියල්ල නිසල රූප වශයෙන් නිර්මාණය කර පෙන්වීම

**අතිරේක උදව්:-** වේදිකා නාට්‍ය ජවනිකා ඇතුළත් ඡායාරූප

නිපුණතාව 3.0 ඃ නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකරකම් හි නියැළෙයි.

නිපුණතා මට්ටම 3.1 ඃ නාට්‍ය පෙළ අධ්‍යයනය කරයි.

ක්‍රියාකාරකම 3.1.3 ඃ පිටපතතෙහි චරිත විමසීම

කාලච්ඡේද සංඛ්‍යාව ඃ 02

ඉගැනුම් පල ඃ
- මාෂා හා වළහා නාට්‍යයේ කතාව කියයි.
- එහි චරිත නම් කරයි. චරිත විස්තර කරයි.
- චරිත නිරූපණයේ ඇති විශේෂතා පෙන්වයි.

ගුණාත්මක යෙදවුම් ඃ මාෂා හා වළහා නාට්‍යයේ පිටපත්

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ

පියවර 011 ඃ පෙර පාඩමේදි පිටපත කියැවීම පිළිබඳ ව විමසා සිටීම. එම කියැවීම මගින් ඔවුන් අවබෝධ කරගත් කරුණු විමසමින් ඒවා කළුලැල්ලෙහි සටහන් කිරිම

පියවර 02 ඃ
- සිසුන් ඉදිරිපත් කළ කරුණු අතරින් කතා පුවත ගැන කෙටියෙන් පැහැදිලි කිරීම. චරිත නාම සටහන් කර ගැනීමට දීම.
- අහඹු ලෙස තෝරාගත් සිසුන් කිහිපදෙනකු මගින් ඒ ඒ චරිත පිළබඳ ව ඔවුන්ට වැටහුණු කරුණු විමසීම
- චරිතය නිරූපණය කළයුතු අයුරු විමසීම සහ කැමති සිසුන්ට චරිතය නිරූපණය කර පෙන්වීමට ඉඩ ප්‍රස්තාව ලබාදීම සහ එම චරිතවල විශේෂ ගුණාංග කළු ලැල්ලෙහි සටහන් කිරිම

පියවර 03 ඃ
- සිසුන්ගේ අදහස් විමැසීමට අමතර ව ගුරුවරයා විසීන් ද පහත සඳහන් ආකාරයේ කරුණු කිහිපයක් සිසුන් වෙත ඉදිරිපත් කිරීම
- කතාව ප්‍රේක්ෂකයා දකින්නේ චරිත මගින් බවත් නාට්‍යයක චරිත රැසක් ඇති අතර එහි විවිධ ගති ස්වභාවයන් තිබෙන බව ප්‍රකාශ කිරීම
- මනුෂ්‍ය චරිත මෙන් ම සත්ත්ව චරිත ද දැකිය හැකි අතර චරිතයක බාහිර ස්වරූපයක් සහ අභ්‍යන්තර ස්වරූපයක් ද ඇති බව මාෂා හා වළහා නාට්‍ය ඇසුරින් පෙන්වා දීම
- විවිධ චරිත ලක්ෂණ සංවාද මගින් සහ ක්‍රියා නිරූපණයෙන් ප්‍රකාශ වන අන්දම මාෂා හා වළහා උදාහරණ කර ගනිමින් පෙන්වාදීම

පියවර 04 ඃ සිසුන්ට පහත සඳහන් ආකාරයේ වගුවක් සකස්කර මාෂා හා වළහා නාට්‍යයේ චරිතවල දැකිය හැකි ලක්ෂණ සටහන් කිරිමට යොමු කරවීම

| චරිතය | බාහිර ලක්ෂණ | අභ්‍යන්තර ලක්ෂණ |
|---|---|---|
| | | |

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

- නාට්‍ය පිටපතක එන චරිත නම් කිරීම
- චරිතවල ලක්ෂණ පෙළ ගැස්වීම
- චරිත අතර ඇති සම්බන්ධතාව ප්‍රකාශ කිරීම
- චරිත නිරූපණයේ විවිධතා පෙන්වා දීම
- චරිත නිරූපණයන් සිදු කිරීම

**නිපුණතාව 3.0** ඃ **නාට්‍ය හා රංගකලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම් හි නියළෙයි.**

**නිපුණතා මට්ටම 3.1** ඃ **නාට්‍ය පෙළ අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 3.1.4** ඃ **නාට්‍ය තේමාව හඳුනා ගනිමු.**

**කාලච්ඡේද සංඛ්‍යාව** ඃ 01

**ඉගැනුම් පල** ඃ
- නාට්‍යයේ තේමාව යනු කුමක්ද යි ප්‍රකාශ කරයි.
- මාෂා හා වළහා නාටයේ ඇති තේමාවන් වෙන් කර දක්වයි.
- කතාවක ප්‍රධාන ම ලක්ෂණයක් ලෙස තේමාව හඳුනාගනී.
- වෙනත් නාට්‍යවල ඇති තේමාවන් හඳුනාගනියි.

**ගුණාත්මක යෙදවුම්** ඃ මාෂා හා වළහා නාට්‍යයේ පිටපත්, වෙනත් නාට්‍ය පිටපත් කිහිපයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

පියවර 01 ඃ මාෂා හා වළහා නාට්‍යයේ කතා පුවත, සිද්ධි පෙළගැසීම, චරිත නිරූපණය යන ආදිය ගැන නැවත කෙටියෙන් මතක් කර මෙම නාට්‍යය තුළින් ප්‍රකාශ වන්නේ කුමක් දැයි විමැසීම මගින් තේමාව යනු කුමක් ද යි වටහාදීම. මේ අනුව සෑම නිර්මාණයක් තුළ ම තේමාවක් ඇති බව ප්‍රකාශ කිරීම, නිර්මාණයක් ජනප්‍රිය වීමට උසස්වීමට තේමාව වැදගත් බව පෙන්වා දීම

පියවර 02 ඃ
- මාෂා සහ වළහා නාට්‍යයේ තේමාව යනු කුමක් ද යි විමසීම.
- සිසුන්ගේ ප්‍රකාශි කිරිම. කළු ලෑල්ලේ සටහන් කිරිම. ඒ අනුව මාෂා
- සහ වළහා නාට්‍යයේ ඇති තේමාවන් සටහන් කිරීම
- කුඩා ළමුන් පවා දැන ඉගෙන ගත යුතු දේ බොහොමයක් ඇති බව
- නපුරු ළමයින් නිරන්තරයෙන් ප්‍රතික්ෂේප වන බව
- හැම අයකු තුළ ම යහගුණ ඇති බව
- නරක අය පවා යහපත් අයගේ ආශ්‍රය නිසා හොඳ වන බව
- අවිහිංසාවෙහි ඇති වැදගත්කම

යනාදි කරුණු මාෂා සහ වළහා නාට්‍යය තුළින් ප්‍රකාශවන බව සාකච්ඡාව තුළින් පෙන්වා දීම

පියවර 03 ඃ
- මාෂා සහ වළහා නාට්‍යයේ පමණක් නොව සෑම නාට්‍යයක ම තේමාවක් ඇති බව ප්‍රකාශ කර වෙනත් නාට්‍ය කිහිපයක ඇති තේමාවන් හඳුනා ගැනීම සඳහා සිසුන් යොමුකරවීම. මෙහිදි සිසුන් කණ්ඩායම් කර කණ්ඩායමක් වශයෙන් සාකච්ඡා කර අදහස් ඉදිරිපත් කිරිමට අවස්ථාව ලබාදීම. (6 වැනි 7වැනි ශ්‍රේණිවල ඉගෙනගත් නාට්‍ය හෝ තමන් දන්නා වෙනත් නාට්‍ය උදාහරණ කර ගැනීමට යොමුකරවීම

පියවර 04ඃ-
- කණ්ඩායම් වශයෙන් ඔවුන් අවබෝධ කරගත් වෙනත් නාට්‍යවල තේමාවන් විස්තර කිරිම සඳහා කණ්ඩායම්වලට අවස්ථාව ලබාදීම. තේමාව යන සංකල්පය නාට්‍යයේ අනිවාර්ය අංගයක් බව සිසුන්ට වටහාගැනීමට මගපෙන්වීම.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

- නාට්‍ය පෙළෙහි තේමා කිහිපයක් ඇති බව පිළිගනියි.
- මාෂා සහ වළහා නාට්‍යයේ තේමා වෙන් කර දක්වයි.
- වෙනත් විවිධ නාට්‍යවල ඇති තේමා ප්‍රකාශ කරයි.
- නාට්‍යවල තේමාවන් හඳුනාගැනීම සඳහා සාමූහික ව ක්‍රියාකරයි.
- සාමූහික ව අදහස් ඉදිරිපත් කිරිම හා විවිධ තේමාවන් හඳුනාගැනීම කරයි.

**පැවරුම**ඃ- ඔබ නරඹා ඇති හෝ කියවා ඇති නාට්‍යයක තේමාව කෙටියෙන් ලිවීම

**අතිරේක උදව්** ඃ- වෙනත් නාට්‍ය කෘති හෝ කෙටි නාට්‍ය/ ළමා නාට්‍ය සහිත සංයුක්ත තැටි නැරඹීම

| | | |
|---|---|---|
| **නිපුණතාව 3.0** | | **නාට්‍ය හා රංගකලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම් හි නියැළෙයි.** |
| **නිපුණතා මට්ටම 3..2** | | **රංග අභ්‍යාසවල නිරත වෙයි.** |
| **ක්‍රියාකාරකම 3.2.1** | | **ශරීරය උණුසුම් කර ගනිමු.** |
| **කාලච්ඡේද** | ඃ | 02 |

**ඉගැනුම් පල** ඃ

- ශරීරය උණුසුම් කරගැනීම සඳහා විවිධ චලන ක්‍රම භාවිත කරයි. ශරීරය උණුසුම් කරගැනීමේ අභ්‍යාසවලින් ශරීරයට ප්‍රබෝධයක් ලබා ගනී.
- සබකෝලය දුරුවන බව වටහා ගනී.
- යම් රංගමය හැකියාවක් ද ලබාගත හැකි බව වටහා ගනී.

**ගුණාත්මක යෙදවුම්** ඃ

- කැසට් යන්ත්‍රයක් සහ සංගීත සංයුක්ත තැටියක් රබානක් හෝ බෙරයක්.

**ක්‍රියාකාරකමක් සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

**පියවර 01** ඃ

- සිසුන් නිදහස් ස්ථානයකට රැගෙන ගොස් අවකාශය පුරා විසිරී යන ලෙස ඇවිදීමට සැලැස්වීම. ඇවිදින සිසුන්ට බෙරයක් හෝ රබානක් මගින් නිකුත් කරන ශබ්දයට අනුව ඇවිදීමට සැලැස්වීම.
- එහිදී බෙරයේ රිද්මය වැඩි ලයකින් වාදනය කරනවිට වැඩි වේගයෙන් ඇවිදී. අඩු වේගයකින් වාදනය කරන විට අඩු වේගයකින් ඇවිදී. යම් වේලාවක් මෙම කාර්යයේ යෙදුණු පසු ක්‍රියාවලිය මාරු කරන්න.
- බෙරයට එක වරක් තට්ටු කරන විට සිසුන් නවතී. බෙරයට දෙවරක් තට්ටු කරන විට සිසුහු උඩ පනිති. බෙරයට තුන්වරක් තට්ටු කරන විට බිම වාඩිවෙති. මේ ආකාරයට වාදනය මාරු කරමින් බෙරයට තට්ටු කරමින් ළමයින් විනෝදාත්මක ව ශරීරය උණුසුම් කරවන්න.

**පියවර 02** ඃ

බෙරය සහිත ක්‍රියාකාරකම අවසන් වූ පසු නැවත අවකාශය තුළ නිදහස් ව ඇවිදීමට ඉඩ සලසන්න. ඇවිදින ගමන් ගුරු විධානයට අවධානය යොමු කරන ලෙසත් ඒ විධානයට අනුව මෙතැන් සිට කටයුතු කරන ලෙසත් ප්‍රකාශ කරන්න. ගුරුවරයා පහත ඇතිවෙන ක්‍රියාවලිය සිසුන්ට අනුකරණය කර දැක්වීමට හැකි ආකාරයට ඉදිරිපත් කරන්න.

'' සිසුන් ඉක්මන් ගමනක් යෑමට පටන්ගැනීම. ගමන මුලින් ම ආරම්භ වන්නේ ගම්මානයක පාරකිනි. ඒ ගමනේ දී ඔවුන්ට වෙල්යායක් මැදින් යෑමට සිදුවෙයි. ඔවුහු මඩ සහිත නියරක් දිගේ ඇවිද යන අතර වක්කඩවල් උඩින් පනිමින් යති.

වෙල අවසන් ව කැලයකට පැමිණෙන අතර කටු අතු ඉවත් කරමින් කටු පඳුරු අතරින් රිංගමින් හා ගස්වැල් අතරින් රිංගමින් පනිමින් ගමන් කරති. හදිසියේ ම කැලය ඇතුළේ ඇති මී මැස්සන් රංචුවකට මැදිවෙති. ඔවුන්ගෙන් ගැලවීමට අත පය විසුරුවමින් උඩ පනිමින් දඟලමින් දිවයති. බිම වැටෙති. බිම දිගේ පෙරළෙති. නැවත නැගිට දිවයති. ස්වල්ප වේලාවකින් කැලයෙන් එළිමහන් ස්ථානයකට පිවිසීමට හැකි වේ. මී මැස්සෝ අඩු වී ඇත. හිස වටේ කැරකෙන කිහිපදෙනෙකුට ද අතින් ගසමින් ඉවත් කරති. දැන් මාර්ගය පහසු

නිසා ගමන පහසු වේ. ගමන් වේගය අඩුවේ.
නිදහස් සුසුම් හෙළමින් ළමුන් සාමාන්‍ය තත්ත්වයකට පත් වේ''

**පියවර 03**

ක්‍රියාකාරකම අවසන් වනවාත් සමගම සිසුන්ට අවකාශය තුළ ඇවිදිමින් ගුරුවරයා කතා කරන හඬට සවන් දෙන්න සලසන්න. මෙහිදී කරනු ලැබූ ක්‍රියාව ගැන සහ එයින් ඔවුන් ලද අත්දැකීම විස්තර කිරීමට අවස්ථාව ලබාදෙන කෙටි සාකච්ඡාවක් තුළින් පාඩම අවසන් කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

- ශරීරය උණුසුම් කරගැනීම සඳහා විවිධ චලනවල යෙදීම
- රිද්මයානුකූලව ශරීරය චලනය කිරීම
- අවධානයෙන් යුතුව ක්‍රියාකිරීම
- නිර්මාණාත්මකව අනුකරණය කිරීම
- නිවැරදිව අවකාශය භාවිතය

නිපුණතාව 03 ඃ නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම් හි නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.2 ඃ රංග අභ්‍යාසවල නිරතවෙයි.**

**ක්‍රියාකාරකම 3.2.2 ඃ ශිථිලකරණ අභ්‍යාසවල නිරත වෙමු.**

**කාලච්ඡේද** ඃ 02

**ඉගැනුම් පල** ඃ

- ශිථිලකරණය මගින් ශරීරය සැහැල්ලු කර ගනියි.
- රංගන කාර්ය සඳහා ශරීරය ශිථිලකරණය කර ගත යුතු බව අවබෝධ කරගනී.
- විවිධ ශිථිලකරණ අභ්‍යාස ක්‍රම භාවිත කරයි.

**ගුණාත්මක යෙදවුම්** ඃ

-
-
-
-

**ක්‍රියාකාරකමක් සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

**පියවර 01** ඃ

- පන්තියේ සියලු ම සිසුන් ඉඩකඩ ඇති නිදහස් ස්ථානයකට රැගෙන යන්න. වෘත්තාකාර ව සිටීමට ඉඩ සලසන්න. ඇස් පියාගැනීමට සලස්වා තමාගේ සිරුරේ දෙපතුලසිට හිස මුදුන දක්වාත් හිස මුදුනේ සිට දෙපතුල දක්වාත් ඇති බාහිර ශරීර අවයව පිළිබඳ ව සිහිකර ගැනීමට ඉඩ සලසන්න. ඉන්පසු ව සියුම් සංගීත ඛණ්ඩයක් වාදනය කරන්න. එය අසමින් අවකාශය පුරා විසිරී ඇවිදීමට සලස්වන්න.

**පියවර 02** ඃ

- සංගීත ඛණ්ඩය අවසන් වූ පසුව සිසුන් සමඟ සිදු කළ කාර්යය පිළිබඳ ව සාකච්ඡා කිරීම. යම්කිසි ආකාරයකට මානසික ව සහ කායිකව දැනුණු සැහැල්ලු බව සිහිපත් කර එය ශිථිලකරණය යනුවෙන් හැඳින්වෙන බව ප්‍රකාශ කිරීම. ශිථිලකරණය යනු සිරුරේ සියලු අඟපසඟ සහිත ව සම්පූර්ණ ශරීරය සැහැල්ලු කිරීම යි. රංගනයේදී මෙවැනි ශාරීරික සැහැල්ලුවක් හෙවත් ශිථිලකරණයක් අවශ්‍ය බව පෙන්වා දීම

**පියවර 03** ඃ

ශාරීරික අවයව ශිථිලකරණය සඳහා තවත් අභ්‍යාස කිහිපයක් සිසුන් සමග සිදු කරන්න. ඒ සඳහා පහත සඳහන් අභ්‍යාසය භාවිත කරන්න. (මෙම අභ්‍යාසයෙහි ලනු ගැට ගැසීම හා ඇදීම අනුකරණයෙන් කළ යුතු ය.)
මෙම අභ්‍යාසය සඳහා දෙදෙනක් වශයෙන් අවකාශය තුළ සම්බන්ධ වන්න. එහිදී එක් අයකු රූකඩයක් වන අතර අනෙක් අය රූකඩය පාලනය කරන්නා වේ. ඒ අනුව එක් අයකු බිම වැටි සිටී. ඔහු රූකඩයක් වේ. රූකඩයක හිස කෙස්වලට ලණුවක් ගැටගසා (හිස මුදුනින්) එම ලණුව උස් ස්ථානයක රඳවා ඇති තිරස් ලීයක් (Bar) මතින් දමා අනෙක් පස සිට එක් අයකු ලණුවෙන් අදින විට බිම වැටි ඇති රූකඩය ක්‍රමයෙන් ඉහළට එසැවෙයි. නැවත ලණුව බුරුල් කරනවිට රූකඩයේ දෙපා දනහිස, ඉණ, බෙල්ල ආදිය ලිහිල් වී බිම පතිත වේ. මෙය කිහිප වතාවක් කළ පසු රූකඩය වූ අය ලණුව අදින්නා බවටත් ලණුව අදින්නා රූකඩය බවටත් පත් වී නැවත අභ්‍යාසය කරන්න.

මෙම අභ්‍යාසය සඳහා ද දෙදෙනකු අවශ්‍ය වේ. එක් අයකු බැලූනය වන අතර අනෙකා බැලූනයට හුළං ගසන අය වේ. මෙහිදී එක් අයකු පොම්පයකින් හුළං ගසන අකාරය අනුකරණය කරනවිට අනෙකා බැලූනයක් මෙන් හුළං ක්‍රමයෙන් පිරී බැලූනයක් පිම්බෙන ආකාරයට ශරීරය ක්‍රමයෙන් විශාල වී නැවත හුළං පිටකරන විට සිරුරේ එක් එක් අවයව ලිහිල් වී සම්පූර්ණ සිරුර ම ලිහිල් වෙයි. හුළං සම්පූර්ණයෙන් පිට වී අවසන් වන විට බැලූනය මෙන් සිටින සිසුවා බිමට ම පතිත විය යුතු ය. හුළං පිරෙනවිට සිරුර සම්පූර්ණයෙන් ම විශාල වී යයි. මෙහිදී යටි පතුල් වලින් හුළං පිරවීම සඳහා අවශ්‍ය සිදුරු (වැල්වය) ඇතිසේ සලකන්න. මෙය දෙදෙනා මාරවෙන් මාරුවට සිදු කිරීමට සලස්වන්න.

**පියවර 04**

සිදුකරන ලද අභ්‍යාසයන් පිළිබඳව සිසුන්ගෙන් අදහස් විමසීම. ශිථිලකරණය රංගනය සඳහා ප්‍රයෝජනවත් වන අයුරු පෙන්වාදී ම, සිරුරේ නාම්‍යශීලීත්වය පෞද්ගලික ජීවිතයට ද වැදගත් බව ප්‍රකාශ කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

1. ශිථිලකරණ අභ්‍යාසවල නියැළීම
2. ශිථිලකරණ අභ්‍යාස කරන ආකාරය විස්තර කිරීම
3. ශිථිලකරණ අභ්‍යාස රංගනයට ප්‍රයෝජනවත් වන අයුරු ප්‍රකාශ කිරීම
4. මෙම අභ්‍යාස මගින් නිර්මාණකරණ හැකියාව ප්‍රදර්ශනය කිරීමට හැකිවීම
5. අවධානයෙන් සහ සාමූහික ව කටයුතු කිරීම

**නිපුණතාව 3.0 ៖ නාට්‍ය හා රංකලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම් හි නියැළෙයි.**

**නිපුණතා මට්ටම 3.2 ៖ රංග අභ්‍යාසවල නිරතවෙයි.**

**ක්‍රියාකාරකම 3.2.3 ៖ ශාරීරික හා මානසික සම්බන්ධතාව ඇති වන නිර්මාණාත්මක අභ්‍යාසවල යෙදෙමු**

**කාලච්ඡේද** ៖ 02

**ඉගැනුම් පල** ៖
- රංගනයේදී මනස හා ශරීරය අතර සම්බන්ධයක් ඇති බව අවබෝධ කර ගනියි.
- මනස හා ශරීරය අතර සම්බන්ධතාව ගොඩනැගෙන අභ්‍යාස ක්‍රම භාවිතා කරයි.
- මෙවැනි අභ්‍යාස මගින් ද නිර්මාණාත්මක පරිකල්පනය ඇතිකර ගනියි.

**ගුණාත්මක යෙදවුම්** ៖
-

**ක්‍රියාකාරකමක් සැලසුම් කිරීම සඳහා උපදෙස්** ៖

**පියවර 01** ៖
- සිසුන් නිදහස් අවකාශයකට රැගෙන අවකාශය පුරා ඇවිදීමට සලස්වන්න. ඇවිදින අතර ඔවුන් සමග පහත සඳහන් ආකාරයේ සාකච්ඡාවක ද යෙදෙන්න.
- රඟපෑමෙහිදී මනස හා සම්බන්ධ වී ශාරීරික ක්‍රියාවන් සිදු කරන බවත්
- චරිතයට අදාළ ශාරීරිකචලනයේ දී එය මනස තුළින් වටහාගෙන සිදු කළ යුතු බවත් ඒ සඳහා විවිධ අභ්‍යාසවල යෙදීම වැදගත් බවත් ප්‍රකාශ කරන්න.

**පියවර 02** ៖
- සිසුන්ට අවකාශය පුරා විසිරී සිටින ලෙස ප්‍රකාශ කරන්න. දෙපා මඳක් දුරස්ව තබාගෙන පහසුවෙන් සිටගන්න සලස්වන්න. ඉන්පසු දෑස් පියගෙන ගැඹුරින් ආශ්වාස ප්‍රශ්වාස කරන්න. සලස්වන්න.
- ගැඹුරින් ආශ්වාස කරන විට ශරීරය තුළ වන වෙනස අවබෝධ වන සේ එම ක්‍රියාවේ යො දවන්න. කිහිපවරක් ආශ්වාස ප්‍රශ්වාස කළ පසු මේ සිදුවීම ගැන කතා කරන්න. වෙනස මනසින් අවබෝධ කර ගැනීම ගැන විමසන්න.

**පියවර 03**
- නැවත අවකාශය තුළ ඇවිදින්න සලස්වන්න. පසුව නැවතී පහසුවෙන් සිටගෙන ශරීරයේ හිසෙහි සිට පාදාන්තය දක්වා කොටස ක්‍රමයෙන් ලිහිල් කිරීමට උපදෙස් දෙන්න.
- හිස, බෙල්ල, අත්, පපුව, උදරය, පාද ක්‍රමයෙන් ලිහිල් කරවන්න.
- ලිහිල් වූ කොටස පහතට කඩා වැටෙන්න සලස්වන්න.
- හොඳින් හුස්ම ගෙන ශරීරය ඍජු වූ පසු ව ක්‍රමයෙන් හුස්ම පිටකරනවාත් සමග ශරීර කොටස් ක්‍රමයෙන් ලිහිල් කරනවාත් සමග ම බිමට පතිතවීම සිදු කරන්න.
- නැවත හුස්ම ගැනීමත් සමග ශරීරාංග ඍජුව නැගිට සිටින ආකාරයට අභ්‍යාසය මෙහෙයන්න.
- මෙම අභ්‍යාසය කිහිප වාරයක් සිසුන්ට කිරීමට ඉඩ සලස්වන්න.

පියවර 04

- මෙම අභ්‍යාසය අවසානයේ නැවත සිසුන් සමග සාකච්ඡාවක් කරන්න. එහිදී සිදුකරන ලද කාර්යය ගැන ඔවුන් සමග සාකච්ඡා කරන්න. චරිතයට ප්‍රවිශ්ට වීමේදී ශාරීරික සහ මානසික සැහැල්ලුවක් සමග ඒ අංශ දෙක ම ඒකාබද්ධ වීම තුළින් රංගන කාර්යයේදී පහසුවක් ඇති වන බව පෙන්වාදීම

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

1. ශාරීරික සහ මානසික අභ්‍යාසවල නියැලීම
2. රංගනයේදී මෙම අභ්‍යාස ප්‍රයෝජනවත් වන අයුරු ප්‍රකාශ කිරිම
3. ශාරීරික සහ මානසික සම්බන්ධතාවට අදාළ රංග අභ්‍යාස නිර්මාණය කර ගැනීම
4. ශාරීරික සහ මානසික සම්බන්ධතාව සහිත අභ්‍යාස වලින් නිර්මාණාත්මක හැකියාවන් පෙන්වීම
5. චිත්ත ඒකාග්‍රතාවකින් යුතු ව කටයුතු කිරීම

නිපුණතාව 3.0 ඃ නාට්‍ය හා රංගකලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම් හි නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.3 ඃ නාට්‍ය කලාවට අදාළ හඬ අභ්‍යාසවල යෙදේ.**

**ක්‍රියාකාරකම 3.3.1 ඃ බුද්ධ ගජ්ඣය කියවමු.**

**කාලච්ඡේද** ඃ 02

**ඉගැනුම් පල** ඃ
- බුද්ධ ගජ්ඣය අදාළ විරිතට අනුව ගයයි.
- බුද්ධ ගජ්ඣයේ ඇති වචන නිවැරදි ව ශබ්ද කරයි.
- හඬ පැහැදිලි ව භාවිත කිරිමට හැකියාව ලබයි.
- රංගනයට ගැළැපෙන ආකාරයට කටහඬ සකස්කර ගැනීමට යොමුවෙයි.

**ගුණාත්මක යෙදවුම්** ඃ බුද්ධ ගජ්ඣය

**ක්‍රියාකාරකමක් සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

**පියවර 01** ඃ
- පන්ති කාමරය තුළ හෝ ඉන් පිටතට සිසුන් රැගෙන යන්න. සැමදෙනාට ම බුද්ධ ගජ්ඣය පිටපතක් බැගින් ලබාදෙන්න. එය සැමදෙනාට ම තනියම කියවා ගැනීමට අවස්ථාව ලබාදෙන්න.

**පියවර 02** ඃ බුද්ධ ගජ්ඣය උච්චාරණය කරන අයුරු ගුරුවරයා මගින් හෝ එය කියන ආකාරය පටිගත කළ ශබ්ද පටයක් මගින් හෝ ඇසෙන්නට සලස්වන්න. එය යම්කිසි විරිතකට කියවිය යුතු බව පෙන්වා දෙන්න.

**පියවර 03** ගුරු මග පෙන්වීම අනුව එය තනිවම කියවීම සඳහා සිසුන්ට උත්සාහ කරන්න අවස්ථාව දීම. එකිනෙකා ළඟට යමින් ඔවුන්ට එය කියවන ආකාරය අවබෝධ කරවන්න. එක් එක් අය ලවා හඬ නගා කියවීමට අවස්ථාව සලසන්න.

**පියවර 04** මෙම බුද්ධ ගජ්ඣය කියවීම දිගින් දිගට ම අභ්‍යාස කිරිම සඳහා සිසුන් යොමු කරන්න. සංවාද භාවිතයේදී නිවැරදි උච්චාරණය පුහුණුවීම සඳහා මෙය වැදගත් වන අයුරු පෙන්වා දෙන්න. ශබ්ද නගා කියවීමෙන් කටහඬ හැසිරවීමට අභ්‍යාසයක් ලැබෙන බවත්, ප්‍රබල හඬක්, පැහැදිලි හඬක් ඇතිකර ගැනීමට හේතු වන බවත් රංගනයට සුදුසු කටහඬක් ඇති කර ගැනීමට බුද්ධ ගජ්ඣය අභ්‍යාසය ඉවහල් වන බවත් පෙන්වා දෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

1. බුද්ධ ගජ්ඣය නිවැරදි ව හා නියමිත විරිතට අනුව කියවීම
2 බුද්ධ ගජ්ඣයේ එන කොටස් මතකයෙන් වුවද කීමට හැකිවීම
3. පැහැදිලි ව හඬ භාවිත කිරිමට යොමුවෙයි.
4. සබකෝලයෙන් මිදී වාචික සන්නිවේදනයේ යෙදෙයි.
5. මෙම ක්‍රියාකාරකම ඇසුරෙන් සාමූහික ව කටයුතු කිරීමට පෙළඹෙයි.

**පැවරුම** ඃ- බුද්ධ ගජ්ඣයේ කැමති කොටස් කිහිපයක් මතකයෙන් කීමට සූදානම් කිරීම
**අතිරේක උදව්** ඃ- බුද්ධ ගජ්ඣය

**නිපුණතාව 3.0 ඃ නාට්‍ය හා රංගකලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම් හි නියැළෙයි.**

**නිපුණතා මට්ටම 3.3 ඃ නාට්‍ය කලාවට අදාළ හඬ අභ්‍යාසවල යෙදේ.**

**ක්‍රියාකාරකම 3.3.2 ඃ ජන ගී ගායනා කිරීම (දල් ගී, වැදි ගී, යාතුකර්ම ගී වැනි)**

**කාලච්ඡේද** ඃ 03

**ඉගැනුම් පල** ඃ
- විවිධ ජන ගී හඳුනාගනී. (ගායනා කරන ලද අවස්ථා අනුව)
- දල් ගී, වැදි ගී, යාතුකර්ම ගී ගායනා කරන විවිධ තනු අනුව ගයයි.
- ඒ ඒ ගායනාවන් සඳහා භාවිත කරනු ලබන තාල අනුව ගයයි.
- එම ගීත රඟමින් ගයයි.

**ගුණාත්මක යෙදවුම්** ඃ
- දල් ගීයක්, වැදි ගීයක්, යාතුකර්ම ගීයක් බැගින් ලියන ලද පත්‍රිකා කීපයක්.
- එවැනි ගී අඩංගු ශ්‍රව්‍ය දෘශ්‍ය පට කීපයක්

**ක්‍රියාකාරකමක් සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

පියවර 01 ඃ
- දල් ගීයක්, වැදි ගීයක්, යාතුකර්ම ගීයක් ගායනය කරමින් හෝ අසන්නට සලස්වමින් පාඩමට පිවිසෙන්න.
- ගීත ලියන ලද පත්‍රිකා සිසුන්ට කණ්ඩායම් වශයෙන් ලබාදෙන්න. (කණ්ඩායම් තුනක් හෝ හයක් නම් වඩාත් සුදුසු වේ.

පියවර 02 ඃ
- කණ්ඩායම් අතර මාරු කරමින් ගීත වර්ග තුන ම සිසුන්ට ලිවීමට හා ගැයීමට අවස්ථාව සලසන්න.
- සිසුන් සියලුදෙනා සමඟ ම කවි ගයන්න.

පියවර 03
- ගුරුවරයාට නියම තාලානුකූල ව ගැයීමට හැකියාව නොමැතිවිට සංගීත ගුරුවරයා ගේ උදව් හෝ සපයාගෙන එන ලද ශ්‍රව්‍ය දෘශ්‍යපට ආධාර කොට ගන්න.

**පහත කරුණු ද උපයෝගී කරගෙන මේ පිළබඳව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.**
- දල් ගී, වෙරළේ දල් අදින මිනිසුන් ධීවරයින්) විසින් දල ගොඩට ඇදීමේදී ගයන ලද ගීත බවත්, දල ඇදීමේ රිද්මය මෙහි දක්නට ලැබෙන අයුරුත් පැහදිලි කරදෙන්න.
- තොවිල්වල දී උඩරට, පහතරට, සබරගමු වශයෙන් (තුන් සම්ප්‍රදායට ම) මෙම ශාන්තිකර්ම ගී ගායනා කරනු ලබන බවත්, ඒ සම්ප්‍රදායන්ට ආවේණික වූ තාල වාද්‍ය භාණ්ඩ භාවිත කරමින්, නියමිත නාදමාලා අනුව ගායනා කරන බවත් පවසන්න. විශේෂයෙන් ම මෙම ගීත, රඟමින් ගයනු ලබන බවත් බෙරහඬ පරයා ශබ්ද නගා ගායනා කරන බවත් පෙන්වා දෙන්න. කටහඬ අභ්‍යාස සඳහා මෙම ගීත යොදා ගැනීම වඩාත් උචිත බව උදාහරණ සහිත ව පෙන්වන්න.
- වැදි ජනයා අතර ප්‍රචලිත ව ඇති ගී වැදි ගී නම් වන බවත්, මේවායේ වචන එම වැදි සංස්කෘතියේ භාවිත කරන එම සමාජයට ආවේණික වූ වචන බවත් පැහැදිලි කරන්න.
- ගායනා කිරීමේදී විවිධ නාදමාලා අනුව විවිධ තාල අනුව ඔවුන්ට ආවේණික රංගන සහිතව ගයනු ලබන බවත් පෙන්වා දෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

01. නියමිත නාදමාලා අනුව ගායනා කිරීම
02. නියමිත තාලය අනුව ගායනා කිරීම
03. ශ්‍රැතියට අනුව ගායනා කිරීම
04. ආවේණික චලන සහිත ව හැඟීම් ප්‍රකාශ වන සේ ගායනා කිරීම
05. වැදි, දූල් හා ශාන්තිකර්ම ගී වල විවිධ වෙනස්කම් හඳුනා ගනිමින් අවබෝධයෙන් යුක්ත ව ගායනා කිරීම

**අතිරේක උදව් ඃ-** දූල් ගී, ශාන්තිකර්ම ගී හා වැදි ගී කීපයක්

**නිපුණතාව 3.0 ඃ** **නාට්‍ය හා රංගකලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම් හි නියැළෙයි.**

**නිපුණතා මට්ටම 3.4 ඃ** **සංවාද භාවිතයේ යෙදෙයි.**

**ක්‍රියාකාරකම 3.4.1 ඃ** **හඬ භාවිත කරමින් තෝරාගත් නාට්‍ය පෙළට අදාළ ව සංවාද භාවිත කරයි.**

**කාලච්ඡේද** ඃ 02

**ඉගැනුම් පල** ඃ
- සංවාද භාවිතයේදී හඬ නිවැරදි ව යොදාගනියි.
- නියමිත හැඟීම් ප්‍රකාශ වන පරිදි සංවාද භාවිත කරයි.
- සංවාද භාවිතය ප්‍රගුණ කරගැනීමට අවශ්‍ය හඬ අභ්‍යාසවල යෙදෙයි.
- හැඟීම් ප්‍රකාශවන පරිදි සංවාද උච්චාරණය කරන විට ගැළැපෙන ශාරීරික ක්‍රියාව හඳුනා ගනී.
- විවිධ හඬ අභ්‍යාසවල යෙදීම තුළින් චරිත නිරූපණ හැකියාව ලබයි.
- තෝරාගත් පෙළට ගැළැපෙන හඬ භාවිතයන් සකස් කර ගනියි.

**ගුණාත්මක යෙදවුම්** ඃ
-

**ක්‍රියාකාරකමක් සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

**පියවර 01** ඃ පන්ති කාමරයක සිටින සිසුන්ට සිය මේසය මත හිස තබා දෑස පියාගෙන සිටීමට උපදෙස් දෙන්න. නාට්‍යයක හෝ වෙනත් නිර්මාණයක විවිධ හැඟීම් ප්‍රකාශ වන උච්චාරණ සහිත හඬ පටයක් අසන්නට සලස්වන්න. අවසානයේ ඒ පිළිබඳව සාකච්ඡා කරන්න.
- මිනිසුන් තුළ විවිධ හැඟීම් ඇති බව
- ඒ හැඟීම් ශබ්ද, ස්වර සහ වචන මගින් ප්‍රකාශ වේ.
- හැඟීම් උද්දීපනය වන පරිදි අප වචන උච්චාරණය කළ යුතු ය.
- හැඟීම් සහ නිවැරදි අර්ථ ප්‍රකාශ වන පරිදි සංවාද උච්චාරණය කිරීමේදී ශ්වසන ක්‍රියාවලිය වැදගත් වන බව ප්‍රකාශ කරමින් ඒ සඳහා අවශ්‍ය වන අභ්‍යාසවලට යොමු කරවන්න.

**පියවර 02** ඃ
- සිසුන්ට සිට ගැනීමට සලස්වා ගැඹුරින් හුස්ම ගන්නා ලෙස පවසන්න. ගත් හුස්ම ''ආ'' ස්වරය මගින් සෙමින් පිටකරන්න. මෙය කිහිප වරක් කරන්න.
- මේ ''ආ'' ස්වරය ම යොදා ගනිමින් පහත දැක්වෙන ආකාරයේ අදහස් මතුවන සේ උච්චාරණය කරවන්න.
  - ගීතයක ආකාරයෙන්
  - වේදනාත්මක ආකාරයෙන්
  - බියමුසු ආකාරයෙන්
- ''ඕ'' ස්වරය ද මේ ආකාරට ම විවිධ අරුත් මතුවන ආකාරයට යොදාගන්න.
  ඕ.. යමකුගේ හඬට තමා සිටින බව දැක්වෙන ප්‍රතිචාරයක් ලෙස.
  එය,
  - ළඟ සිටින්නකු ගේ සිට දුර සිටින්නකු දක්වා.
  - ඕ.. ශාරීරික අපහසුතාවක් ඇතිවිටක නැලෙන ශබ්දයක් ලෙස
  - ''ඕ..යමක් දන්නා බව හඟවන ලෙස

| | | |
|---|---|---|
| **පියවර 03** | • | ඉහත ස්වර භාවිත කළාක් මෙන් විවිධ අදහස්, අරුත්, හැඟීම් ප්‍රකාශවන ලෙස වචන උච්චාරණයට අවස්ථාව සලසාදෙන්න.<br>- ''අම්මේ'', ''ඔන්න'', ''අයියෝ'', ''කව්ද ගෙදර'', ''වැඩට යනවා''. මෙම වචන ද විවිධ අර්ථ, හැඟීම් හා අවස්ථා ප්‍රකාශවන සේ උච්චාරණයට යොමු කරවන්න. |
| **පියවර 04** | • | මෙම අභ්‍යාසවලින් පසු ව ළමයින් විසින් රචනා කර ඇති නාට්‍යයේ දෙබස් විවිධ හැඟීම් අර්ථවත් වන ලෙස ළමයින් ලවා ම උච්චාරණය කරවීම .ළමයින් සමග එම සංවාද ඛණ්ඩවල ඇති අර්ථය හැඟීම් මතුකර ගැනීම සඳහා සාකච්ඡා කරමින් සංවාද උච්චාරණය කිරීම |
| | • | ඒ සමග ම සිසුන්ට පහත දැක්වෙන කරුණු පිළිබඳව ද අවබෝධය ලබාදෙන්න.<br>- හැඟීම්, අදහස් ප්‍රකාශය සඳහා කටහඬ ඉතා ම වැදගත් බව<br>- හැඟීම්වලට අනුකූල ව හඬ උස් පහත් කිරීම හා වෙනස් කිරීම කළ යුතු බව<br>- හඬ හා වචන පැහැදිලි ව උච්චාරණය කළ යුතු බව<br>- නාට්‍යයක හඬ, ශබ්දය මෙන් ම සංවාද භාවිතය ඉතා වැදගත් බව |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

01. හැඟීම් ප්‍රකාශනය සඳහා කටහඬ වැදගත් වන බව අවබෝධ කරගනී.
02. හැඟීම් ප්‍රකාශනය අනුව කටහඬ වෙනස්වන බව පිළිගනියි.
03. විවිධ හැඟීම් ප්‍රකාශවන අයුරින් කටහඬ හසුරුවයි.
04. අදහස් නිවැරදි ව හා නිරවුල් ව සන්නිවේදනය කරයි.
05. කටහඬ චතුර ලෙස භාවිත කරයි.

නිපුණතාව 3.0 නාට්‍ය හා රංගකලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම් හි නියැළෙයි.

නිපුණතා මට්ටම 3.5 ඃ නාට්‍ය ගීත ගායනා කරයි.

ක්‍රියාකාරකම 3.5.1 ඃ භාවාත්මක ව නාට්‍ය ගීත ගයමු.

කාලච්ඡේද ඃ 03

ඉගැනුම් පල ඃ
- නාට්‍ය ගීත රැස් කරයි.
- නාට්‍ය ගීත සරල ගී වලින් වෙනස් වන අයුරු පැහැදිලි කරයි.
- නාට්‍ය ගීත ආවේණික නාද මාලා අනුව ගායනා කරයි.
- නාට්‍ය ගීත භාවාත්මක ව ගායනා කරයි.
- නාට්‍ය ගීත ගයමින් රඟයි

ගුණාත්මක යෙදවුම් ඃ
-

ක්‍රියාකාරකමක් සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ

පියවර 01 ඃ
- නාට්‍ය ගීතයක් ගායනා කරමින් හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය පටයක් මගින් ඇසීමට සලස්වමින් පාඩමට පිවිසෙන්න.
- සිසුන් දන්නා සරල ගීතයක් ද ගායනා කරවා නාට්‍ය ගීතයේ හා සරල ගීතයේ ඇති වෙනස්කම් සාකච්ඡා කරන්න.

පියවර 02 ඃ
- නාට්‍ය ගීතයක් ගායනා කිරීමේ දී තාලය, ශ්‍රැතිය පමණක් නොව භාව ප්‍රකාශනය ද අත්‍යවශ්‍ය අංගයක් බව පැහැදිලි කරන්න.
- ගීතයේ නිවැරදි උච්චාරණය, හඬ පාලනය, ශබ්ද මාධූර්යය පිළිබඳව වඩාත් සැලකිලිමත් විය යුතු බව පෙන්වා දෙන්න.
- නියමිත තනුව, තාලය අනුව නාට්‍ය ගීත ගායනා කරවන්න.

පියවර 03
- ගායනා කරන ලද නාට්‍ය ගීත භාවාත්මක ව ගායනා කරවන්න.

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ.
- නාට්‍ය ගීත ගායනා කිරිම
- නාට්‍ය ගීත ගායනයේ තාලානුකූල හැකියාව පිරික්සීම
- ශ්‍රැතියේ පිහිටුවා ගායනය හා භාවයන් ප්‍රකාශ කරමින් ගායනය කිරීමේ හැකියාව පිරික්සීම
- හඬ පාලනය හා වේදිකාවට උචිත ලෙසින් ගායනයට දක්වන කුශලතාව විමසීම
- භාවාත්මක ව නාට්‍ය ගීත ගයමින් රංගනය කිරීම

අතිරේක උදව් ඃ * නාට්‍ය ගී ශ්‍රව්‍ය දෘශ්‍ය පට
* නාට්‍ය ගීත කීපයක් ලියන ලද පිටපත්

**නිපුණතාව 3.0 ඃ** **නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම් හි නියැළෙයි.**

**නිපුණතා මට්ටම 3.6 ඃ රංග ක්‍රීඩාවල නිරතවෙයි.**

**ක්‍රියාකාරකම 3..6.1 ඃ රංග ක්‍රීඩාවල යෙදෙමු**

**කාලච්ඡේද** ඃ 02

**ඉගැනුම් පල** ඃ
- රංග ක්‍රීඩාවේ යෙදෙයි.
- අවධානයෙන් යුතු ව කටයුතු කරයි.
- ක්ෂණික ව යමක් අවධාරණය කරගනියි.
- රංගන හැකියාවන් ලබයි.
- තරගකාරීත්වයෙන් යුතු ව කටයුතු කරයි.

**ගුණාත්මක යෙදවුම්** ඃ
- බ්‍රිස්ටල් බෝඩ් 4ක් හෝ 5ක්, විවිධ කාඩ්පත් සමූහයක්

**ක්‍රියාකාරකමක් සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

**පියවර 1** ඃ
- සිසුන් නිදහස් අවකාශයකට රැගෙන යන්න. විවිධ ද්‍රව්‍ය, ස්ථාන හා සංකල්ප දැක්වෙන වචන මාලාවක් ලියූ කාඩ්පත් කිහිපයක් සිසුන්ට පෙන්වා එය ඉවත්කර එසේ පෙන්වන ලද දේ නැවත සිසුන් ගෙන් විමසන්න. ඒ සඳහා සිසුන් කිහිපදෙනෙකුට අවස්ථාව සලසා දෙන්න. සිසුන්ගේ ප්‍රකාශ සලකා බලා අපට ක්ෂණිකව යමක් මතක තබාගැනීමට සහ නැවත ප්‍රකාශ කිරීමට හැකියාවක් තිබිය යුතු බව ප්‍රකාශ කරමින් එවැනි හැකියාවන් ලැබෙන රංග ක්‍රීඩාවකට සිසුන් යොමු කරවන්න.

**පියවර 2** ඃ රංග ක්‍රීඩාව සඳහා පහත සඳහන් ආකාරයේ කාඩ්පත් 4ක් සකස් කරගන්න. මේ සඳහා බ්‍රිස්ටල් බෝඩ් යොදාගන්න.

| 1 පත්‍රිකාව |
|---|
| A - දුක |
| B සතුට |
| C කෝපය |
| D පිළිකුල |

| 2 පත්‍රිකාව |
|---|
| A පිළිකුල |
| B කෝපය |
| C - සතුට |
| D දුක |

| 3 පත්‍රිකාව |
|---|
| A සතුට |
| B දුක |
| C පිළිකුල |
| D කෝපය |

| 4 පත්‍රිකාව |
|---|
| A දුක |
| B පිළිකුල |
| C සතුට |
| D කෝපය |

- සිසුන්ට අවකාශය තුළ නිදහස් ව ඇවිදීමට සලස්වන්න. එසේ ඇවිදිනවිට ප්‍රථමයෙන් ම 1 පත්‍රිකාව ප්‍රදර්ශනය කරන්න. තත්පර 30ක් වැනි කාලයකින් සිසුන්ට එහි ඇති ඉංග්‍රිසි අකුර සහ එයට අදාළ හැඟීම මතක තබාගන්නා ලෙස ප්‍රකාශ කරන්න.

එකවර ම ගුරුවරයා අකුර ප්‍රකාශ කළ විට ඇවිදීම නවතා අකුරට අදාළ හැඟීම නිරූපණය කරන්න. චලන හා වචන භාවිත කරන්න. ගුරුවරයා සංඥාවක් දුන් විට නිරූපණය නවතා නැවත අවකාශය තුළ ඇවිදින්න.

1 පත්‍රිකාවට අදාළ ව ඉංග්‍රීසි අකුරු පිළිවෙලින් ද අපිළිවෙලින් ද වෙනස් කරමින් කිහිපවරක් මෙම අභ්‍යාසයේ යොදවන්න. එයින් මෙම ක්‍රියාවලිය හොඳින් සිසුවාට තහවුරු වීමට ඉඩ සලසන්න.

**පියවර 3**

- 2 පත්‍රිකාව ප්‍රදර්ශනය කරන්න. නිවැරදි ව හා ක්ෂණික ව ක්‍රියාත්මක නොවන අය ඉවත්කිරීම මෙම අවස්ථාවේ සිට අරඹන්න. තරගයෙන් ඉවත් වන අය තරගයක නිරීක්ෂණය සඳහා සහය කරවාගන්න.
- ස්මරණය හා ක්ෂණික ව ක්‍රියාත්මක වීමේ හැකියාවෙන් සමන්විත සිසුන් වැඩිනම් අනෙක් පත්‍රිකා ද යොදාගන්න. අවසානයේ ඉතිරි වන ජයග්‍රාහකයාට අත්පොළසන් ලබාදී අගය කරන්න.

**පියවර 4**

- මෙම රංග ක්‍රීඩාව තුළින් අවධානය ස්මරණය සහ රංගන හැකියාවන් මෙන් ම සබකෝලයෙන් තොර ව කටයුතු කිරීමේ හැකියාව ද ඇති බව ප්‍රකාශ කරමින් සිසුන් තුළින් අත්විඳින ලද හැඟීම් පිළිබඳ ව විමසමින් ඔවුන්ට අදහස් ප්‍රකාශ කිරීමට ද කාලයක් ලබාදී අභ්‍යාසය අවසන් කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

01. රංග ක්‍රීඩාවල ස්වභාවය ප්‍රකාශ කරයි.
02. අවධානයෙන් යුතු ව කටයුතු කිරීම වැදගත් බව පෙන්වාදෙයි.
03. විවිධ රංග ක්‍රීඩාවල යොදයි.
04. ස්මරණ ශක්තිය ප්‍රදර්ශනය කරයි.
05. ස්මරණ ශක්තිය වැඩිදියුණු කරගැනීමට අභ්‍යාසවල යෙදෙයි.

නිපුණතාව 3.0 ඃ නාට්‍ය හා රංගකලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම් හි නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.7 ඃ අභිරූපණ රංගනයේ යෙදෙයි.**

**ක්‍රියාකාරකම 3.7.1 ඃ අභිරූපණයේ යෙදෙමු.**

**කාලච්ඡේද** ඃ 01

**ඉගනුම් පල** ඃ
- අභිරූපණ රංගනය යනු කුමක් ද යි පැහැදිලි කරයි.
- අභිරූපණයන් ඉදිරිපත් කරයි.
- ඒකල සහ සමූහ වශයෙන් අභිරූපණ රංග නිර්මාණය කිරීමේ හැකියාව ලබයි.
- අභිරූපණ රංගනයේ දැකිය හැකි මූලික ලක්ෂණ විස්තර කරයි.

**ගුණාත්මක යෙදවුම්** ඃ
- අභිරූපණ රංගයන් දැක්වෙන ඡායාරූපයක් හෝ කිහිපයක්

**ක්‍රියාකාරකමක් සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

පියවර 01 ඃ
- සිසුන් නිදහස් අවකාශයකට රැගෙන යන්න. කණ්ඩායම් කිහිපයකට බෙදන්න. එම කණ්ඩායම්වලට තමන් කැමති අදහසක්, අවස්ථාවක් වචනවලින් තොරව ක්ෂණික ව නිරූපණය කරන්නට ඉඩ සලසා දෙන්න. එක් කණ්ඩායමක් කරන ලද දේ අනිත් කණ්ඩායම පැහැදිලි කළ යුතු බව පෙන්වා දෙන්න. මෙහිදි වචනවලින් තොරව ආංගික සහ සාත්ත්වික අභිනය පමණක් යොදාගෙන අදාළ අවස්ථාව චරිත නිරූපණය කර ඇති බව පෙන්වා දෙන්න. මෙවැනි නිරූපණයක් අභිරූපණය යනුවෙන් හැඳින්වෙන බව ප්‍රකාශ කරමින් අභිරූපණ රංගනය පාඩම ආරම්භ කරන්න.

පියවර 02 ඃ
- අභිරූපණ රංගයනයන් දැක්වෙන ඡායාරූප පෙන්වමින් අභිරූපණ රංගය ගැන පැහැදිලි කරන්න.
- අභිරූපන යනු සංවාද භාවිත නොකර ආංගික සහ සාත්ත්වික අභිනය මගින් කිසියම් සිද්ධියක් හෝ අවස්ථාවක් නිරූපණය කිරීමයි. එය ප්‍රේක්ෂකයාට කුතුහලය දනෙන පරිදි ඉදිරිපත් කළ යුතු වේ. මෙම රංගනය සාමාන්‍ය නිරූපණයට වඩා තරමක් අතිශයෝක්තියෙන් ඉදිරිපත් කරයි.
- චලනවල ද යම්කිසි රිද්මයානුකූල බවක් තිබේ.
  අභිරූපණයේදී ශිල්පියා වෙස්ගන්වන විශේෂ ක්‍රමයක් ද ඇති බව (රූප උදාහරණ කර ගනිමන් අවබෝධ කරවන්න)
  මෙවැනි කරුණු සිසුන්ට පැහැදිලි කරදෙන්න.

පියවර 3
සිසුන් කණ්ඩායම්වලට පහත සඳහන් ආකාරයේ හෝ ඔබ කැමති වෙනත් ආකාරයේ මාතෘකා ලබාදී ඒවා අභිරූපණාත්මක ව නිරූපණය කරන්නට අවස්ථාව දෙන්න. යම්කිසි වේලාවක් පුහුණුව සඳහා ලබාදෙන්න.

**මාතෘකා සඳහා උදාහරණ ඃ**
- වෙළඳපොළක්
- කර්මාන්ත ශාලාවක්
- වොලිබෝල් ක්‍රීඩාව කරන අවස්ථාවක්

**පියවර 04** සිසුන් පුහුණු වූ සාමූහික අභිරූපණ රංගය කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම, ඉදිරිපත් කරන අභිරූපණ රංගයන් පිළිබඳ ව සිසුන් සහ ගුරුවරයා විසින් සාකච්ඡා කරමින් ඇගැයීමක් කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ .**

01. අභිරූපණය යන්න පැහැදිලි කරයි.
02. අභිරූපණ අවස්ථා නිරූපණය කිරීම තුළින් නිර්මාණාත්මක හැකියාව ප්‍රදර්ශනය වෙයි.
03. අභිරූපණ රංග අවස්ථා නිර්මාණය කරයි.
04. අභිරූපණ රංගයන් සාමූහික ව නිර්මාණය කරයි.
05. කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා ඉදිරිපත් වෙය

**අතිරේක උදව් ඃ** අභිරූපණ සම්බන්ධ වීඩියෝ පටයක් ප්‍රදර්ශනය

**නිපුණතාව 4.0 ඃ නාට්‍ය හා රංගකලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.**

**නිපුණතා මට්ටම 4.1 ඃ ආගමික කතා ඇසුරෙන් නාට්‍යමය අවස්ථා විමසයි.**

**ක්‍රියාකාරකම 4.1.1 ඃ ''ආගමික කතාවල නාට්‍යමය අවස්ථා සොයමු''**

**කාලච්ඡේද** ඃ 02

**ඉගැනුම් පල** ඃ

- ආගමික කතා එක්රැස් කරයි.
- එම කතා එක් එක් ආගමට අයත් වන පරිදි වර්ග කරයි.
- ආගමික කතාවල නාට්‍යෝචිත අවස්ථා විමසයි.
- ආගමික කතාවල සංස්කෘතික ලක්ෂණ සාකච්ඡා කරයි.

  ආගමික කතා ආශ්‍රයෙන් නාට්‍ය නිර්මාණය කරයි.

**ගුණාත්මක යෙදවුම්** ඃ ජාතක කතා හා වෙනත් ආගමික කතා ඇතුළත් පොත්, අතිරේක උදව් යටතේ දී ඇති කතා පිටපත්, ගුරුභවතාගේ අභිමතය පරිදි තෝරාගත් කතා වස්තු

**ක්‍රියාකාරකමක් සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

**පියවර 01** ඃ ආගමික කතා යනු කුමක් ද යි සිසුන් සමග සාකච්ඡා කරන්න. බෞද්ධ ආගමික කතා මෙන් ම වෙනත් ආගමික කතා සාහිත්‍යයක් ද අප සතු ව ඇති බව සඳහන් කරන්න. සිසුන් හා සමග කරන සාකච්ඡාවේදී ඔවුන් දෙන පිළිතුරු අනුව එම කතා එක් එක් ආගමට අදාළ වන පරිදි වර්ග කරන්න. (ආලවක දමනය, වෙස්සන්තර කතාව, පාස්කු නාට්‍ය වැනි නාට්‍ය පිළිබඳ ව මෙහිදි සඳහන් කළ හැකි ය)

**පියවර 02** ඃ

- උක්ත සාකච්ඡාවේ දී වඩාත් සිසුන්ගේ ආකර්ෂණයට ලක් වූ කතාන්දරයක් තෝරාගන්න. එම කතාව ආශ්‍රය කර ගනිමින් ආගමික කතාවලින් තත්කාලීන සමාජය නිරූපණය වන ආකාරයත්, සමාජ සංවර්ධනයට බලපාන ආකාරයෙන් එම කතා නිර්මාණය කර ඇති ආකාරයත්, සාකච්ඡා කරන්න. එම කතාවෙහි ඇති නාට්‍යෝචිත අවස්ථා ඉස්මතු කරගන්න. එම අවස්ථාව සඳහා චරිත යොදාගත හැකි ආකාරයත්, එම චරිත වේදිකාවේ රූපණය කළ හැකි ආකාරයත් පෙන්වා දෙන්න. එසේ ආගමික කතාවල එන අවස්ථා, සිද්ධි හා චරිත උපයෝගී කරගනිමින් නාට්‍ය නිර්මාණ කළ හැකි බව සිසුන්ට පැහැදිලි කරන්න.

**පියවර 03**

- නාට්‍යයක පෙළ රචනයේදී චරිත හා අවස්ථා හඳුනා ගැනීම සඳහා කතාව මැනැවින් අවබෝධ කරගත යුතු බවත්, කතාව මැනැවින් විශ්ලේෂණය කොට නාට්‍යමය අවස්ථා මතු කරගත යුතු බවත්, මෙහිදි වේදිකාව මත නිරූපණය කළ හැකි සිද්ධි පමණක් තෝරාගැනීම අත්‍යවශ්‍ය බවත්, උචිත පරිදි සංවාද ගොඩ නැගිය යුතු බවත්, නිර්මාණාත්මක පරිකල්පනය මේ සඳහා අත්‍යවශ්‍ය බවත් පෙන්වා දෙන්න. මෙම කරුණු අවධානයට ගනිමින් තමා කැමති කතා වස්තුවක් තෝරාගෙන සරල නාට්‍ය පෙළක් රචනා කරන්නට සිසුන් මෙහෙයවන්න. (සංවාද හා රංග විධාන භාවිත කරන ආකාරය සිසුන්ට පහදා දීම ඉතා වැදගත් වේ)

- නිදසුනක් වශයෙන් ආගමික කතා වස්තු කීපයක් අතිරේක උදව් යටතේ  සඳහන්කොට ඇත.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

01. ආගමික කතා වර්ග කිරීම
02. එහි ඇති නාට්‍යමය අවස්ථා තෝරා ගැනීම
03. සංවාද ගොඩ නැගීම
04. නිරූපණය සඳහා උචිතවන අයුරින් රංගවිධාන භාවිත කිරීම
05. නාට්‍ය පෙළ තුළින් ආගමික හා සමාජයීය කාර්යය ඉටු වී තිබීම (සාරධර්ම ගොඩනැගීම වැනි)

**නිපුණතාව 4.0 ඃ** **නාට්‍ය හා රංගකලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.**

**නිපුණතා මට්ටම 4.2 ඃ** **ආගමික කතා ඇසුරෙන් නාට්‍යමය අවස්ථා විමසයි.**

**ක්‍රියාකාරකම 4.2.1 ඃ** **''ආගමික කතාවල නාට්‍යමය අවස්ථා සොයමු''**

**කාලච්ඡේද ඃ** 02

**ඉගැනුම් පල ඃ**

- ආගමික කතා නාට්‍ය සඳහා යොදාගනියි.
- ආගමික නාට්‍ය සාරධර්ම ගොඩනැගීම සඳහා භාවිත කරයි.
- ආගමික කතා ඇතුළත් නාට්‍යය එක් රැස් කරයි.
- එබඳු නාට්‍යවල සංස්කෘතික හා සාමාජික අගය පහදයි.
- ආගමික නාට්‍ය අගය කරයි.

**ගුණාත්මක යෙදවුම් ඃ**

- ආගමික කතා ඇතුළත් නාට්‍ය පෙළ කීපයක්,
- එම නාට්‍ය හා බැඳුණු චිත්‍ර කීපයක් (කතාව ගොඩනැගෙන ආකාරයට)
- එම නාට්‍යවල අවස්ථා නිරූපණය වන ඡායාරූප

**ක්‍රියාකාරකමක් සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

පියවර 1 ඃ සූදානම් කරගෙන ආ චිත්‍ර උපයෝගී කරගනිමින් තෝරාගත් නාට්‍ය පෙළක් කෙටියෙන් විස්තර කරන්න. (මෙහිදි තම පාසල් පරිසරය පිළිබඳ ව සැලකිලිමත් වෙමින් සිසුන්ට වඩාත් සමීප ආගමික කතාවක් තෝරාගැනීම වැදගත් වේ) ආගමික කතා අංශ දෙකක් යටතේ විස්තර කරන්න. බෞද්ධ ආගමික කතා ඇතුළත් නාට්‍ය හා වෙනත් ආගමික කතා ඇතුළත් නාට්‍යවල තේමාව පිළිබඳ ව සාකච්ඡාවක් කරන්න. එබඳු කතා සමාජයේ බෙහෙවින් ජනප්‍රිය වී ඇති බවත්, එයට හේතුව ජන ජීවිතයට සමීප තේමාවන් යොදාගැනීම බවත් පැහැදිලි කරන්න.

පියවර 2 ඃ

- ශ්‍රී ලංකාවේ නාට්‍ය සඳහා ජාතක කතා සාර්ථක ව යොදාගෙන ඇති අවස්ථා පිළිබඳ ව සාකච්ඡා කරන්න. කදාවළලු (සේරිවාණිජ ජාතකය), පබාවතී (කුස ජාතකය), මනමේ (චුල්ල ධනුද්ධර ජාතකය), ලෝමහංස (ලෝමහංස ජාතකය), වෙස්සන්තර (වෙස්සන්තර ජාතකය), සඳකිඳුරු (සඳකිඳුරු ජාතකය) ආදි ජාතක කතා මෙන් ම බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වන කුණ්ඩලකේශී, ස්වර්ණතිලකා ආදි කතා නාට්‍ය සඳහා සාර්ථක ව යොදාගෙන ඇති ආකාරය විස්තර කරන්න.
- එමෙන් ම අන්‍යාගමික කතා වස්තු ද නාට්‍ය සඳහා යොදාගෙන ඇති ආකාරය පැහැදිලි කරන්න. සාන්තුවර සෙබළාණෝ ''නාට්‍යය මෙන් ම පාස්කු නාට්‍ය, හින්දු ආගමික නාට්‍ය ආදිය ජනජීවිත හා බැඳී ඇති ආකාරය පහදන්න. ඉග්නේෂස් ලොයෙලා මුනිවරයාගේ කතාව තේමා කොටගෙන සුගතපාල ද සිල්වා අතින් නිෂ්පාදනය වූ ' සාන්තුවර සෙබළාණෝ' බෙහෙවින් ජනප්‍රිය නාට්‍යයක් බව පැහැදිලි කරන්න.

පියවර 3 ඉහත දැක්වූ ඕනෑ ම නාට්‍යයක කතා වස්තුවක් හා තේමාවක් ඇති බවත්, නාට්‍යෝචිත අවස්ථා තෝරාගෙන පරිකල්පනය උපයෝගි කරගනිමින් එය නාට්‍ය නිෂ්පාදනයක් දක්වා විකාසනය කිරීම නාට්‍යකරුවාගේ කාර්යය බවත්, සමාජයට වැඩදායක වන අයුරින්

මෙම ආගමික කතා නාට්‍ය සඳහා යොදාගැනීම ඉතා වැදගත් බවත් ප්‍රකාශ කරන්න.
ආගමික කතා ආශ්‍රයෙන් ගොඩනැගුණු නාට්‍ය පෙළ 10ක් සිසුන්ට ලබාදෙන්න. සිසුන් කණ්ඩායම් දෙකකට බෙදා එක් කණ්ඩායමකට නාට්‍ය පෙළ 05ක් ලැබෙන සේ ඒවා බෙදා දෙන්න.
ඉන්පසු පහත දී ඇති වගුව ප්‍රයෝජනයට ගනිමින් තම කණ්ඩායමට ලැබී ඇති නාට්‍ය පෙළ ආශ්‍රය කරගෙන කරුණු රැස්කරන්න.
කාර්යය අවසානයේ පත්‍රිකා 10 එක්කොට පොත් පිංචක් ලෙස සකස් කරන්න. එය සිසුන් ගේ කියැවීම සඳහා පන්ති පුස්තකාලයේ හෝ විෂය නිර්මාණ ගොනුවේ තැන්පත් කර තබන්න.

## තොරතුරු පත්‍රිකාව

තෝරාගත් කතාවේ නම ..........................................................................................................
කතාවේ තේමාව ..........................................................................................................
කතා පුවත කෙටියෙන් ..........................................................................................................
නාට්‍යයේ නම ..........................................................................................................
යොදාගෙන ඇති චරිත ..........................................................................................................
නළු-නිළියෝ ..........................................................................................................
සංගීතය ..........................................................................................................
අංග රචනය ..........................................................................................................
වේෂභූෂණ නිර්මාණය ..........................................................................................................

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

01. නාට්‍ය සඳහා යොදගත හැකි ආගමික කතා තෝරාගැනීම
02. නාට්‍ය තේමාව ප්‍රකාශ කිරීම
03. නාට්‍යයේ චරිත හඳුනාගැනීම
04. ආනුෂංගික කලා යොදාගෙන ඇති ආකාරය ප්‍රකාශ කිරීම
05. නාට්‍යෝචිත අවස්ථා තෝරාගැනීම

**නිපුණතාව 4.0 ඃ** **නාට්‍ය හා රංගකලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.**

**නිපුණතා මට්ටම 4.3 ඃ** **සාරධර්ම ගොඩ නැගීම සඳහා ආගමික කතා ඇසුරින් ගොඩනගා ගත් නාට්‍ය ඉවහල් කරගනියි.**

**ක්‍රියාකාරකම 4.3.1 ඃ** ''ආගමික රංගයෙන් සරු දහම් ගොඩනගමු''

**කාලච්ඡේද** ඃ 02

**ඉගැනුම් පල** ඃ

- ආගමික නාට්‍ය විමර්ශනය කරයි.

- ආගමික නාට්‍යවලින් උකහාගත හැකි සාරධර්ම විනිශ්චය කරයි.
- සාරධර්ම ගොඩනැගෙන ආකාරයේ ආගමික නාට්‍ය නිර්මාණය කරයි.
- සාරධර්ම ගොඩනැගීම සඳහා ආගමික නාට්‍ය භාවිත කරයි.

**ගුණාත්මක යෙදවුම්** ඃ

- බෞද්ධ ආගමික කතා හා වෙනත් අගමික කතා ඇසුරින් නිපදවා ඇති නාට්‍යයක දෘශ්‍ය පටයක්
  නාට්‍ය පෙළ කීපයක් (4.2 නිපුණතා මට්ටමේ භාවිත කළ)

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

පියවර 1 ඃ

- පෙර පාඩමේදී උගත් ආගමික කතා ඇසුරින් නිපදවා ඇති නාට්‍ය පිළිබඳ ව විමසමින් එහි දී කියැවුණු නාට්‍ය පෙළකට ආදළ දෘශ්‍ය පටය සිසුන්ට නැරඹීමට අවස්ථාව සලසාදෙන්න.

පියවර 2 ඃ

- බෞද්ධාගමික කතා හා වෙනත් ආගමික කතා ඇසුරින් ගොඩ නගා ගත් නාට්‍යවල අරමුණු පිළිබඳව පුළුල් වශයෙන් සාකච්ඡා කරන්න.
- එම අරමුණු අතර, සාරධර්ම ගොඩ නැගීම වැදගත් අරමුණක් බව පැහැදිලි කරන්න. චරිත, සිද්ධි හා අවස්ථා උපයෝගී කරගනිමින් නාට්‍යානුසාරයෙන් සාරධර්ම ගොඩනැගීම වඩාත් සාර්ථක ක්‍රමයක් බවත්, ඒ අනුව සාරධර්ම ගොඩනැගීමෙහි ලා සුවිසල් කාර්ය භාරයක් ආගමික නාට්‍යවලින් සිදුකළ හැකි බවත් පහදා දෙන්න.
- නරඹන ලද නාට්‍යය ඇසුරු කරගනිමින් එයින් ගොඩනැගෙන සාරධර්ම පිළිබඳව සිසුන් සමග සාකච්ඡා කරන්න. ඒම සාරධර්ම ජීවිතයේ සංවර්ධනය සඳහාත්, සමාජ සංවර්ධනය සඳහාත් යොදාගත හැකි බව පෙන්වා දෙන්න.

පියවර 3

- සිසුන් උචිත පරිදි කණ්ඩායම් කොට ඔවුන් විසින් සපයනු ලබන නාට්‍ය පෙළ කීපය එම කණ්ඩායම්වලට ලබා දෙන්න. එම නාට්‍යවල දක්නට ලැබෙන සාරධර්ම වෙන් වෙන් ව සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න. කාර්යය අවසානයේ තම කණ්ඩායම විසින් රැස්කර ගනු ලැබූ කරුණු අනිකුත් කණ්ඩායම්වල දැනගැනීම සඳහා ඉදිරිපත් කිරීමට සෑම කණ්ඩායමකට ම අවස්ථාව ලබාදෙන්න.
- එම සාරධර්ම තම ජීවිතයට හා සමාජයට වැඩදායක අයුරින් යොදාගත හැකි ආකාරය පැහැදිලි වන අයුරින් කථාවක් ඉදිරිපත් කිරීමට එක් සිසුවකුට ඉඩ ලබාදෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

- නාට්‍යානුසාරයෙන් සාරධර්ම ගොඩ නැගිය හැකි බව ප්‍රකාශ කිරීම
- නාට්‍යවල දක්නට ලැබෙන සාරධර්ම හඳුනාගැනීම
- හඳුනාගත් සාරධර්ම ලැයිස්තු ගත කිරීම
- ජීවිත සංවර්ධනය සඳහා සාරධර්ම යොදාගත හැකි ආකාරය වටහා ගැනීම
- සමාජ සංවර්ධනය සඳහා සාරධර්ම ඇතුළත් ආගමික නාට්‍ය යොදාගත හැකි බව ප්‍රකාශ කිරීම

**නිපුණතාව 4.0 ඃ නාට්‍ය හා රංගකලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.**

**නිපුණතා මට්ටම 4.4 ඃ ආගමික නාට්‍යවල ඇති සංස්කෘතික හා සමාජික අගය පිළිබඳව විමසයි.**

**ක්‍රියාකාරකම 4.4.1 ඃ ආගමික තේමාවන් රැගත් නාට්‍යවල සංස්කාතික හා සමාජික අගයන් හඳුනාගනිමු.**

**කාලච්ඡේද** ඃ 02

**ඉගැනුම් පල** ඃ
- ආගමික නාට්‍යවල අගයන් පැහැදිලි කරයි.
- ආගමික නාට්‍යවල අගයන් සමාජ සංවර්ධනය සඳහා යොදා ගන්නා අයුරු ප්‍රකාශ කරයි.
- සමාජයට වැඩදායක නාට්‍ය නිර්මාණය කරයි.
- ආගමික නාට්‍යවල සමාජීය හා සංස්කෘතික ලක්ෂණ විමසයි.
- චරිත සංවර්ධනය සඳහා ආගමික නාට්‍යය යොදාගනී.

**ගුණාත්මක යෙදවුම්** ඃ
- 4.2 හා 4.3 සම්බන්ධ දෘශ්‍යාධාරක

**ක්‍රියාකාරකමක් සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

පියවර 1 ඃ
- පෙර දැනුම විමසමින් ආගමික තේමා රැගත් නාට්‍ය පිළිබඳ සාකච්ඡාව ආරම්භ කරන්න.
  තත්කාලීන සමාජය නාට්‍යය තුළින් නිරූපණය වී
  ඇති ආකාරය - සිසුන් විසින් නරඹන ලද නාට්‍ය ආශ්‍රය කරගනිමින් විමසන්න.

පියවර 2 ඃ
- ආගමික කතා තේමා කොටගෙන නිර්මාණය කෙරුණු නාට්‍යවලින් කාලීන සමාජයේ සංස්කෘතික ලක්ෂණ අවබෝධ කරගත හැකිබවත්, සමකාලීන සමාජය සකස් වී ඇති ආකාරය එම නාට්‍ය
  අධ්‍යයනයෙන් වටහා ගත හැකි බවත්, සිසුන්ට පැහැදිලි කරදෙන්න.
- තෝරාගත් නාට්‍යයක් (දෘශ්‍ය පටයක් හෝ පෙළක්) උපයෝගී කරගනිමින් එහි සංස්කාරක හා සාමාජික වටිනාකම් පිළිබඳ සාකච්ඡා කරන්න. ප්‍රේක්ෂකයන් අතර නාට්‍යයක් ජනප්‍රිය වීමට ඉහත සඳහන් වටිනාකම් බෙහෙවින් ම බලපාන බව පැහැදිලි කරන්න.

පියවර 3
- ඉහත පාඩම්වල දී ඔබ විසින් භාවිත කරන ලද නාට්‍ය පෙළ කීපය පිළිබඳ සාකච්ඡා කරමින් එම නාට්‍ය පිටපත්වල තිබෙන සංස්කෘතික හා සමාජික වටිනාකම් සහිත අවස්ථා හඳුනාගැනීමට සිසුන්ට සහාය වන්න. ඉන්පසු -
  **''ආගමික කතා තේමා කොටගත් නාට්‍යවල දක්නට ලැබෙන සංස්කෘතික හා සමාජික වටිනාකම්''**
  යන මාතෘකාව යටතේ බිත්ති පුවත්පතකට සුදුසු ලිපියක් සකස්කිරීමට සිසුන්ට අවස්ථාව ලබාදෙන්න. හොඳ ම නිර්මාණ පාසල් බිත්ති පුවත්පතෙහි පළකරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

01. ආගමික නාට්‍යවල ඇති අගයන් පැහැදිලි කිරීම
02. එම අගයන් සමාජ සංවර්ධනය සඳහා යොදාගත හැකි ආකාරය පැහැදිලි කිරීම
03. ආගමික නාට්‍යවල සංස්කෘතික ලක්ෂණ විමැසීම
04. සංස්කෘතික වටිනාකම් සහිත ආගමික කතා පදනම් කරගත් නාට්‍යය නම් කිරීම
05. අදහස් ලිඛිත ව ප්‍රකාශ කිරීමේ හැකියාව පෙන්වීම

**නිපුණතාව 4.0 ඃ නාට්‍ය හා රංගකලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.**

**නිපුණතා මට්ටම 4.4 ඃ විවිධ ආගමික උත්සවවලදී උක්ත නාට්‍ය ප්‍රදර්ශනය කරයි.**

**ක්‍රියාකාරකම 4.4.2** ඃ ''නාට්‍ය හදමු. රඟ දක්වමු''

**කාලච්ඡේද** ඃ 02

**ඉගැනුම් පල** ඃ

- ආගමික උත්සව සඳහා නාට්‍ය නිර්මාණය කරයි.
- වේෂභූෂණ නිර්මාණය කරයි.
- නාට්‍යෝපකරණ සකස් කරයි.
- සමාජ සංවර්ධනය සඳහා නාට්‍ය යොදාගනියි.
- ආගම ඉගැන්වීම සඳහා නාට්‍ය ඉවහල් කරගනියි.

**ගුණාත්මක යෙදවුම්** ඃ

- නාට්‍යෝචිත අවස්ථා ඇතුළත් ආගමික කතා කීපයක්, වේෂභූෂණ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය, නාට්‍යෝපකරණ (තෝරාගන්නා නාට්‍ය පෙළට අදාළවන පරිදි)

**ක්‍රියාකාරකමක් සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

පියවර 1 ඃ

- ආගමික උත්සවවලදී සිසුන් දැක ඇති නාට්‍ය පිළිබඳ ව සාකච්ඡා කරමින් පාඩමට පිවිසෙන්න. එම නාට්‍ය රඟ දැක්වීමට පදනම් වූ පාරිසරික තත්ත්වයන් ගැන පැහැදිලි කරන්න. එම නාට්‍ය කීපයක් ආශ්‍රය කොටගෙන එහි විනෝදාස්වාදය පමණක් නොව සමාජ වටිනාකම් රැසක් ද ඇති බව පැහැදිලි කරන්න.

පියවර 2 ඃ

- උක්ත සාකච්ඡාවෙන් අවධාරණය වන කරුණු අනුපිළිවෙළට ගොනුකරන්න.
- ආගමික උත්සවවලදී ආගමික කතා ආශ්‍රය කොටගෙන නිර්මාණය කළ නාට්‍ය රඟදක්වන බවත්, පොදු ජනතාව එම නාට්‍ය ඉතා ආශාවෙන් නරඹන හෙයින් ජනතාව ඒකරාශී කරගැනීමට වඩාත් උචිත මාධ්‍යයක් වශයෙන් ආගමික සිද්ධස්ථාන විසින් එබඳු නාට්‍ය භාවිත කරනු ලබන බවත්, විනෝදාස්වාදය ලබාදෙන අතර ම සමාජ සංවර්ධනය උදෙසා සංස්කෘතික වටිනාකම් රැසක් උක්ත කාර්යය තුළින් අපේක්ෂා කැරෙන බවත්, ආගමික උත්සව වඩාත් ජනප්‍රිය කරවීම සඳහා අදාළ සංසිද්ධින් නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කිරීම සාර්ථක ක්‍රමයක් බවත් අවධාරණය කරන්න.
- කිසියම් කතා වස්තුවක් රංගයක් බවට පත් කිරීමට නම් පළමුව එහි නාට්‍යෝචිත අවස්ථා හඳුනාගත යුතු බවත්, අනතුරු ව සංවාද ගොඩ නැගිය යුතු බවත්, නළු නිළියන් තෝරා ගැනීම හා ඔවුන් පුහුණු කිරීම අත්‍යවශ්‍ය බවත්, එම භූමිකාවලට අදාළ වේෂභූෂණ හා නාට්‍යෝපකරණ සකස් කරගත යුතු බවත්, එසේ සකස් කරගනු ලබන නාට්‍යය ආගමික උත්සව අවස්ථාවල දී ප්‍රදර්ශනය කිරීමට හැකියාව ඇති බවත් පහදාදෙන්න. එබඳු ක්‍රියාවලින් සමාජ සංවර්ධනයට දායක වීමට ලැබෙන අවස්ථාව ජීවිතයට ඉතා වටිනා බව ද සිසුන්ට පැහැදිලි කරන්න.

පියවර 3

- සිසුන් කණ්ඩායම් තුනකට බෙදා බෞද්ධ, හින්දු හා කතෝලික ආගමික කතාවක් බැගින් එක් එක් කණ්ඩායමට ලබාදෙන්න. (මේ සඳහා ඉහත පාඩම්වල දී ලබා දී ඇති නිදර්ශන හෝ ඔබගේ / සිසුන්ගේ අභිමතය පරිදි තෝරාගන්නා ලද කතා වස්තුවක් වුව ද යොදාගත හැකි ය.) ලබාදුන් කතා වස්තුවේ නාට්‍යෝචිත අවස්ථා තෝරා-බේරා-ගෙන සංවාද ගොඩනැගීමට උපදෙස් දෙන්න. ඒ ඒ චරිතවලට අවශ්‍යවන වේෂභූෂණ හා නාට්‍යෝපකරණ සකස් කිරීමට උපදෙස් දෙන්න. නළු නිළියන් තෝරාගෙන ඔවුන්ට පුහුණුවීම සඳහා කාලයක් ලබාදෙන්න.
- නාට්‍යය වේදිකාගත කොට එහි සකස් විය යුතු තැන් සකස් කරන්න.
- ප්‍රදේශයේ ආගමික උත්සව අවස්ථාවල දී සිසුන් සහභාගි කිරීමට අවස්ථාවක් තිබේ නම් සිසුන්ට එම අත්දැකීම ලබා ගැනීමට ඉඩ ලබා දෙන්න.
- එසේ ම සිසුන් ලබාගත් දැනුම පදනම් කොටගෙන දහම් පාසලේ දී, ළමා සමාජවල දී හා වෙනත් අවස්ථාවල දී ආගමික කතා වස්තු උපයෝගී කරගනිමින් නාට්‍ය රඟදැක්වීමටත්, එමගින් සමාජයට වැඩදායක යමක් සන්නිවේදනය කිරීමටත් සිසුන් පොළඹවන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

01. ආගමික නාට්‍ය ප්‍රදර්ශනය කිරිමේ අරමුණු පැහැදිලි කිරීම
02. ආගමික කතා වස්තුවල නාට්‍යෝචිත අවස්ථා තෝරා-ගෙන සංවාද ගොඩනැගීම
03. වේෂභූෂණ හා නාට්‍යෝපකරණ සකස්කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කිරීම
04. චරිත මැනැවින් නිරූපණය කිරීම
05. සමාජ සංවර්ධනය සඳහා ආගමික කතා නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කිරීමට කැමැත්ත ප්‍රකාශ කිරීම

**නිපුණතාව 4.0 ඃ** **නාට්‍ය හා රංගකලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.**

**නිපුණතා මට්ටම 4.5 ඃ** **සංස්කෘතික හා සමාජික වටිනාකම් සහිත තේමා රැගත් නාට්‍යමය අවස්ථා නිර්මාණය කරයි.**

**ක්‍රියාකාරකම 4.5.1 ඃ** **හොඳ සිරිත් පිළිපදිමු.**

**කාලච්ඡේද** ඃ 02

**ඉගැනුම් පල** ඃ
- සිරිත් මල්දම කෘතියේ තෝරාගත් කොටස ශබ්ද නගා කියවයි.
- එම කවිවලින් කියැවෙන කරුණු විස්තර කරයි.
- එම කරුණුවල එන නාට්‍යරූපී ගුණය විමසයි. එම අවස්ථා රූපණය කරයි.
- සිරිත් මල්දම කෘතියෙහි එන සත් සිරිත් විමසයි.

**ගුණාත්මක යෙදවුම්** ඃ සිරිත් මල්දම පොත උපුටාගත් කොටසෙහි ඡායා පිටපත්

**ක්‍රියාකාරකමක් සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

පියවර 1 ඃ
- 7 වැනි ශ්‍රේණියේදී ජීවිතය යහමගට හරවන සිරිත් පිළිබඳ ව 'සිරිත් මල්දම' කෘතිය ආශ්‍රයෙන් උගත් කරුණු සිහිපත් කරමින් පාඩමට අවතීර්ණ වන්න. යහපත් සමාජයක් ගොඩනැංවීම සඳහා සිරිත් මල්දමෙහි එන කරුණු අතර සමාජ ශෝධනය අරමුණු කරගත් උපදෙස් ඇති බව සඳහන් කරන්න.

පියවර 2 ඃ
- අතිරේක උදව් යටතේ දී ඇති කවි කිහිපය පිටපත් කොට සිසුන්ට බෙදා දෙන්න. ගුරු භවතා හෝ ගායනයෙහි දක්ෂ සිසුවෙකු මූලික වෙමින්, එම කවි තාලානුකූල ව ශබ්ද නගා ගායනා කරන්න. ඉන්පසුව කවිවල අර්ථ පැහැදිලි කරන්න.
  එම කවිවලින් කියැවෙන කරුණු ආශ්‍රය කරගනිමින් නාට්‍යෝචිත අවස්ථා පිළිබඳ ව සාකච්ඡා කරන්න. මත්පැන්, දුම්කොළ, ආදී දේ භාවිත කිරිම මගින් පුද්ගල සෞඛ්‍යය පිරිහීම මෙන් ම සමාජමය වශයෙන් සිදුවන පරිහානිය ද පිළිබිඹු වන සේ එම නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය කිරිම කෙරෙහි සිසු අවධානය යොමු කරවන්න.

පියවර 3

සිසුන් කණ්ඩායම්වලට බෙදා උපුටාගත් කවි සඳහන් පත්‍රිකා කණ්ඩායම්වලට ලබාදෙන්න. එම කවි ආශ්‍රයෙන් නාට්‍යමය අවස්ථාවක් ක්ෂණික ව නිරූපණය කිරීමට අවස්ථාව ලබාදෙන්න. ( සූදානම් වීම සඳහා මිනිත්තු 15ක් වැනි සීමිත කාලයක් ලබාදෙන්න)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

01. සිරිත්මල්දමේ කවි ශබ්ද නගා කියවීම
02. කවිවල අර්ථ ප්‍රකාශ කිරිම
03. නාට්‍යෝචිත අවස්ථා තෝරා ගැනීම
04. තෝරාගත් නාට්‍යමය අවස්ථා රූපණය කිරිම
05. ක්ෂණික නිරූපණයෙහි දක්ෂතාව ප්‍රදර්ශනය කිරීම

**අතිරේක උදව් ඃ**

1. සැමට සෙත් වඩවන
   සිරිත් මල්දම බලමින
   සිරිත් හොඳ දැනගෙන
   මහත් යසසරි ලබනු දෙලොවින

2. වැඩක නොයෙදූ සිත
   නරක අතට ම පෙරළෙන
   කිමෙක වන යහපත
   වැඩක එබැවින යොදනු තමසිත

3. කටයුතු කිරීමය
   නොකටයුතු නොකිරීමය
   අණ පිළිපැදීමය
   මෙතුන් ගුණ දියුණුවේ මගමය

4. උසස් කුල උපතත්
   දහස් ගම්බිම් තිබුණත්
   පිරිස් බල සිටියත්
   උසස් නැත සිප් සතර නැතහොත්

5. ගතු ඇසු පමණින් බාර නොගන්නේ
   සිතු ලෙස සොයමින් අදහා ගන්නේ
   ගතු බොරු කියමින් ලොවනොනසන්නේ
   සතු දොස තරමින් තමනො නැසෙන්නේ

6. බයෙන් තැවුල් අය ළඟ නොනිදන්නේ
   දිරූ ගෙවල් ගස් ළඟ නොසිටින්නේ
   පාළු ගෙවල් ළිං ළඟ නොසිටින්නේ
   දෙමැද දවල් තනිමග නොමයන්නේ

7. සුරුට්ටු බීමෙන් හදවත විසවෙයි
   ඇඟපත දිරුමෙන් කටගඳ ඇතිවෙයි
   මත්ගති වීමෙන් නුවණ ද අඩුවෙයි
   කැස්ස ද සැදුමෙන් ආයුෂ කොටවෙයි

8. දුම්කොළ හැපුමෙන් දත්මුල් කුණුවෙයි
   කඩ ගඳවීමෙන් වස පිළිකුල් වෙයි
   කෙළ වැගිරීමෙන් දිව රස අඩුවෙයි
   බල අඩුවීමෙන් සිහිය ද මඳවෙයි

9. බුලත් විකීමෙන් දත්මුල් කැතවෙයි
   දිව රළු වීමෙන් හඬ අම්හිරි වෙයි
   කට කැතවීමෙන් ඇඳුම ද කැත වෙයි
   වැඩ පසුවීමෙන් කාලෙද නැතිවෙයි

10. මත් පැන් බීමෙන් ලේ කෝපය වෙයි
    වෛරිමත් වීමෙන් සිහි විකලය වෙයි
    බල අඩුවීමෙන් නෙක ලෙඩ ඇති වෙයි
    දුප්පත් වීමෙන් අකල් මරණ වෙයි

11. කෑමට බොහොම පලතුරු ඇත තැනින් තැන
    සැපතට නිතර හිතවෙයි ඒ රසබොජුන
    ලොබ කොට සතුන් නොමරනු මස්කෑම ගැන
    සතහට දුකක් දී තම රැකෙනු ද යෙහෙන

12. සැපතට සිතා මත් පැන් විස බොනු කුමට
    බීමට අපට පැන් ඇති මිහිපිට කුමට
    වදයට දෙලොව පැමිණෙයි ඒ පව්කමට
    ලොබකොට නොබොනු මත්පැන් කිසි කලසැපට

13. ලොබකර දන මිලට දියුණුව පතාගෙන
    ගොරතර අවමඟට තුන්දොර නමාගෙන
    කරදර අන් අයට කරමින් තැනින් තැන
    හිරිහැර සුදුවට නොබසින් අවැඩ දැන

(උපුටා ගැනීම- සිරිත්මලදම)

**නිපුණතාව 5.0 ඃ නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මක ව විඳ ගැනීම හා මානව හිතවාදියකු ලෙස සමාජගත වීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.**

**නිපුණතා මට්ටම 5.1 ඃ නාට්‍ය පෙළ රසවිඳියි. (නිර්දිෂ්ට නාට්‍ය පෙළ ඇසුරින්)**

**ක්‍රියාකාරකම 5.1.1 ඃ 'මාෂා හා වළහා' කතා වස්තුව රසවිඳියි.**

**කාලච්ඡේද** ඃ 02

**ඉගැනුම් පල** ඃ
- නාට්‍ය පෙළෙහි සිදුවීම් තුළ ඇති හාස්‍යමය බව විස්තර කරයි.
- අවස්ථා නිරූපණය තුළ මතු කරනු ලැබූ විවිධ හැඟීම් ප්‍රකාශ කරයි.
- පෙළෙහි සංවාද මගින් නැඟෙන රසය පැහැදිලි කරයි.
- පෙළෙහි ගීත මගින් නැඟෙන රසය ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම්** ඃ 'මාෂා හා වළහා' පිටපත

**ක්‍රියාකාරකමක් සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

**පියවර 1** ඃ
- නාට්‍ය පෙළහි කතා වස්තුව කෙටියෙන් දක්වමින් සිසුන් සමග ගුරු භවතා එය රස විඳීමක යෙදෙයි. පසුව සිසුන් කණ්ඩායම් කීපයකට බෙදා නාට්‍ය පෙළහි දක්නට ලැබෙන හාස්‍යෝත්පාදක බවින් යුතු සිදුවීම් පෙළ ගැස්වීමට සලස්වන්න.

**පියවර 2** ඃ
- කණ්ඩායම් මගින් පෙළෙහි විවිධ අවස්ථා නිරූපණය තුළ මතු කරනු ලබන විවිධ හැඟීම් පෙළගස්වා ලියවන්න.

**පියවර 3**
- පෙළෙහි සංවාද කීපයක් හා ගීත කීපයක් තෝරාගෙන එහි අවස්ථානුකූල රසය ඉදිරිපත් කරවන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

01. පෙළෙහි හාස්‍යෝත්පාදක අවස්ථා ප්‍රකාශ කිරීම
02. පෙළෙහි සංවාද හා ගීත සතුටින් උච්චාරණය කිරීම
03. පෙළෙහි විවිධ හැඟීම් සහිත අවස්ථා කීපයක් චිත්‍රයට නැගීම
04. විවිධ අවස්ථා තුළින් ජීවිතයට ගත හැකි පාඩම් කීපයක් ප්‍රකාශ කිරීම
05. පෙළෙහි ගීත ඇසීමට කැමැත්තක් දැක්වීම

**පැවරුම ඃ-** පෙළෙහි ඇතුළත් ගීත කීපය ලියන්න.

**අතිරේක උදව් ඃ-** ''මාෂා හා වළහා'' කතා පුවතට සමාන දේශීය හා විදේශීය ජනකතා කියවා රස විඳින්න.

නිපුණතාව 5.0 ඃ නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මක විඳ ගැනීම හා මානව හිතවාදියකු ලෙස සමාජගතවීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 5.1 ඃ නාට්‍ය පෙළ රස විඳියි. (නිර්දිෂ්ට නාට්‍ය පෙළ ඇසුරින්)

ක්‍රියාකාරකම 5.1.2 ඃ ''මාෂා හා වළහා'' රස විඳිමින් තේමාව විමසයි.

කාලච්ඡේද ඃ 01

ඉගෙනුම් පල ඃ
- කතා පුවතෙහි අවස්ථා තුළින් ජීවිතයට ගත හැකි පාඩම් ප්‍රකාශ කරයි.
- නාට්‍යයේ විවිධ චරිත තුළින් ගතහැකි ආදර්ශ ලිඛිත ව දක්වයි.
- සමස්ත නාට්‍යයෙන් සිසු ජීවිතයට ගතහැකි පණිවුඩය පැහැදිලි කරයි.

ගුණාත්මක යෙදවුම් ඃ බ්‍රිස්ටල් බෝඩ්

ක්‍රියාකාරකමක් සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ

පියවර 1 ඃ
- නාට්‍යයක තේමාව යනු එයින් ප්‍රකාශවන අදහස වන බව පැහැදිලි කරමින් එය සිසුන් සමග සාකච්ඡාවට යොමුකරමින් පාඩමට ප්‍රවේශ වෙයි.
- සිසුන් කණ්ඩායම් කීපයකට බෙදී, මෙම නාට්‍යයේ කතා පුවතෙහි එන විවිධ අවස්ථාවලින් සිසුන්ට ගතහැකි පාඩම් සාකච්ඡා කර ලියවන්න.

උදා ඃ- මාෂා කැලයේ අතරමං වීම
නපුරු වළසා මාෂාගෙන් කරනු ලබන ඉල්ලීම්
මීවද පෙට්ටිය වළසා විසින් ම ඔසොවාගෙන යනු ලැබීම

පියවර 2 ඃ එම කණ්ඩායම මගින් නාට්‍ය චරිත තුළ දක්නට ඇති ගති ස්වභාවයන් දක්වමින් ඔවුන්ගේ ජීවිතවලට ගත හැකි පාඩම් වගුගත කරන්න.

උදාඃ

| චරිත | ගතිගුණ (හොඳ / නරක) | ජීවිතයට පාඩමක් |
|---|---|---|
| මාෂා | අකීකරු වීම<br>වැරදි හදා ගැනීම<br>උපක්‍රමශීලී බව | කීකරු වීම<br>වරද පිළි ගැනීම<br>අවස්ථෝචිත ව කටයුතු කිරීම |
| වළහා<br>මී මැස්සා<br>ආච්චි | | |

කණ්ඩායම් මගින් ම සමස්ත නාට්‍යයේ තේමාව හෝ තේමාවන් කීපයක් ඉදිරිපත් කිරීමට සලස්වන්න. මෙහිදී කතා පුවත සිසුන්ගේ විවිධ දෘෂ්ටියෙන් දැකීමට සලස්වන්න. ඒවා බ්‍රිස්ටල් බෝඩ්වල ප්‍රදර්ශනය කරවන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

01. නාට්‍යයේ අවස්ථා තුළින් ගතහැකි පාඩම් ප්‍රකාශ කිරීම
02. එහි චරිතවල ගති ස්වභාවයන් විස්තර කිරිම.
03. නාට්‍යයේ තේමා පෝස්ටර් ආකාරයට සකස් කිරිම
04. සිසු ජීවිතයට මාෂාගෙන් ගතහැකි ආදර්ශයන් පැහැදිලි කිරිම.
05. ආච්චි වැනි වැඩිහිටි චරිතයකින් ගත හැකි පාඩම් පැහැදිලි කිරීම

**පැවරුම** ඃ- මාෂා හා වළහා ගැටුම තීව්‍ර කිරීම සඳහා මී මැස්සන්ගෙන් ලද උපක්‍රමශීලී සහය රූප සටහන් ද සහිත ව රචනා කරන්න.

**අතිරේක උදව්** ඃ- වෙනත් නාට්‍යයක තේමාව අධ්‍යයනය කිරීම

**නිපුණතාව 5.0 ඃ** **නාට්‍යමය අවස්ථා සෞන්දරයාත්මක ව විඳ ගැනීමට හා මානවහිතවාදිකු ලෙස සමාජගතවීමෙ හැකියාව ප්‍රදර්ශනය කරයි.**

**නිපුණතා මට්ටම 5.1 ඃ** **නාට්‍ය පෙළ රස විඳියි. (නිර්දිෂ්ට පෙළ ඇසුරින්)**

**ක්‍රියාකාරකම 5.1.3 ඃ** **මාෂා හා වළහා නාට්‍යයේ චරිත රස විඳිමු.**

**කාලච්ඡේද** ඃ 03

**ඉගැනුම් පල** ඃ
- මාෂා හා වළහා යන දෙදෙනා මුහුණදෙන සිදුවීම් රසවත් ව ප්‍රකාශ කරයි.
- මී මැස්සන් සහ මාෂා අතර සම්බන්ධතාව සුන්දර අයුරින් විස්තර කරයි.
- වළහා, මාෂා හා ආච්චි අතර අවසානයේ ඇතිවන ගැටුම කුතුහලය මතුවන අයුරින් පැහැදිලි කරයි.
- චරිත හා සම්බන්ධිත පිරිස හා ස්ථාන රස විඳිමින් ඒවා විස්තර කරයි.

**ගුණාත්මක යෙදවුම්** ඃ
- නාට්‍ය පෙළ, බ්‍රිස්ටල් බෝඩ්

**ක්‍රියාකාරකමක් සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

ඃ

**පියවර 1** ඃ
- මාෂා හා වළහා නාට්‍යයේ ප්‍රධාන සිදුවීම් සිසුන් සමග සාකච්ඡා කරමින් එම සිදුවීම්වල ප්‍රබල බව හඳුනාගනිමින් පාඩමට ප්‍රවේශ වෙන්න.
- සිසුන් කණ්ඩායම් කීපයකට බෙදී මාෂා හා වළහා මුහුණදෙන සිදුවීම් පෙළ ගස්වමින්, එම අවස්ථා රසවත් වී ඇති ආකාරය පැහැදිලි කිරීමට සලස්වන්න.

**පියවර 2**
- එම කණ්ඩායම් මගින් මීමැස්සන් හා මාෂා අතර සම්බන්ධතාවත් අවසානයේදී වළහා මාෂා සහ ආච්චි අතර ඇති වන ගැටුමත්, රස විඳීමේදි සිසුන් තුළ ඇතිවන හැඟීම් පෙළ ගැස්වීමට සලස්වන්න.

**පියවර 3**

චරිතවලට පසුබිම් වන වනය, වළහාගේ නිවස, මාවත සහ ආච්චිගේ නිවස යන පරිසරය හා ස්ථාන සමඟ එම චරිත අතර සම්බන්ධතාව රස විඳීමට සලස්වන්න. එම අවස්ථාවක් චිත්‍රයතට නගන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

01. මාෂා හා වලහා යන ප්‍රධාන චරිත මුහුණදෙන ප්‍රධාන සිදුවීම රසවත් ව ප්‍රකාශ කිරීම
02. මී මැස්සන් හා මාෂා අතර සම්බන්ධතාව සුන්දර අයුරින් විස්තර කිරීම
03. චරිත හා සම්බන්ධ පරිසරය මවමින් අවස්ථාවක් චිත්‍රයට නැගීම
04. මී මැස්සන් සහ මාෂා අතර සම්බන්ධතාව විමසීම
05. චරිත අතර වෙනස්කම් සැසඳීම

**පැවරුම ඃ** නාට්‍යයේ චරිතවල ගුණාංග ලක්ෂණ වගුගත කරන්න.

**අතිරේක උදව් ඃ** තවත් නාට්‍යයක චරිත අධ්‍යයනය කිරීම

**නිපුණතාව 50 ඃ** **නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මක ව විඳ ගැනීම හා මානව හිතවාදියකු ලෙස සමාජගතවීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.**

**නිපුණතා මට්ටම 5.2 ඃ** **නාට්‍ය නිෂ්පාදනය රස විඳියි.**

**ක්‍රියාකාරකම 5.2.1 ඃ** **'මාෂා හා වළහා' නාට්‍ය රඟදැක්වීම සඳහා පන්තියේ ළමයි පුහුණු වෙති.**

**කාලච්ඡේද** ඃ 04

**ඉගැනුම් පල** ඃ
- චරිත නිරූපණය සඳහා උචිත සිසුන් තෝරා ගනියි.
- නාට්‍යයේ එන චරිත නිරූපණය පුහුණු වීමේ දී ඊට උචිත ආංගික, සාත්ත්වික, හා වාචික අභිනය භාවිත කරයි.
- සාමූහික රංගන හැකියාව පෙන්වයි.
- වේදිකා අවකාශය භාවිත කරයි.

**ගුණාත්මක යෙදවුම්** ඃ
- නාට්‍ය පෙළ, සටහන් සඳහා අවශ්‍ය ලිපිද්‍රව්‍ය

**ක්‍රියාකාරකමක් සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

**පියවර 1** ඃ
- මාෂා, වළහා, ආච්චි චරිත සඳහා නළුවරණ ක්‍රමවේදයක් තුළින් සිසුන් තෝරාගන්න. 'මී මැස්සෝ'' සාමූහික රංගනයට ද සිසුන් තෝරන්න.

**පියවර 2** ඃ
- නාට්‍යය කොටසින් කොටස පුහුණුවීමේදි ආංගික, වාචික, සාත්ත්වික අභිනයන් භාවිත කරමින් පුහුණුවීමවල යොදවන්න.

**පියවර 3**
- සිසු පුහුණුවීම්වලදී ගුරු භවතා සිසුන්ගේ රඟපෑම්වල අඩුලුහුඬුකම් පෙන්වා දෙමින් රංගනය සාර්ථක කර ගැනිමට සිසුන්ට සහය වන්න. රංගනයේ ප්‍රබලතා ද අගැයීමට ලක්කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

01. පුහුණුවීම්වලදී අභිනයන් උචිත ව භාවිත කිරීම
02. සාමූහික රංගනයේ යෙදීම
03. රඟපෑම් නිර්මාණශීලී ව මෙහෙයවීම
04. අවකාශය භාවිත කිරිම
05. පුහුණුවීම් කාලසටහනක් භාවිත කිරිම

**පැවරුම ඃ-** චරිත නිරූපණය තුළ තමන් කැමති එක් රංගන අවස්ථාවක් නිරූපණය කර පෙන්වන්න.

**අතිරේක උදව් ඃ** නාට්‍යයන්හි රංග වින්‍යාසය අවබෝධ කර ගත හැකි ඡායාරූප, පින්තූර, වීඩියෝ පට අධ්‍යයනය කිරීම

| | | |
|---|---|---|
| **නිපුණතාව 5.0** | ඃ | **නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මක ව විඳගැනීම හා මානව හිතවාදියකු ලෙස සමාජගත වීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.** |
| **නිපුණතා මට්ටම 5.2** | ඃ | **මාෂා හා වළහා නාට්‍ය රඟ දැක්වීමට සියල්ල සූදානම්** |
| **ක්‍රියාකාරකම 5.2.2** | ඃ | **ආනුෂංගික ශිල්ප භාවිතය** |
| **කාලච්ඡේද** | ඃ | 03 |
| **ඉගැනුම් පල** | ඃ | • නාට්‍ය පුහුණුව අතරතුර සිදුකරන ලද ඇඳුම් පැළැඳුම් සැලසුම් අනුව වේෂභූෂණ සකස්කර භාවිත කරයි.<br>• චරිතවලට ගැලපෙන ලෙස අංගරචනය සහ අවශ්‍ය රංගභාණ්ඩ භාවිත කරයි.<br>• නාට්‍යයට උචිත සංගීතය යොදාගනියි.<br>• පාසලේ තෝරාගත් ගුරු සිසු පිරිසකට නාට්‍යය රඟ දක්වා පෙන්වන අතර ඔවුන්ගෙන් ප්‍රතිචාර ලබාගනියි. |
| **ගුණාත්මක යෙදවුම්** | ඃ | නාට්‍ය පෝස්ටරයක්, ආනුෂංගික අංග සඳහා ද්‍රව්‍ය සහ භාණ්ඩ |

**ක්‍රියාකාරකමක් සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

| | | |
|---|---|---|
| පියවර 1 | ඃ | පන්තියේ සිසුන් ලවා පුහුණු කළ නාට්‍ය රඟ දැක්වීමට සලස්වන්න. |
| පියවර 2 | ඃ | පන්ති මට්ටමින් කරනු ලැබූ නිෂ්පාදනය සඳහා ගුරු මට්ටමින් ගුණ දොස් විමසන්න. විශේෂයෙන් රංගනය පිළිබඳව |
| පියවර 3 | | වේෂභූෂණ අංග රචනය, ගීත ගායනය වැනි ආනුෂංගික අංග පිළිබඳ ප්‍රතිචාර විමසන්න. |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

01. චරිත නිරූපණයේදී අභිනය ප්‍රබල ව භාවිත කිරීම
02. සතුටින් නාට්‍ය නිෂ්පාදනයෙහි නිරතවීම
03. ආනුෂංගික කලා අංග නිර්මාණශීලීව සැකසීම
04. නාට්‍යය සඳහා ප්‍රතිචාර ලබාගැනීම
05. නාට්‍ය නිෂ්පාදනය සඳහා සංවිධානය කිරීම

පැවරුම ඃ නාට්‍යයට ලැබුණු ප්‍රතිචාර පිළිබඳ සඟරාවකට ලිපියක් සකස් කරන්න.
**අතිරේක උදව් ඃ** 'නාට්‍ය නිෂ්පාදනය' ගැන මූලික අවබෝධය ලබාදෙන ලිපි අධ්‍යයනය කිරීම